ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

2011 වර්ෂය සඳහා

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින්

ආර්ථික සංවර්ධන ගරු අමාත්‍යතුමා වෙත

ඉදිරිපත් කරනු ලබන

වාර්ෂික වාර්තාව.

පූර්විකාව

ආසියාවේ ආශ්චර්යමත් රට ලෙස ශ්‍රී ලංකාව බිහි කිරීමේ උත්තරීතර අරමුණ පෙරදැරි කරගෙන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ජයග්‍රහණ රැසක් හිමි කර ගන්නා ලදි.

සමෘද්ධිමත් රටක් බිහි කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ලද "දිවි නැඟුම" වැඩ සටහන් සඳහා වසර 15 ක පන්නරයෙන් ලද අත්දැකීම් නොමසුරුව ලබාදුන් ආයතනයකි.

අඩු ආදායම්ලාභීන් දේශීය ආර්ථිකයට ශක්තිමත් පුරුකක් ලෙස යා කිරීම මෙහි මූලික පරමාර්ථය වේ. එම පරමාර්ථය සපුරා ගැනීම සඳහා අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් ද සමෘද්ධි බැංකු ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය හා නාගරික දිළිඳු ප්‍රජාවට සශ්‍රීකත්වයේ තිරසාර මංපෙත් විවර කර ඇත.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව පුද්ගලයා සමඟ පවුල ගොඩනඟමින් ගම ගොඩනඟා රට සංවර්ධනය කිරීමත්, දිළිඳුකම පිටුදකිමින් ශ්‍රී ලංකාව ආසියාවේ සංවර්ධිත දේශය බවට පත් කිරීමට දායකවීම ඒකායන අරමුණ වේ.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

1995 අංක 30 දරණ පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පිහිටුවීමේ මූලික පරමාර්ථ :

"තරුණයන්, ස්ත්‍රීන් සහ අවාසි සහගත තත්ත්වයට පත්වී ඇති කණ්ඩායම්, ආර්ථික හා සමාජීය සංවර්ධන කටයුතුවලට එක් කර ගැනීම, සාමාජීක ස්ථාවරභාවය ප්‍රවර්ධනය කිරීම සහ දුගී බව තුරන් කිරීම" සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද වේ.

දැක්ම

"දුප්පත්කම අවම වු සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම"

මෙහෙවර

මහජන සහභාගිත්වය මත පදනම් වු සංවර්ධනය මගින් දුප්පත්කම අවම වු ස්ථාවර ජාතික සංවර්ධනයට දායකවිම

පරමාර්ථ

- ❖ කුඩා කණ්ඩායම් නිර්මාණය කිරීමෙන් ඒ තුලින් සමෘද්ධි සමිති ගොඩනැගිම මගින් ග්‍රාමීය පවුල් වල විභව ශක්තීන් හදුනා ගැනීම හා ඒ ග්‍රාමීය ජනතාව ශක්තිමත් කිරිම.
- ❖ වර්ෂ 2013 වන විට ආර්ථික භෞතික හා සමාජ සංවර්ධනය තුලින් නාගරික ග්‍රාමීය හා වතු අංශ වර්ධනය කිරිම.
- ❖ දේශීය හා විදේශීය වශයෙන් ඇති රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධිකරණය තුලින් පළාත් බද සංවර්ධනයට දායක විම.
- ❖ කුඩා පරිමාණයේ මුල්‍ය ණය ජාලය ශක්තිමත් කිරිම තුලින් සමස්ත ආර්ථිකය ශක්තිමත් කිරිම.
- ❖ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය තාක්ෂණික වශයෙන් ශක්තිමත් වු ආයතනයක් බවට පත් කිරිම.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

හැඳින්වීම හා 2011 වර්ෂයේ ඇගයීම.

1995 අංක 30 දරණ පනතින් සංස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ප්‍රධාන අරමුණ වන ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීම සඳහා ආර්ථික හා සමාජමය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.එහිදී දිළිඳු පවුල් හඳුනා ගැනීමත්, දිළිඳුභාවයට හේතු සාධක අනුව සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කර සවිබල ගැන්වීමත් සිදු කරයි.

මෙම වර්ෂයේදී ප්‍රධාන වැඩසටහන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන රු.මි. 3260 කි.

මෙයින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන තුළින් දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව දිවයින පුරා එක් ග්‍රාම නිලධාරී වසමකින් ගෘහ ආර්ථික පවුල් ඒකක 75 ක් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගනු ඇත. ප්‍රධාන වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් තෝරා ගන්නා ලද සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල පෝෂණ මට්ටම ඉහල නැංවීමට හැකි වන අතර එමඟින් ආර්ථික මට්ටම ඉහල නැංවීම, හා ජීවන තත්වය නඟා සිටුවීම ද අරමුණු වේ.

දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක පැල තවාන හා හරිතාගාර සංවර්ධනයේ 2011-12-31 දිනට ප්‍රගතිය ලෙස හරිතාගාර 2163 ක්ද, පැල තවාන් 885 ක් ද, වෙනත් කෘෂිකර්ම වැඩසටහන් 23,329 ක් ද, ගෙවතු 469,537 ක් ක්‍රියාත්මක කර ඇති අතර, මේ සඳහා නිදහස් කළ මුදල රු: මිලියන 602.299 ක් වේ.

ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩ සටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සමාජ හා සංස්කෘතික වටිනාකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ. දුගී භාවය කෙරෙහි බලපා ඇති සමාජ සාධක හඳුනා ගැනීමත් ඒවා පිටු දැකීම සඳහා සුදුසු ක්‍රමවේදයන් හඳුන්වා දීමත් මෙම වැඩසටහන් මගින් සිදු කරනු ලැබේ. මතට තිත වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය නිවාරණය කිරීම, ළමා අපචාර වැලැක්වීම හා සිය දිවි නසා ගැනීම වලක්වා ගැනීම මෙමගින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන වැඩසටහන් වේ. ඊට අමතරව ජාත්‍යාන්තර දින සැමරීම සිදු කරනු ලබයි. එනම් කාන්තා දිනය, ළමා දිනය, වැඩිහිටි දිනය, සාක්ෂරතා දිනය හා දිළිඳුකම පිටු දැකීමේ දිනයන්ය. කිසිදු පිලිසරණක් නොමැති කාන්තාවන් සඳහා නිවාස පහසුකම් ලබා දීම සඳහා "දිරිය පියස නිවාස" වැඩ සටහන ක්‍රියාත්මක වේ. 2011 වසරේ ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන් 58,578 ක් ද, පවුල් ඒකකය තුල සතුට හා සහජීවනය වර්ධනය කිරීමේ වැඩසටහන් 69,074 ක්ද, මත් ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය වැලැක්වීමේ වැඩසහන් 66,369 ක්ද, ගම් මට්ටමින් ළමා සුභසාධන වැඩසටහන් 48,848 ක් ද, සමාජ හා සංස්කෘතික වැඩසටහන්

වැඩි දියුණු කිරීමේ වැඩසහන් 13,729 ක්ද, ජාත්‍යාන්තර දින හා සමගාමී වැඩසටහන් 5,670 ක් ද, "දිරිය පියස" නිවාස වැඩසටහන් 3,947 ක් ද, අනෙකුත් සංවිධාන හා ඒකාබද්ධ වැඩසටහන් 19,158 ක් ලෙස සමස්ථ වැඩසටහන් 285,373 ක් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 477,175 කි.

ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වැඩි අවධානයක් යොමු කර ඇත. මේ යටතේ රු. මි. 341.825 ක මුදලින් කුඩා පරිමාන වාරිමාර්ග යෝජනා, පානීය ජල පහසුකම් සැපයීම, කෘෂි ළිං හා ඇල මාර්ග හා වැව් සංවර්ධනය කිරීමට වෙන් කර ඇත. මේ අනුව වාරිමාර්ග යෝජනා 259 ක්ද, පානීය ජලපහසුකම් සැපයීම් 170 ක්ද, සනීපාරක්ෂක වැඩසටහන් 5,548 ක්ද, බහුකාර්ය මධ්‍යස්ථාන 01 ක්ද, කුඩා පරිමාණ පාලම් 04 ක්ද, ගැමිදිරිය වැඩසටහන් ගම් මට්ටමේ 120 ක්ද, ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා රු. 250,000 මුදලක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වෙන් කරන ලදි. 2011 වර්ෂයේ අවසානයට රු.මි. 326.29 ක මූල්‍ය ප්‍රගතියකින් ව්‍යාපෘති 5,950 ක් ක්‍රියාත්මක කර ප්‍රතිලාභීන් 14,423 කට ප්‍රතිලාභ ලබා දී ඇත.

1996 දී ආරම්භ කළ සමෘද්ධි බැංකු සංගම් අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවමින් ලාභදායී ආයතනික රටාවක් ඇති කිරීමටත් බලාපොරොත්තු විය. මේ සඳහා1043 ක් වූ සමෘද්ධි බැංකු සංගම් ජාලය තුළින් 2011-12-31 වන දින වන විට සමස්ථ සාමාජිකයන් ලෙස 2,869,548 දෙනෙක් සාමාජිකත්වය ලබා ඇත. මෙම වර්ෂය තුළ දී පමණක් සාමාජිකයින් 68015 කින් වැඩිවී ඇති අතර, රු.මිලියන 5,370.68 ක මුදලක් තවදුරටත් බැංකු සංගම් වෙත විශ්වාසය පලකරමින් තැන්පත් කර ඇත. ඒ අනුව 2011-12-31 වන දිනට සමස්ථ තැන්පතු ලෙස (රු: 000) 41,000,855 ලෙස පෙන්නුම් කරන අතර, සමස්ථ ගිණුම් සංඛ්‍යාව 9,889,010 කි.

සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩ නැංවීමට අවශ්‍ය සුළු මුල්‍යකරණ පහසුකම බැංකු සංගම් ණය ක්‍රමය යටතේ සිදුවේ.තවද සාමාජිකයන්ගේ හා කාර්යය මණ්ඩලය සඳහා ද ප්‍රාග්ධන අවශ්‍යතා පිරිමැසීම සඳහා විශේෂ ණය වැඩසටහන් කීහිපයක් හඳුන්වාදී දියත්කර ඇත. මෙම ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සඳහා ස්වයං රැකියා, වගා, මිහිජය, ධීවර,ස්වශක්ති, ආපදා, කිරුළ, යොවුන් දිරිය, පාරිභෝගික, ජන පුබුදු, නිවාස යන ණය යෝජනා ක්‍රම හඳුන්වා දී දියත්කර ඇති අතර කාර්යය මණ්ඩල සඳහා පාරිභෝගික, නිවාස, යතුරු පැදි ණය යෝජනා ක්‍රම ද විශේෂ ණය යෝජනා ක්‍රම යටතේ විදුලි අත්වැල ණය වැඩ සටහන ද ක්‍රියාත්මක වේ.

2011-12-31 වන දිනට ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සඳහා රු.ද.ලක්ෂ. 71,721 ක මුදලක් 4,682,822 ක සංඛ්‍යාවකට ණය වශයෙන් නිකුත් කර ඇති අතර, කාර්යය මණ්ඩල ණය

යෝජනා ක්‍රම යටතේ පාරිභෝගික ණය වැඩසටහනින් 22,886 සංඛ්‍යාවකට රු.ද.ලක්ෂ 1,367.62 ක මුදලක් ලබාදී ඇති අතර නිවාස ණය යෝජනා ක්‍රම යටතේ 1,838 ක සංඛ්‍යාවකට රු.ද.ලක්ෂ 762 ක්ද යතුරු පැදි ණය යටතේ 3557 ක සංඛ්‍යාවකට රු.මි.299.7 ක ණය මුදල් නිකුත් කර ඇත. තවද විදුලි අත්වැල ණය වැඩ සටහන යටතේ පුද්ගලයන් 20,694 කට විදුලි සම්බන්ධ තාවය ලබා දී ඇති අතර මේ සඳහා රු.මි.353 ක් යොදවා ඇත.

2011 වසර තුල පමණක් සාමාජිකයන් 522,226 කට රු.මි. 13,189 ක මුදලක් ණය ලෙස ලබාදී ඇති අතර මෙම වසරේ ණය අයවීමේ ප්‍රතිශතය 111.90 % ද, බොල් ණය අනුපාතය 5.51% ක්ද වේ.

නිලධාරී පුරප්පාඩු පැවතුණ ද මෙම ජයග්‍රහණයන් 2011 වර්ෂයේ ලබාගැනීමට හැකි වූයේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලවල සියළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය හා නිවැරදි තීරණ පදනම් කරගෙනය. මේ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හා අතිරේක ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු මහ පෙන්වීම ද විශේෂයෙන් පැවති අඩුපාඩු කලට වේලාවට පෙන්වා නිවැරදි කිරීම සඳහා රජයේ විගණන අංශයේ කාර්ය මණ්ඩලයෙන් ලැබූ සහයෝගය ද අභ්‍යන්තර විගණන අංශයෙන් ලැබූ සහයෝගය ද මෙහිදී සඳහන් කරමි.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම පෙරදැරි කොට එකී පරමාර්ථ තහවුරු කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මෙහෙය වන ගරු අමාත්‍ය, බැසිල් රාජපක්ෂ මැතිදුන් හා නියෝජ්‍ය අමාත්‍යතුමන්ලාගෙන් ලැබුණු සහයෝගය 2011 වර්ෂයේ සාර්ථකත්වයට මහඟු මඟ පෙන්වීමක් බව ද විශේෂයෙන් මෙහිදී සඳහන් කරමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

පරිපාලන වශයෙන් ව්‍යාප්තිය

1. සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක ;

* දිස්ත්‍රික් ගණන	25
* ප්‍රා.ලේ. කොට්ඨාශ ගණන	316
* ග්‍රාම නිලධාරි වසම් ගණන	14,008
* බැංකු සංගම්/කලාප ගණන	1,043
* මහා සංගම් ගණන	317
* සමෘද්ධි සමිති ගණන	18,788
* සමෘද්ධි බලකා	14,008

2. සමෘද්ධි සහනාධාරලාභී පවුල් ගණන	1,541,619
3. කුඩා කණ්ඩායම් ගණන	207,975

4. කාර්ය මණ්ඩල තොරතුරු

1.	අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	06
2.	ප්‍රධාන අභ්‍යන්තර විගණක/සහකාර අභන්තර විගණක	02
3.	සහකාර අධ්‍යක්ෂ (නීති)	01
4	නීති නිලධාරී	-
5.	සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරී	16
6.	පරිපාලන නිලධාරී	01
7.	ප්‍රවෘත්ති නිලධාරී	01
8	කළමණාකරුවන් ගණන	2129
9.	සමෘද්ධි සංවර්ධන නිලධාරින් ගණන	22,008
10.	අනෙකුත් කාර්ය මණ්ඩලය	294

2011 වර්ෂයේ අයවැය මගින් ජීවනෝපාය සංවර්ධනය, අධ්‍යාත්මික හා සමාජ සංවර්ධන කටයුතු සඳහා වෙන් කර ඇති මුදල්, අංශ හා වැඩසටහන් අනුව බෙදී යන ආකාරය

අනු අංකය	සංවර්ධන අංශය		2011 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වෙන්වන අයුරු රුපි. මිලි.
01	**ග්‍රාම සංවර්ධන අංශය**		**346..00**
02	**ජීවනෝපාය සංවර්ධන**		**2197.70**
	අලෙවි අංශය	319.00	
	කර්මාන්ත අංශය	618.00	
	කෘෂි අංශය	870.00	
	ධීවර හා සත්ත්ව පාලන අංශය	390.70	
03	**සමාජ සංවර්ධන අංශය**		**250.00**
04	**බැංකු මූල්‍ය අංශය**		**356.30**
05	**මහා සංගම් අංශය**		**20.00**
06	**මානව සම්පත් අංශය**		**20.00**
07	**මාධ්‍ය අංශය**		**25.00**
08	**මුදල් අංශය (සැපයුම්)**		**23.00**
09	**මෙහෙයුම් හා ඇගයුම් අංශය**		**20.00**
10	**පරිපාලන වියදම්**		**2.00**
	එකතුව		**3260.00**

<u>2011-12-31 දිනට වියදම් වල මූල්‍ය ප්‍රගතිය</u>

ප්‍රාග්ධන වියදම්

විස්තරය	2011 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු:	2011.වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන රු:	2011.12.31 දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා යවන ලද ප්‍රතිපාදන රු:	2011.12.31 දිනට ප්‍රතිපාදන ඉතිරිය රු:	2011.12.31 දිනට මුළු සත්‍ය වියදම් රු:	2011.12.31 දිනට ප්‍රතිපාදන ඉතිරිය (මුළු සත්‍ය වියදමින්) රු:
ග්‍රාම සංවර්ධන අංශයේ වැඩසටහන	102,000,000.0	345,800,000.00	334,102,318.00	11,697,682.00	310,145,731.20	35,654,268.80
කෘෂි සංවර්ධන අංශයේ වැඩසටහන	1,000,000,000.0	870,000,000.00	860,710,050.00	9,289,950.00	549,140,074.19	320,859,925.81
ධීවර හා සත්වපාලන අංශයේ වැඩසටහන	750,000,000.0	400,700,000.00	415,652,599.00	(14,952,599.00)	231,411,093.89	169,288,906.11
අලෙවි සංවර්ධන අංශයේ වැඩසටහන	500,000,000.0	319,000,000.00	310,149,543.00	8,850,457.00	166,895,451.78	152,104,548.22
කර්මාන්ත අංශයේ වැඩසටහන	750,000,000.0	608,000,000.00	579,097,050.00	28,902,950.00	389,527,650.00	218,472,350.00
සමාජ සංවර්ධන අංශයේ වැඩසටහන	30,000,000.0	358,500,000.00	357,006,416.00	1,493,584.00	356,081,513.80	2,418,486.20
මානව හා ආයතනික සංවර්ධන අංශයේ වැඩසටහන	20,000,000.00	20,000,000.00	7,582,453.00	12,417,547.00	17,224,726.10	2,775,273.90
මාධ්‍ය අංශයේ වැඩසටහන	25,000,000.00	25,000,000.00	1,588,000.00	23,412,000.00	11,320,649.61	13,679,350.39
ඇගයුම් හා මෙහෙයුම් අංශයේ වැඩසටහන	20,000,000.00	20,000,000.00	6,746,019.00	13,253,981.00	6,384,011.80	13,615,988.20
මහා සංගම් අංශයේ වැඩසටහන	20,000,000.00	20,000,000.00	19,487,026.00	512,974.00	10,236,565.24	9,763,434.76
බැංකු හා මූල්‍ය කටයුතු අංශය	20,000,000.0	250,000,000.00	200,000,000.00	50,000,000.00	200,000,000.00	50,000,000.00
සංවර්ධන වියදම් එකතුව	**3,237,000,000.00**	**3,237,000,000.00**	**3,092,121,474.00**	**144,878,526.00**	**2,248,367,467.61**	**988,632,532.39**
ස්ථාවර වත්කම් අයකර ගැනීම්	23,000,000.00	23,000,000.00	8,056,335.00	14,943,665.00	12,405,529.14	10,594,470.86
මුළු ප්‍රාග්ධන වියදම් එකතුව	**3,260,000,000.00**	**3,260,000,000.00**	**3,100,177,809.00**	**159,822,191.00**	**2,260,772,996.75**	**999,227,003.25**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

2011 ක්‍රියාත්මක වැඩසටහනේ අභිමතාර්ථ...........

- සමෘද්ධිලාභින් හා අඩු ආදායම්ලාභී පවුල් පදනම් කරයි.
- ග්‍රාම නිලධාරි වසම් මූලික සැලැසුම් ඒකකය වේ.
- " ගම නැගුම" වැඩසටහනට සමගාමීව සොඳුරු ගම්මානයක් තේමාව යටතේ ග්‍රාම නිලධාරි වසම් 3060 ක ඉන් පරිභාහිර වසම් හීද සදාචාර හා අධ්‍යාත්මික සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධන හා ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන යටිතල පහසුකම් සංවර්ධනය ක්‍රියාත්මක කෙරේ.
- අවශ්‍යතා හඳුනා ගැනිම පහල සිට ඉහලට සිදුකෙරේ ඒ සඳහා මහ පෙන්විමක් පමණක් ආයතන මට්ටමින් සිදුවේ.
- රාජ්‍ය අරමුදල් (භාණ්ඩාගාර ප්‍රතිපාදන) සමෘද්ධි බැංකු ණය ඔස්සේ හා ප්‍රතිලාභීන්ගේ ප්‍රධාන දායකත්වයෙන් අරමුදල් සම්පාදනය කෙරේ.
- සහශ්‍ර සංවර්ධන ඉලක්ක, සාර්ක් සමාජ ප්‍රතිපත්තිය, මහින්ද චින්තන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා වැඩසටහන් පෙළගස්වා ඇත.
- සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් යැපුම් මානසිකත්වයෙන් මුදවා සවිබල ගැන්වීම තුළින් සංවර්ධනය කරා යොමු කිරීම.
- මහින්ද චින්තනය පෙරදැරි කොට එකී පරමාර්ථ තහවුර කර ගනිමින් "ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය" බවට පත් කිරීම සඳහා පූර්ණ දායකත්වය ලබා දීම.
- 1995 වර්ෂයේදී 26% ක් වූ අඩු ආදායම්ලාභී ජනතා ප්‍රතිශතය 2002 වර්ෂය වන විට 22.5% ක් දක්වා වූ මට්ටමට ගෙන ඒමට මෙන්ම 2006/ 2007 වර්ෂය වන විට මෙම ප්‍රතිශතය 15% ක් දක්වා අඩු කිරීමටත් තවද 2009/ 2010 වර්ෂය වන විට මෙම ප්‍රතිශතය 8.9% ක් දක්වා හා 2011 වර්ෂය වන විට මෙම ප්‍රතිශතය 7.6% ක් වශයෙන් අඩු කිරීමට පූර්ණ සහාය ලබාදීම.

පළමුවැනි කොටස

➢ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පරිපාලන ව්‍යුහය.

2011 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ අධ්‍යක්ෂ මණ්ඩලය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පර්ලිමේන්තුව මඟින් අනුමත කරන ලද 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පිහිටුවීමේ පනත අනුව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය නීතිමය වශයෙන් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගෙන් ද, විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන වෙනත් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් ද සමන්විත විය යුතුය. ඒ අනුව පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරනු ලැබේ.

<u>2011.01.01 දින සිට 2 011.12.31 දින දක්වා ක්‍රියාත්මක වූ</u>

<u>අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය :-</u>

01	නීතිඥ ආර්.පී.බී. තිලකසිරි මහතා - අධ්‍යක්ෂ ජනරාල්	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති
02	චන්ද්‍රා වික්‍රමසිංහ මිය - සමෘද්ධි කොමසාරිස් ජනරාල්	නිල සාමාජික
03	ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා - අතිරේක ලේකම්	නිල සමාජික
04	ගීතා විමලවීර මෙනෙවිය - භාණ්ඩාගාර නියෝජිත	නිල සමාජික
05	ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය -	පත්කළ සමාජික
06	ආචාර්ය විජිත නානායක්කාර -	පත්කළ සමාජික
07.	ශාන්ති ප්‍රනාන්දු මිය -	පත්කළ සමාජික

සංවිධාන ව්‍යුහය - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය



ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

➢ ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වූ ආයතන ව්‍යුහය.



<u>සටහන</u> :

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ආයතනික සංවිධාන ව්‍යුහය ජාතික තලයේ සිට ග්‍රාමීය මට්ටම දක්වා පැතිර යාම විදහා දැක්වෙන මෙම සටහන මඟින් ග්‍රාමීය තලයේ කුඩා කණ්ඩායම් සවිබල ගැන්වීමේ ආයතනයේ මූලික පරමාර්ථය හා එම ක්‍රියාදාමය පිළිබඳව අදහස් පළ කෙරේ.


සංවර්ධන හා ආයතනික සේවා අංශ
ආයතන / පාලන / මුදල් / සැපයුම්
ග්‍රාම සංවර්ධන
යටිතල පහසුකම් සංවර්ධනය
ශ්‍රේණි / කර්මාන්ත / සත්වපාලන / කෘෂි / විශේෂ ව්‍යා.
විගණන / නීති වමර්ශන
බැංකු මූලය
ජීවනෝපාය සංවර්ධනය
සොඳුරු
ගම්මාන
බිහිකරමු
ආධ්‍යාත්මික හා සදාචාර සංවර්ධනය
මහාසංගම් / සමාජ සංවර්ධන
මාධ්‍යය / මෙහෙයුම් ඇගයුම්

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් - 2011

01	නීතිඥ ආර්.පී. බන්දුල තිලකසිරි මයා -	අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක
02.	සී.ඩී. කළුආරච්චි මහතා -	සාමාන්‍යාධිකාරී ශ්‍රී.ලං.ප.සේවය 1 පංතිය. (2011.08.18 දින සිට)
03	එම්.ඒ.එස්. වීරසිංහ මයා -	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (වැ.බ.) අධ්‍යක්ෂ (ග්‍රාම සංවර්ධන) අධ්‍යක්ෂ - මාධ්‍ය (වැ.බ.) ශ්‍රී.ලං.ප.සේවය 1 පංතිය. (2011.05.17 දක්වා)
04	එස්.පී. බණ්ඩාර මයා -	අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්) ශ්‍රී.ලං.ප.සේවය 1 පංතිය (2011.08.10 දක්වා)
05	එස්. මඩවලගමගේ මයා -	නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති විමර්ශන)
06	එස්.ඒ.ඩී.පී. මතභධීර මයා -	ප්‍රධාන අභ්‍යන්තර විගණක (2011.06.25 දක්වා)
07	එල්.ජී.ජේ.ජී. ගුණතිලක මයා -	අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන) (2011.07.26 දක්වා)
08	සුනන්දා පියසීලි මිය -	අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී.ලං.ග.සේවය II /I පංතිය
09	එම්. නඩේෂරාජා මයා -	අධ්‍යක්ෂ (කර්මාන්ත)
10.	කේ.කේ.එල්. චන්ද්‍රතිලක මයා -	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බැංකු මූල්‍ය) (2011.07.01 සිට)
11.	කේ.බී. ගුරුගේ මහතා -	ප්‍රධාන අභ්‍යන්තර විගණක (2011.10.21 දින සිට)
12.	එච්. කුලතුංග මිය -	අධ්‍යක්ෂ (අලෙවි) (2011.10.27 දින සිට)
13.	ඒ. ෆිලික්ස් ප්‍රනාන්දු මයා -	සහකාර අධ්‍යක්ෂ (පාලන) (2011.08.03 දින සිට)
14	පී.ආර්.ඩී.එච්. අනුරවංශ මයා -	සහකාර අභ්‍යන්තර විගණක
15	ඩී.යූ.එස්. පතිරගේ මෙය -	සහකාර අධ්‍යක්ෂ (නීති) (2011.05.05 දින සිට)
16	ශ්‍රියා බොරගොඩ මිය -	පරිපාලන නිලධාරී
17	සේනක උබේසිංහ මයා -	ප්‍රවෘත්ති නිලධාරී

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

විගණන හා කළමණාකරණ කමිටුව පිළිබඳ තොරතුරු 2011

සාමාජිකයින් පිළිබඳ විස්තර.

1.	ගීතා විමලවීර මෙනවිය - අධ්‍යක්ෂ (ජාතික අයවැය දෙපාර්තමේන්තුව) මහා භාණ්ඩාගාරය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය	ගරු සභාපති
2.	ශාන්ති ප්‍රනාන්දු මිය - ජනාධිපති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ අධ්‍යක්ෂ මණ්ඩල පත්කල සාමාජික	සාමාජික
3.	සුනිල් පත්මශාන්ත මයා - සමෘද්ධි කොමසාරිස් ජනරාල් සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	සාමාජික (2011.01.24 දක්වා)
4.	චන්ද්‍රා වික්‍රමසිංහ මිය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	සාමාජික (2011.03.23 සිට)
5.	ජී.ආර්.එල් වසන්ත මයා - ගණකාධිකාරි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	සාමාජික
6.	සුනන්දා පියසීලි මිය - අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය	සාමාජික
7.	ගාමිණී වික්‍රමපාල මයා - අධ්‍යක්ෂ (බැංකු මූල්‍ය කටයුතු) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය	සාමාජික (2011.06.01 දක්වා)
8.	කේ.කේ.එල්. චන්ද්‍රතිලක මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (බැංකු මූල්‍ය කටයුතු) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය	සාමාජික (2011.08.17 සිට)
9.	සුනිල් වීරසිංහ මයා - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය	සාමාජික (2011.03.23 දක්වා

10. එස්. මඩවල ගමගේ මයා - සාමාජික (2011.06.01 සිට)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

11. එස්.මඩවල ගමගේ මයා - කැඳවුම්කරු (2011.08.17 සිට 2011.11.08 දක්වා)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

12. සී.ඩී. කළුආරච්චි - සාමාජික (2011.10.01 සිට)
සාමාන්‍යාධිකාරි
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

13. පී.ආර්.ඩී.එච්. අනුරවංශ මයා - සාමාජික (2011.08.17 සිට)
නියෝජ්‍ය අභ්‍යන්තර විගණක (වැ.බ.)
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

14. එස්.ඒ.ඩී.පී. මතභදීර මයා - කැඳවුම්කරු (2011.06.01 දක්වා)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

15. කේ.බී. ගුරුගේ මයා - කැඳවුම්කරු (2011.11.17 සිට)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සමෘද්ධී අධිකාරිය

2011 වර්ෂයේ කමිටු රැස්වීම් පිළිබඳ තොරතුරු

වර්ෂය තුළ රැස්වීම් වාර 08 ක් පවත්වා ඇත.

ශ්‍රී ලංකා

සමෘද්ධි අධිකාරියේ

ප්‍රගතිය.

පටුන

01. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අංශය.
02. පරිපාලන අංශය.
03. ආයතන අංශය
04. ග්‍රාම සංවර්ධන අංශය.
05. කෘෂි සංවර්ධන අංශය
06. සත්ත්ව පාලන හා ධීවර අංශය.
07. කර්මාන්ත අංශය
08. අලෙවි සංවර්ධන අංශය
09. මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය.
10. මහ සංගම් අංශය.
11. සමාජ සංවර්ධන අංශය.
12. මාධ්‍ය අංශය.
13. මෙහෙයුම් හා ඇගයුම් අංශය.
14. බැංකු මූල්‍ය අංශය.
15. අභ්‍යන්තර විගණන අංශය.
16. විමර්ශන අංශය.
17. නීති අංශය.
18. මූල්‍ය කළමනාකරණ අංශය.

1.0 අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අංශය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අංශයේ කාර්ය භාරය මූලික වශයෙන් දෙයාකාර වේ. එක් අතකින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කිරීමත්, අනෙක් අතින් පරිපාලනය හා සම්බන්ධ වෙමින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කරවීමට ආයතනයේ විධායකයට සහාය වීමත්ය.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ආයතන, පරිපාලන, මූල්‍ය කටයුතු මෙන්ම විනය කටයුතු සඳහා අවශ්‍ය නෛතික පරිසරය සකස් කිරීම, සංවර්ධන කටයුතුවලට අදාළ තොරතුරු ඒකරාශි කිරීම, ආයතනයේ පැවැත්මට හිතකර වන්නාවූ විනය පවත්වා ගැනීමට සහාය වීම හා ඊට අදාළ පසු විපරම් කටයුතු මෙහෙයවීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්ට සහාය වීම මෙම අංශය ප්‍රධානව සිදු කෙරෙන මූලික කාර්යභාරය වේ.

කාර්යභාරය හා පැවරුම්

සම්බන්ධීකරණය හා වාර්තාකරණය මත පදනම් වූ කටයුතු මෙම අංශයේ මූලික කාර්යභාරය වන අතරම පැවරුණ විශාලතම වගකීම වන්නේ ආයතනික උපාය මාර්ගික සැලැස්ම සැකසීම සඳහා ප්‍රතිපත්තිමය සහාය ලබාදීමයි.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාලය ලෙස කටයුතු කිරීමේදී

1. ආයතන, පරිපාලන හා මූල්‍ය කටයුතු පිළිබඳවත්, සංවර්ධන කටයුතු සම්බන්ධවත් ප්‍රතිපත්තිමය වශයෙන් ගත යුතු තීරණයන්ට පසුබිම් කරුණු පිළිබඳවත් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.
2. මාණ්ඩලික පත්‍රිකා ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා අංශ ප්‍රධානීන්ට සහාය වීම හා ඒ අනුව කටයුතු කිරීම.
3. තීරණ ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය තොරතුරු හා දත්ත සපයා දෙමින් සහාය වීම.
4. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් පිළිබඳව රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
5. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගනු ලබන තීරණ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම හා ඒ පිළිබඳව පසුවිපරම් කිරීම.
6. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ඒ පිළිබඳ පසු විපරම.

ඒ අනුව ප්‍රවර්ථන වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද පත්‍රිකා ප්‍රමාණය 167 කි.

i.	ආයතන හා පාලන කටයුතු වලට අදාල	55
ii.	මානව සම්පත් සංවර්ධන කටයුතු වලට අදාල	04
iii.	මූල්‍ය කටයුතු වලට අදාල	74
iv.	සංවර්ධන කටයුතු වලට අදාල	11
v.	නීති හා විගණන කටයුතු වලට අදාල	18
vi.	මාධ්‍ය කටයුතු වලට අදාල	02
vii.	මෙහෙයුම් හා ඇගයුම් වලට අදාල	03

අධ්‍යක්ෂ ජනරාල්ගේ සම්බන්ධීකරණ කාර්යාලය වශයෙන් කටයුතු කිරීමේදී,

1. අධ්‍යක්ෂ ජනරාල් සහභාගී වන රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු ආදිය සම්බන්ධීකරණය කිරීම.

2. අමාත්‍යාංශය හා වෙනත් රජයේ ආයතන හා සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

3. පරිපාලන කටයුතු, විනය හා විමර්ශන කටයුතු වලට අදාල තොරතුරු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීම හා අන්තර් ආයතන සහ සම්බන්ධතාවය පවත්වා ගැනීම.

4. අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අංශය වෙත එදිනෙදා ලැබෙන ලිපි අදාල අංශ වෙත යොමුකිරීම සහ ඒ පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කටයුතු කිරීම.

5. අංශයේ නිලධාරීන් සම්බන්ධ ආයතනික කටයුතු සිදු කිරීම

වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

1.	නීතිඥ ආර්.පී.බී. තිලකසිරි මහතා - අධ්‍යක්ෂ ජනරාල්	සභාපති
2.	චන්ද්‍රා වික්‍රමසිංහ මිය - සමෘද්ධි කොමසාරිස් ජනරාල්	නිල සාමාජික
3.	ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා - අතිරේක ලේකම්	නිල සමාජික
4.	ගීතා විමලවීර මෙනවිය - භාණ්ඩාගාර නියෝජිත	නිල සමාජික
5.	ආචාර්ය පී.ඒ. කිරිවන්දෙනිය මහතා -	පත්කළ සමාජික
6.	ආචාර්ය විජිත නානායක්කාර මහතා -	පත්කළ සමාජික
7.	ශාන්ති ප්‍රනාන්දු මිය -	පත්කළ සමාජික

2.0 පරිපාලන අංශය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පරිපාලන අංශය - පාලන හා ආයතනික වශයෙන් ප්‍රධාන අංශ දෙකක් ලෙස කටයුතු කෙරේ. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු පාලන අංශය මඟින් ද ප්‍රතිපත්තිමය තීරණයන්ට අදාලව ප්‍රායෝගික කටයුතු ආයතනික අංශය යටතේ ද ක්‍රියාත්මක කෙරේ.

2.1 පාලන හා ආයතනික අංශ දෙකම මූලික වශයෙන් සාමාන්‍යාධිකාරිගේ සෘජු අධීක්ෂණය යටතට පත්කොට ඇති අතර පාලන අංශයේ සේවක සංඛ්‍යාව 32 කින් හා ආයතන අංශයේ සේවක සංඛ්‍යාව 42 කින් ද සමන්විත වේ. මානව හා භෞතික සම්පත් නිසි ලෙස කළමණාකරනය කිරීමත්, ආයතනික සංවර්ධන උදෙසා කැපවීමත්, අධිකාරියේ විවිධ අංශවල කාර්ය භාරයන් ශාක්ෂාත් කර ගැනීම උදෙසා සහාය සේවාවන් සැපයීමත්, පාලන අංශයට පැවරෙන මූලික කාර්ය භාරය වේ.

2.2 පාලන අංශයේ අරමුණු හා අනිකුත් කාර්ය භාරයන් ;

2.2.1 ප්‍රධාන අරමුණු .,

- කාර්ය මණ්ඩල අවශ්‍යතා අධ්‍යයනය කිරීම, ඊට අදාල මූලික පිළිබඳව ප්‍රධාන විධායකට වාර්තා කිරීම හා කාර්ය මණ්ඩලය සංවිධානය කිරීම.
- කාර්ය මණ්ඩල බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා කටයුතු කිරීම හා ඒ පිළිබඳව ක්‍රම වේදයන් හා ක්‍රියා පටිපාටීන් ඇතුලත් ප්‍රතිව්‍යුහගතකරණ වැඩ පිළිවෙලක් සකස් කර කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒවා යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු පහසු කරවීම උදෙසා කටයුතු කිරීම.
- ආයතනයේ යහ පැවැත්ම තහවුරු කිරීම.
- කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන සටහන සකස් කිරීම.

2.2.2 දෛනික රාජකාරී,

- දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩල හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම. ඒවා ලබාදීම අවසන් කිරීම.
- අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- මහජන ඉල්ලීම් කටයුතු කිරීම.
- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපිගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- වත්කම් කළමනාකරණය හා වට්ටෝරු භාණ්ඩ ලේඛණය යාවත්කාලීනව නඩත්තු කොට පවත්වාගෙන යාම (වත්කම් භෞතික වශයෙන් මෙන්ම ලේඛන වශයෙන් ආරක්ෂා කිරීම).
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියළු ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාල කටයුතු.

2.2.3 විශේෂ පැවරුම්,

- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාගැනීම සඳහා ඒ ඒ අංශවලට යොමු කිරීම හා සම්බන්ධීකරණය.
- විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම්වලින් පැන නගින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනිකුත් උසස්වීම් විභාග පැවැත්වීම/ සංනිවේදනය කාර්ය සපුරාලීම.

2.2.4 සම්බන්ධීකරණ කටයුතු :-

- ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පටිපාටිය සකස් කිරීම.
- මාසිකව පැවැත්වෙන රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- වාර්ෂිකව පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග හා උසස් කිරීම් සම්බන්ධ රාජකාරී කටයුතු.
- වාර්ෂික පාලන වාර්තාව සකස් කිරීම හා ඊට අදාල කරුණු පිළිබඳව කටයුතු කිරීම.
- දත්ත හා තොරතුරු ඒකරාශි කිරීම, යාවත්කාලීන කිරීම හා අවශ්‍ය අවස්ථාවල අවශ්‍ය අංශවලට ලබාදීම. (තොරතුරු වාර්තා ගත කිරීම).

2.3 ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකා සමාද්ධි අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය 27,662 කි. එකී කාර්ය මණ්ඩලය ප්‍රධාන වශයෙන් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කෙරේ.

මෙම වර්ෂයේ පුරප්පාඩු වූ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා කේ.ඩී. කළුආරච්චි මහතා පත්කර ඇත. එමෙන්ම සමස්ථ කාර්ය මණ්ඩලයේ සේවකයන් විශ්‍රාම යෑම නිසා ඇති වූ බොහෝ තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම ප්‍රමාදවීමත්, සේවකයන් වෙනත් ආයතනයන්හි සේවාවන් සඳහා නිදහස්වීමත්, සේවා නිදහස්වීම් ලද බොහෝ සේවකයන් යළිත් මුල් සේවයට වාර්තා නොකිරීමත්, විදේශ රැකියාවන් සඳහා විදේශ ගතවීම් හේතුකොට ගෙන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ප්‍රමාණයේ ප්‍රතිශතය ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරුණි.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය

	තනතුර	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	ඌනතාවය
ඉහළ කළමණාකරණය	අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
	සාමාන්‍යාධිකාරී	01	01	-
	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	01	-	01
	අධ්‍යක්ෂ	09	04	05
	ප්‍රධාන අභ්‍යන්තර විගණක	01	01	-
මුළු ගණන (උප එකතුව)		**13**	**07**	**06**

මධ්‍ය කළමණාකරණය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	13	01	12
	නියෝජ්‍ය අභ්‍යන්තර	02	-	02
	සහකාර අධ්‍යක්ෂ (නීති)	01	01	-
	සහකාර අධ්‍යක්ෂ	09	01	08
	සහකාර අභ්‍යන්තර විගණක	04	01	03
	සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරි	26	16	10
මුළු ගණන (උප එකතුව)		**55**	**20**	**35**
කළමණාකරන	මූල්‍ය සහකාර	01	01	-
	පරිපාලන නිලධාරි	02	01	01
	නීති නිලධාරි	03	-	03
	ප්‍රවෘත්ති නිලධාරි	02	01	01
	පද්ධති විශ්ලේෂක	01	01	01
	සමෘද්ධි කළමණාකරු	2500	2129	371
	අභ්‍යන්තර විගණන නිලධාරි V	34	-	34
	ප්‍රධාන ලිපිකරු	09	03	06
	පද්ධති පරිපාලක	01	-	01
මුළු ගණන (උප එකතුව)		**2553**	**2135**	**418**
ක්ෂේත්‍ර නිලධාරින්	සමෘද්ධි සංවර්ධන නිලධාරින්	24370	22008	2362
සහාය කාර්ය මණ්ඩලය	අභ්‍යන්තර විගණන නිලධාරි VI	95	65	30
	පරිගණක වැඩ සටහන්කරු	02	-	02
	භාෂා පරිවර්ථක	02	01	01
	වීඩියෝ කැමරාකරු	03	01	02
	ලිපිකරු	455	60	390
	ලඝු ලේඛක	11	04	07
	පොත් තබන්නා	04	01	03
	සරප්	02	02	-
	පිළිගැනීමේ නිලධාරිණී	01	01	-
	ගබඩා භාරකරු	01	01	-
	යතුරු ලේඛක	11	10	01
	පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු	14	11	03
මුළු ගණන (උප එකතුව)		**24,971**	**22,170**	**2,801**
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	රියදුරු	37	34	03
	කාර්යාල කාර්ය සහායක	26	26	-
	ආරක්ෂක නියාමක	01	01	-
	කම්කරු	06	05	01
මුළු ගණන (උප එකතුව)		70	66	04
මුළු එකතුව		**27,662**	**24,398**	**3,264**

(මූලාශ්‍රය : වැටුප් හා සේවක සංඛ්‍යා කමිටු වාර්තාව - 2011)

2.5 <u>පාලන අංශයේ කාර්ය මණ්ඩලයේ සැකැස්ම :</u>

සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් හඳුනාගෙන ඇති මෙම අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 32 ක් වුව ද පවත්නා කාර්ය මණ්ඩලය 21 දෙනෙකුගෙන් පමණක් සමන්විත වේ.

3.0 ආයතන අංශය

පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා පිළිවෙලකට කණ්ඩායමක් එක්ව වැඩ කරන ස්ථානයක්, සංවිධානයක් වශයෙන් හැඳින්විය හැකිය.

සංවිධානයක අභ්‍යන්තර පරිපාලනය හා කළමනාකරණ ව්‍යුහය සවිමත්ව හා ක්‍රමවත්ව වන ප්‍රමාණයට එහි සංවිධාන ගත අරමුණ පහසුවෙන් ඉටුකර ගත හැකි බව අප කවුරුත් දන්නා කරුණකි. මෙහිදී මූලික වශයෙන් පුද්ගල අධීක්ෂණය, මානව ඇතුලු සෙසු කළමනාකරණ ක්ෂේත්‍රයන් කාර්යාල කළමනාකරණය සමඟ බැඳී පවතින්නේය.

ආයතනය සඳහා අවශ්‍ය සේවකයන් තෝරා ගැනීම හා බඳවා ගැනීම, සේවක මණ්ඩල සැලසුම් කිරීම, සේවක වැටුප් තීරණය කිරීම, සේවක කාර්යක්ෂමතාවය අගය කිරීම, උසස් කිරීම, මාරු කිරීම, වැඩ නැවැත්වීම, සේවක දුක් ගැනවිලි නිරාකරණය කිරීම්, විනය කටයුතු පාලනය හා වෘත්තීය සමිති කාර්යයන් ඉටු කිරීම ආදී කාර්යයන් රාශියක් සේවක කලමනාකරණ ක්‍රියාවලියේ දී ආයතන අංශය මගින් ඉටු කරනු ලබයි.

3.2 ආයතන අංශයේ අරමුණු :-

1. සමෘද්ධි කළමනාකරු / සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට රාජකාරීමය මාර්ගෝපදේශ ලබා දීම
2. රාජකාරී ඉටුකිරීමේ දී මතු වන විවිධ ගැටලු විසඳා ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන මග පෙන්වීම ලබාදීම.
3. නිලධාරීන්ගේ රාජකාරීමය අවශ්‍යතාවයන් නොපමාව සඵලදායී ලෙස ඉටුකර දීම තුළින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම.

2011 වර්ෂයේදී ඉටුකරනු ලැබූ කාර්යයන් :-

- ❖ දිස්ත්‍රික් / ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් මාරු මණ්ඩල පිහිටුවීම.
- ❖ ක්‍රියාත්මක කළ සමෘද්ධි කළමනාකරු ස්ථාන මාරු සංඛ්‍යාව - 21
- ❖ ක්‍රියාත්මක කළ සමෘද්ධි සංවර්ධන නිලධාරී ස්ථාන මාරු සංඛ්‍යාව - 53
- ❖ පරිවාස කාලයෙන් පසු සේවය ස්ථිර කරන ලද සමෘද්ධි කළමනාකරු සංඛ්‍යාව - 125
- ❖ පරිවාස කාලයෙන් පසු සේවය ස්ථිර කරන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරී සංඛ්‍යාව - 398
- ❖ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ සමෘද්ධි කළමනාකරු සංඛ්‍යාව - 22
- ❖ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ සමෘද්ධි සංවර්ධන නිලධාරී සංඛ්‍යාව - 21

- ක්‍රියාත්මක වූ වැඩ තහනම් කිරීම් සංඛ්‍යාව
  - සමෘද්ධි කළමනාකරු - 05
  - සමෘද්ධි සංවර්ධන නිලධාරී - 14

- V ශ්‍රේණියට උසස් කරන ලද සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව - 119

- ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා වාර්ෂික වැටුප් වර්ධක ලබා දෙන ලද සංඛ්‍යාව
  - සමෘද්ධි කළමනාකරු - 126
  - සමෘද්ධි සංවර්ධන නිලධාරී - 98

- ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ හා සමෘද්ධි කළමනාකරුවන්ගේ කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 43 (1) ට අනුව වැටුප් පරිවර්තනය කිරීම.

- නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනුවල අඩුපාඩුව පැවති විවිධ ලිපි ලේඛන ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීම හා ඒවා විධිමත් කිරීම

- සමෘද්ධි සංවර්ධන නිලධාරී II ශ්‍රේණියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණ දිස්ත්‍රික් මට්ටමින් පවත්වා ඉදිරි කටයුතු කිරීම සඳහා එම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛන ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

- ග්‍රාම නිලධාරී වසම්, සමෘද්ධි බැංකු සංගම්, සමෘද්ධි මහා සංගම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යල මට්ටමින් සේවා ස්ථානගත කර ඇති සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංඛ්‍යා ලේඛන වාර්තා දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් යාවත්කාලීන කර ගනිමින් පවත්වාගෙන යාම.

- සමෘද්ධි කළමණාකාර තනතුරෙහි වැඩ ආවරණය කළ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හට සමෘද්ධි කළමනාකරු පත්වීම් ලබා දී ඇත. එම් සංඛ්‍යාව 66 කි.

- උතුරු නැගෙනහිර හා අනුරාධපුරය, පුත්තලම, පොළොන්නරුව, මාතලේ යන දිස්ත්‍රික්කවල පැවති සමෘද්ධි කළමනාකරු තනතුරේ පුරප්පාඩු සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වැඩ බැලීම සඳහා පත් කර ඇත. එම සංඛ්‍යාව 10 කි.

- 1998.10.01 දිනට ප්‍රථමයෙන් වූ සමෘද්ධි නියාමක තනතුරේ සේවා කාලය සමෘද්ධි සංවර්ධන නිලධාරී සේවා කාලයට එකතු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

- අඩු සුදුසුකම් සහිතව දැනට සේවයේ යෙදී සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- සෑම මාස 03 කට වරක්ම ආයතන අංශයේ සියලුම නිලධාරීන් විසින් තමන්ගේ භාරයේ ඇති ලිපිගොනු පරීක්ෂාවට ලක් කර ඒවායේ ඇති විවිධ අඩුපාඩු පිළිබඳව වාර්තාවක් ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම සහ පසුවිපරම් කටයුතු

4.0 ග්‍රාම සංවර්ධන අංශය.

ග්‍රාම සංවර්ධනය සඳහා රජය මඟින් දරණ ලද මහත් වූ පරිශ්‍රමය යටතේ, වඩාත් අවාසි සහගත වූ දිළිඳු ජන කොටස් සවිබල ගන්වා ඔවුන් සමාජයේ වඩා වැදගත් ජන කොටසක් බවට පත් කරමින් ඔවුන්ගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීමේ සමෘද්ධි සංවර්ධන වැඩ පිළිවෙල තුළ ග්‍රාම සංවර්ධන අංශය මඟින් ඉටු කරන මෙහෙය හා දායකත්වය ඉතා ඉහළ අගයක් ගනී. ග්‍රාම සංවර්ධනයේදී යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම සමාජයේ සෑම අංශයකම සංවර්ධනය සළකා බැලීම හා ඒ සඳහා කැප වීම ග්‍රාම සංවර්ධන අංශයේ මූලික අරමුණයි.

ඉහත අරමුණ කරා ළඟාවීමේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ග්‍රාම සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික, සමාජීය, අධ්‍යාත්මික සංවර්ධනයට සෘජුවම ඉවහල් වන්නා වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් එකී අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, මඟ පෙන්වීම් සහ උපදෙස් ලබාදීමත්ය.

ඒ අනුව ප්‍රථමයෙන් 1995 වර්ෂයේදී රු. 10,000/- ක මුදලක් ලබාදී රු. 50,000/- ක් ඉක්මවූ නිමි වටිනාකමක් සහිත ව්‍යාපෘතියක් සෑම ගම්මානයකම ක්‍රියාත්මක කරවීමට ග්‍රාම සංවර්ධනය අංශය සමත්විය. මේ අනුව 1995 වර්ෂයේ ආරම්භ කළ මෙම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන නොකඩවා 2006 වර්ෂය දක්වාම සෑම ගම්මානයකම ක්‍රියාත්මක කරනු ලැබූ අතර 2007 වර්ෂයේදී ගම්මාන 4000 ක් ප්‍රමුඛ කර ගනිමින් හා 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ගම්මාන 3060 ක් ප්‍රමුඛ කර ගනිමින් අනෙකුත් සියළු ගම්මානවල ක්‍රියාත්මක කරනු ලැබීය. එසේ වුවද 2011 වර්ෂයේදී ජීවනෝපාය සංවර්ධනය හා දිවිනැගුම වැඩසටහන ප්‍රමුඛතාවයෙහි ලා වැඩසටහන් දියත් කල බැවින් යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ග්‍රාම සංවර්ධන අංශය වෙත ලැබුණු ප්‍රතිපාදන සීමාසහිත විය. ඒ අනුව ගම්මාන හෝ වසම් තෝරාගැනීමක් සිදු නොකළ අතර පොදුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක් ව්‍යාපෘතියක් වන මට්ටමින් ප්‍රතිපාදන වෙන් කරන ලදි.

ඒ අනුව 2011 වර්ෂයේදී ජීවනෝපාය සංවර්ධනයට මනා පිටුවහලක් විය හැකි වාරි හා ජල සම්පාදන ව්‍යාපෘති කෙරෙහි වැඩි නැඹුරුවක් එනම් ඉහළ ප්‍රමුඛත්වයක් දක්වමින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ බව විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

මේ අනුව 2011 වර්ෂයේදී ග්‍රාම සංවර්ධන අංශය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රු. මි. 335.98 ක් වෙන් කරනු ලැබූ අතර එම ප්‍රතිපාදන පහත සඳහන් පරිදි වැඩසටහන් දෙකක් ඔස්සේ සංවර්ධන කාර්යයන්හි යොදවනු ලැබිණි.

1. ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නා වූ විශේෂ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන
2. දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2011 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

සංවර්ධන වැඩසටහන	අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	දිස්ත්‍රික් සඳහා වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි)	වැය කරන ලද මුදල (රු.මි.)	නිමකරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රජා දායකත්ව (රු.මි)	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව
ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නාවූ විශේෂ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන	331.64	331.64	311.14	5969	271.18	145,552
දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (පරිපාලන වියදම් සඳහා)	4.34	4.34	*3.31	92 (පුහුණු හා ගමන් වියදම්)	-	2910 (නිලධාරින් සඳහා)
එකතුව	**335.98**	**335.98**	**314.45**	**5969**	**271.18**	**145,552**

**ගම්මාන 110 ක ප්‍රතිලාභී පවුල් 27,647 කගේ ජීවන තත්වය වර්ධනය ළඟා කරදීම සඳහා පහසුකරණයට අවශ්‍ය පුහුණුවීම් ලබා දීම උදෙසා අදාල නිලධාරින් වෙනුවෙන් මෙම මුදල වැය කර ඇත.*

01. ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නා වූ විශේෂ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන

ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නා වූ විශේෂ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2011 වර්ෂයේ පහත සඳහන් පරිදි ක්ෂේත්‍රයන් කිහිපයක් ඔස්සේ ක්‍රියාවට නැංවිණි.

- ❖ දිවිනැගුම හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට සමගාමීව ඊට ඉවහල් වන්නාවූ අත්‍යාවශ්‍ය වාරි හා ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ❖ අදියර කිහිපයක් ඔස්සේ නිම කිරීමට සැලසුම් කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වැඩ නිම කිරීම
- ❖ අත්‍යාවශ්‍යවූත් විශේෂ ප්‍රමුඛතාවයක් දිය යුතුවූත් ඵලදායි සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- ❖ යාපනය දිස්ත්‍රික්කයේ අත්‍යාවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

දිවිනැඟුම හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට සමගාමීව ඊට ඉවහල් වන්නාවූ අත්‍යාවශ්‍ය වාරි හා ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මේ යටතේ දිවිනැඟුම හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට අදාලව අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි. මෙහිදී විශේෂයෙන්ම කුඩා වැව් ප්‍රතිසංස්කරණය, අමුණු, ඇල මාර්ග සංවර්ධනය හා වාරි පැති බැම් ඉදිකිරීමද , ජල සම්පාදන ව්‍යාපෘති යටතේ පානීය, කෘෂි හා පොදු ජල සම්පාදන ව්‍යාපෘති ඉදිකිරීම ද ක්‍රියාත්මක කර ඇති බව විශේෂයෙන් සඳහන් කළයුතු වේ.

මෙම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කය හැර අනෙක් දිස්ත්‍රික්ක 21 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 305 ක් සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට රු. 250,000/- බැගින් රු. මි. 73.42 ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබිණි. ගම්පහ දිස්ත්රික්කයේ ක්‍රියාත්මක කල හැකි වූ යටිතල පහසුකම් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් නොවූ අතර ප්‍රමුඛතාව දිරිය පියස නිවාස තැනීම සඳහා වූ බැවින් යටිතල පහසුකම් ප්‍රතිපාදන ඒ වෙනුවෙන් වෙන් කිරිමට අවශ්‍ය කටයුතු කරන ලදි.

ඒ අනුව මෙහිදී වාරි, ජල සම්පාදන ව්‍යාපෘතීන් ප්‍රමුඛව වෙනත් විවිධ වූ ව්‍යාපෘතීන් 391 ක් සාර්ථකව නිම කරන ලද අතර ඉන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 31,411 ක් පමණ වේ. මේ සඳහා වැය වූ මුදල රු. මි. 60.00 කි.

අදියර වශයෙන් නිම කිරීමට සැලසුම් කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වැඩ නිම කිරීම

අදියර කිහිපයකින් නිම කිරීමට සැලසුම් කර පෙර වර්ෂවලදී වැඩ ආරම්භ කරන ලද අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 09 ක වැඩ නිම කිරීම සඳහා මෙම වර්ෂයේදී රු.මි. 9.42 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර ඉන් රු.මි. 7.76 ක ප්‍රතිපාදන වැය කර එම ව්‍යාපෘතීන්හි වැඩ සාර්ථකව නිම කිරීමට මෙම වර්ෂයේදී කටයුතු කරනු ලැබිණි. මෙහිදී වැඩි වශයෙන් ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලද බව සඳහන් කළ යුතු වේ.

අත්‍යාවශ්‍ය වූත් විශේෂ ප්‍රමුඛතාවයක් දිය යුතු වූත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන් තෝරාගත් වසමක් හෝ ප්‍රදේශයක් ඉලක්ක කර නොගත් අතර ප්‍රතිපාදන ලබාදීමේදී සැලකිලිමත් වූයේ ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය බව හා ප්‍රමුඛතාවය පමණි. මෙහිදී ආර්ථික, සමාජීය මෙන්ම සෞඛ්‍යමය වටිනාකමක් ඇති එහෙත් කුඩා මුදලකින් ඉටු කරවා ගත නොහැකි වූ වඩාත් ඵලදායි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රතිපාදන වැය කිරීමට හැකියාව ලැබිණි.

මේ සඳහා රු.මි. 28.80 ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබූ අතර ඉන් රු.මි. 23.27 ක ප්‍රතිපාදන වැය කර ඉතාමත් ඵලදායි ව්‍යාපෘතීන් 69 ක් සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබිණි.

යාපනය දිස්ත්‍රික්කයේ අත්‍යාවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ව්‍යපෘති ක්‍රියාත්මක කිරිම.

යාපනය දිස්ත්‍රික්කයේ අවතැන් වූ පවුල් නැවත පදිංචිය කිරීමේදී මෙන්ම මේ දක්වා විධිමත් සනීපාරක්ෂක පහසුකම් නොමැති වූ ගෘහ ඒකක සඳහාද සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම මෙහිදී සිදු කෙරිණි.

දිස්ත්‍රික්කය තුළ අඩු ආදායම්ලාභී ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කර මානසික මෙන්ම කායික සෞඛ්‍යය සුරක්ෂිත කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර මෙහිදී අනිවාර්යයෙන්ම ජල මුද්‍රිත වැසිකිලි ඉදිකිරීමට කටයුතු කරන ලදි.

මේ අනුව එක් වැසිකිලියක් ඉදිකිරිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට හා පුහුණු ශ්‍රමය සඳහා රු. 40,000/- ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර සමෘද්ධි බැංකු සංගම් හරහා ඉදිකිරීම් හි ප්‍රගතියට අනුව අවශ්‍ය මුදල් ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කරන ලදි. ඉහත රු. 40,000/- සමඟින් ප්‍රදේශයේ භූවිෂමතාවයට අනුව අදාල ප්‍රතිලාභීන්ගේ මුදල් හා ශ්‍රමයේ දායකත්වය වන රු. 37,000/- ක් පමණ වැය කර රු.77,000/- ක පමණ නිමි වටිනාකමින් යුතු වැසිකිලියක් ඉදිකිරිමට කටයුතු කර ඇත.

මේ අනුව ජල මුද්‍රිත වැසිකිලි 5500 ක් ඉදිකිරීම සඳහා රු.මි.218.50 ක ප්‍රතිපාදන වැය කිරීමට කටයුතු කෙරිණි. මීට අමතරව මේ යටතේ සනීපාරක්ෂක උපකරණ මිලදීගැනීම් වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය හරහා රු.මි. 1.61 ක ප්‍රතිපාදන වැයකර ඇත.

මේ අනුව යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ක්ෂේත්‍රයන් කිහිපයක් ඔස්සේ මෙම අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 331.64 ක් පමණ වේ. මින් රු.මි. 311.14 ක මුදල යොදවා ව්‍යාපෘතීන් 5969 ක් සාර්ථකව නිමකර ඇති අතර ඉන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 145,552 කි. නිමි වටිනාකම රු. මි. 575.13 කි.

විශේෂ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ නිම කරන ලද ව්‍යාපෘති වර්ගීකරණය පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

නිම කරන ලද ව්‍යාපෘති විශ්ලේෂණය

ව්‍යාපෘති වර්ගය	නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	සමෘද්ධි අධිකාරියේ දායකත්ව වටිනාකම (රු.මි)	ප්‍රජා දායකත්ව යේ වටිනාකම (රු.මි)	නිමි වටිනාකම (රු.මි)	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව
මාර්ග/පාලම්	12	7.81	1.58	9.49	8168
වාරි ව්‍යාපෘති	248	56.33	11.44	68.65	20383
ජල සම්පාදන	166	26.01	4.00	24.01	11459
සනීපාරක්ෂක පහසුකම්	5543	218.92	254.16	472.98	105,542
පරිපාලන වියදම් (දි.ලේ / ප්‍රා.ලේ)	0	0.46	0	0	0
ප්‍රධාන කාර්යාලය	0	1.61	0	0	0
එකතුව	**5969**	**311.14**	**271.18**	**575.13**	**145,552**

නිම කරන ලද ව්‍යාපෘති



දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (ගැමිදිරිය)

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ගැමිදිරිය ආයතනය හා ඒකාබද්ධව ගැමිදිරිය ප්‍රජා පාලිත ක්‍රමවේදය ගම්මාන 110 ක ක්‍රියාත්මක කිරීම 2010 වසරේ සිට ආරම්භ කරනු ලැබිණි. මෙය අවුරුදු 03 ක් තුල , එනම් 2010 - 2012 දක්වා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

පහත සඳහන් පරිදි දිස්ත්‍රික්ක 07 ක ගම්මාන 110 ක් තුල ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා ඒ ඒ ගම්මානයන්ට වෙන්වන මුදල් ප්‍රමාණය තීරණය වීමේ සාධකය වනුයේ ගම්මානයේ සිටින මුළු ජන සංඛ්‍යාවයි. එනම් එක් පුද්ගලයෙකු වෙනුවෙන් රු. 5000/- ක් වෙන්වන අතර ඒ ඒ ගම්මානයන්හි මුළු ජන සංඛ්‍යාවට අනුව රු.මි. 552.97 ක් ග්‍රාම සංවර්ධන අරමුදලට වෙන්වී ඇත.

මෙය ලෝක බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන හෙයින් අදාල ග්‍රාම සංවර්ධන අරමුදල් ගැමිදිරිය ආයතනය හරහා ඒ ඒ ගම්මාන සංවිධාන වෙත යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදල් ලබාදීම සිදුවේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක ගම්මාන ගණන හා එහි අරමුදල

දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ.කො.ගණන	ක්‍රියාත්මක ගම්මාන ගණන	වෙන්වන ග්‍රාම සංවර්ධන අරමුදල (රු.මි)
රත්නපුර	09	13	59.49
මොණරාගල	05	08	36.98
පොලොන්නරුව	04	08	44.02
බදුල්ල	05	08	39.39
හම්බන්තොට	06	18	102.73
කැගල්ල	11	31	160.78
නුවරඑළිය	04	24	109.58
එකතුව	**44**	**110**	**552.97**

මෙලෙස වෙන්වී ඇති ග්‍රාම සංවර්ධන අරමුදල තුළින් පහත පරිදි ජීවන මාර්ග වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රජාවගේ හැකියාවන් වර්ධනයට හා ආයතනික සංවර්ධනයට ඉවහල් කරගත හැකි පරිදි මුදල් වෙන්කරදී ඇත.

ග්‍රාම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් වෙන්කර ඇති ආකාරය

දිස්ත්‍රික්කය	*ක්‍රියාත්මක ගම්මාන ගණන*	*වෙන්කර ඇති ග්‍රාම සංවර්ධන අරමුදල (රු.මි.)*	*ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන්කර ඇති ආකාරය*		
			හැකියාවන්ට හා ආයතනික වර්ධනයට (රු.මි.)	*ජීවන මාර්ග සඳහා (රු.මි.)*	*යටිතල පහසුකම් සඳහා (රු.මි.)*
රත්නපුර	13	59.49	8.92	8.92	41.64
මොණරාගල	08	36.98	5.55	5.55	25.89
පොලොන්නරුව	08	44.02	6.60	6.60	30.81
බදුල්ල	08	39.39	4.80	12.22	22.38
හම්බන්තොට	18	102.73	12.75	30.46	59.51
කැගල්ල	32	160.78	24.12	24.12	112.54
නුවරඑළිය	24	109.58	16.44	16.44	76.70
එකතුව	**111**	**552.97**	**79.18**	**104.31**	**369.47**

ඉහත ග්‍රාම සංවර්ධන අරමුදල ගම්මානය වෙත ලබාගැනීමේ ප්‍රධාන පහසුකරණ කාර්යය ක්‍රියාත්මක කිරීමේ වගකීම සමෘද්ධි සංවර්ධන නිලධාරි වෙත පවරා ඇති අතර එහි අධීක්ෂණ කටයුතු සමෘද්ධි කලාප කළමනාකරු වෙත රාජකාරිමය වශයෙන් පවරා ඇත.

රාජකාරි වගකීම් පවරා ඇති අදාල නිලධාරීන් සමෘද්ධි ව්‍යාපාරය යටතේ වූ තමන්ගේ නිත්‍ය රාජකාරි කටයුතු වලට අතිරේකව මෙම ව්‍යාපෘතියේ පහසුකරණ කාර්යයෙහි නිරතවීම මෙහිදී විශේෂයෙහි ලා පෙන්වා දිය යුතුය.

එමෙන්ම මෙම අරමුදල ගම්මානයන් වෙත ලබා ගැනීමේදී ගැමිදිරිය ප්‍රජා පාලිත ක්‍රමවේදයට අදාලව අවශ්‍ය පුහුණුවීම් අදාල සමෘද්ධි නිලධාරීන් / සමාද්ධි කළමනාකරුවන් වෙත ලබාදීමට කටයුතු කර ඇති අතර එම පුහුණු වීම් හි එයට අදාල සියළු වියදම් දැරීම ගැමිදිරිය ව්‍යාපෘතිය හරහා මෙම වසරේදී සිදුකර ඇත.

එසේ වුවද මේ සඳහා අවශ්‍ය පරිපාලන වියදම් දැරීම එනම් සහභාගිත්ව දීමනා, සංයුක්ත / ගමන් වියදම් දීමනා හා නිලධාරීන්ට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබාදීම වැනි කාර්යයන් සඳහා වියදම් දැරීම ආයතන දෙක අතර වූ ඒකාබද්ධ ගිවිසුමට අනුව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙතින් සිදුකර ඇත.

මේ සඳහා 2011 වසරේ රු.මි. 4.34 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතියේ පරිපාලන වියදම් සඳහා වෙන්කර ඇති අතර පහත පරිදි 2011.12.31 දිනට වියදම් දරා ඇත.

දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා පරිපාලන වියදම් දැරීම - 2011.12.31 දිනට

දිස්ත්‍රික්කය	ක්‍රියාත්මක ගම්මාන ගණන	පවත්වන ලද පුහුණුවීම් / රැස්වීම් ගණන	සහභාගි වූ නිලධාරීන් ගණන	අනුමත කල මුළු මුදල (රු.)	වැයකර ඇති මුළු මුදල (රු.)
රත්නපුර	13	10	282	468,144.00	308,834.00
මොණරාගල	08	06	64	245,100.00	179,525.00
පොලොන්නරුව	08	16	586	344,430.00	269,909.00
බදුල්ල	08	07	143	234,050.00	208,290.00
හම්බන්තොට	18	18	799	800,400.00	674,178.00
කැගල්ල	31	20	484	1,271,035.00	872,549.00
නුවරඑළිය	24	14	524	948,350.00	783,418.95
සමෘද්ධි අධිකාරිය		01	28	31,000.00	23,650.00
එකතුව	**110**	92	2910	4,342,509	3,320,353.95

සමෘද්ධි නිලධාරීන් තමන් විසින් ලබාගන්නා ලද ප්‍රජා පාලිත ක්‍රමවේදයේ පුහුණුවීම් තුළින් ඒ ඒ ගම්මානවල ග්‍රාම සංවර්ධන සැලැස්මට අදාල වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකරණයන් ග්‍රාමීය සංවිධාන වෙත ලබාදෙමින් පහත සඳහන් පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම වසරේදි ආරම්භ කරන ලදි.

දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකව ඇති ව්‍යාපෘති විශ්ලේෂණය - 2011.12.31 දිනට

දිස්ත්‍රික්කය	ක්‍රියාත්මක ගම්මාන ගණන	2011 වසරේ ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන			එකතුව
		හැකියා වර්ධන හා ආයතනික සංවර්ධන ව්‍යාපෘති	ජීවන මාර්ග	යටිතල පහසුකම්	
රත්නපුර	13	67	146	27	173
මොණරාගල	08	38	261	7	268
පොලොන්නරුව	08	42	249	8	257
බදුල්ල	08	31	29	11	40
හම්බන්තොට	18	71	78	22	100
කැගල්ල	31	58	0	55	55
නුවරඑළිය	24	24	0	24	24
එකතුව	**110**	**331**	**763**	**154**	**917**

- ❖ ඉහත පරිදි ආයතනික හැකියාවන් වර්ධනය කිරීම යටතේ ඒ ඒ ගම්මානයේ ව්‍යාපෘති කාර්යාලයක් පවත්වා ගැනීමට අදාලව අවශ්‍ය වන්නා වූ උපකරණ හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන පරිපාලන වියදම් දැරීම් පෙන්වා ඇත. එමෙන්ම හැකියාවන් වර්ධනය කිරීම යටතේ ප්‍රජාවට ජීවනෝපාය හා යටිතල පහසුකම් වර්ධනය කිරීමට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබා දී ඇත.

- ❖ ජීවන මාර්ග අරමුදල යටතේ වෙන්වන මුදලින් ජීවන මාර්ග සඳහා අවශ්‍ය ණය ලබාදීම් සිදුකර ඇති අතර මෙය චක්‍රීය අරමුදලක් වේ.

- ❖ යටිතල පහසුකම් අරමුදල යටතේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජාවගේ සෘජු මැදිහත්වීමත් ප්‍රජාව විසින්ම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් විශේෂ වන අතර මේ යටතේ මාර්ග හා ජල සම්පාදන ව්‍යාපෘති ප්‍රමුඛ වී ඇත.

2012 වසර අවසන් වනවිට සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පහසුකරණය ඔස්සේ ඒ ඒ ගම්මානයන්ට වෙන්කර ඇති මුළු ග්‍රාම සංවර්ධන අරමුදල් යටතේ තවදුරටත් යටිතල පහසුකම් හා ජීවන මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇත.

සමස්ථ ප්‍රගතිය - 2011

ව්‍යාපෘති වර්ගය	නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	සමෘද්ධි අධිකාරියේ දායකත්ව වටිනාකම (රු.මි)	ප්‍රජා දායකත්ව යේ වටිනාකම (රු.මි)	නිමි වටිනාක ම (රු.මි)	ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව
මාර්ග/පාලම්	12	7.81	1.58	9.49	8168
වාරි ව්‍යාපෘති	248	56.33	11.44	68.65	20383
ජල සම්පාදන	166	26.01	4.00	24.01	11459
සනීපාරක්ෂක පහසුකම්	5543	218.92	254.16	472.98	105,542
*පුහුණු වැඩසටහන්	* 92	3.31			* 2910
පරිපාලන වියදම් (දි.ලේ / ප්‍රා.ලේ)	0	0.46	0	0	0
**ප්‍රධාන කාර්යාලය	0	1.61	0	0	0
එකතුව	**5969**	**314.45**	**271.18**	**575.13**	**145,552**

* නිලධාරීන් පුහුණු කිරීම් බැවින් පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා පුහුණු නිලධාරීන් සංඛ්‍යාව මුළු එකතුවට ඇතුලත් කර නැත.

** සනීපරක්ෂක වැඩසටහන යටතේ යාපනය දිස්ත්‍රික්කය සඳහා සනීපාරක්ෂක උපකරණ මිලදී ගැනීම වෙනුවෙනි.

සංවර්ධන ව්‍යාපෘති සඳහා ග්‍රාම සංවර්ධන අංශයේ ආයෝජනය (රු.මි.)

අනු අංකය	වැඩසටහන	වර්ෂය 2009	2010	2011
1	විශේෂ ව්‍යාපෘති	72.74	55.64	311.14
2	විශේෂ ගම්මාන සංවර්ධන ව්‍යාපෘති	53.89	0	0
3	යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	1475.22	758.48	0
4	කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	0	774.95	0
5	අවිච්ඡේද ව්‍යාපෘති	0	5.32	0
6	ගමනැඟුම දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	0	1.56	3.31
එකතුව		**1601.85**	**1595.95**	**314.45**

මූලාශ්‍රය - වියදම් වාර්තා ඇසුරිණි.

5.0 කෘෂි සංවර්ධන අංශය.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වන අතර එහි ඵලදායිතාවය ගෘහස්ථ හා ග්‍රාමීය මට්ටමෙන් වැඩි දියුණු කර ඔවුන්ගේ ආර්ථික හා පෝෂණ මට්ටම නගා සිටුවීමට සහ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරලීම සඳහා සුදුසු ක්‍රමවේදයන් සැළසීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වේ.

අනාදිමත් කාලයක සිට අප රටේ ආර්ථිකයෙහි පදනම වූයේ කෘෂි කර්මාන්තයයි. ඒ තුලින් රටෙහි සැලසුම්ගත සමාජ ආර්ථික සංවර්ධනයක් ඉලක්ක කරගත් ක්‍රමෝපාය භාවිතා කිරීමේදි කෘෂි අංශය අඛණ්ඩවම වැදගත් කාර්යභාරයක් ඉටු කෙරිණ. ජාතික මට්ටමින් ස්වායත්තතාවය ලගා කර ගැනීම, ආහාර සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සහ දරිද්‍රතාවය පිටු දැකීම සඳහා සාධාරණ ලෙස ආදායම හා ධන ව්‍යාප්තිය ඇති කරලීම පිණිස විශේෂයෙන් දේශීය ආහාර නිෂ්පාදනය, විසිතුරු මල් වගාව සහ අපනයන බෝග යන අංශ ඇතුළුව සමස්ත කෘෂිකාර්මික අංශයෙහි සීඝ්‍ර වර්ධනයක් සිදුවීම අත්‍යාවශ්‍ය කරුණකි. මේ හේතුවෙන් මෙරට ජනතාවගේ ආර්ථික සෞභාග්‍ය උදාකර දීම සඳහා කෘෂි අංශයේ වර්ධනය වේගවත් කරලීමෙන් මෙම දැවැන්ත අභියෝගය ජය ගැනීම පිණිස රජය විසින් මෙම අංශයේ වර්ධනයට ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යමත් රටක් බවට පත් කරලීමේ මෙහෙවරට දායක වීම සඳහාත්, කෘෂිකර්ම ක්ෂෙත්‍රයට ප්‍රමුඛත්වය ලබාදී මෙම ක්ෂෙත්‍රයන් ප්‍රවර්ධනය කිරීම තුලින් ප්‍රජාවගේ ආර්ථිකය දියුණු කිරීමත්, පවුලේ පෝෂණ තත්වය ඉහල නැංවීමත් සමඟම රටේ ආහාර සුරක්ෂිතභාවය ඇති කිරීමත් අරමුණු කර ගනිමින් ප්‍රධාන වැඩසටහන් කීපයක් ඔස්සේ දිවි නැගුම ජාතික වැඩසටහනට සමගාමීව ඵලදායි හා තිරසාර කෘෂි ආශ්‍රිත ව්‍යාපෘති 39,954 මුළු දිවයිනට ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය.

ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන්:-

1. පැල හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම.
2. දේශීය ආහාර බෝග වගා ප්‍රවර්ධනය.
3. සුළු පරිමාණ වැවිලි බෝග හිමියන් දිරිමත් කිරීමේ ව්‍යාපෘතිය.
4. පෝෂණ ප්‍රවර්ධනය සඳහා ගෙවතු සංවර්ධනය කිරීම.
5. නවීන කෘෂි තාක්ෂණික ව්‍යවසායකත්ව දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

1.පැල හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම.

වැඩි වන ජනගහනයට සරිලන පරිදි ආහාර නිෂ්පාදනය හා වැඩි දියුණු කිරීම, අපනයන වෙළඳපොල ඉලක්ක ගත එළවළු, මල් නිෂ්පාදනය මඟින් විදේශ විනිමය උපයා ගැනීම සඳහා ප්‍රතිලාභීන් යොමු කරවීම සහ දිවි නැගුම ජාතික වැඩසටහන හා විවිධ බෝග වගාවන් සඳහා අවශ්‍යවන්නා වූ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ අරමුණින් සමෘද්ධි වැඩසටහන යටතේ

නව තාක්ෂණය ග්‍රාමීය අඩු ආදායම්ලාභී ජනතාව වෙත ප්‍රවිෂ්ට කිරීම සිදු කෙරිණ. මේ යටතේ දිවයින පුරා ආරක්ෂිත ගෘහ 2,236 ක් ඉදි කෙරිණ. මෙම ආරක්ෂිත ගෘහ තුල එළවළු, පලතුරු, විසිතුරු මල් ඇතුළු පත්‍රික ශාක සහ කෘෂි අපනයන බෝග ඇතුළු වෙනත් පැල නිෂ්පාදනය කරනු ලබන පැල තවාන් 1,746 ක් සහ එළවළු හා මල් නිෂ්පාදනයට යොමු වූ ප්‍රතිලාභීන් 490 ක් ඇත. එමෙන්ම මේ යටතේ සාමාන්‍ය පැල තවාන් 1,081 ක් ද ආරම්භ කර ඇත.

ලොකු ළූණු බීජ නිෂ්පාදනය - දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

2. දේශීය ආහාර බෝග වගා ප්‍රවර්ධනය.

ප්‍රාදේශියව පවත්නා සම්පත්, විභවයන් හා වෙළඳපල ඉල්ලුම සැලකිල්ලට ගනිමින් දේශීයව වගා කල හැකි බෝග වගාවන් ප්‍රවර්ධනය කිරීම තුලින් ප්‍රතිලාභින්ගේ ආදායම් තත්වය නගා සිටුවීම හා චිරස්ථායි කරලීම සහ දේශීය පරිභෝජන අවශ්‍යතාවය සපුරා ගැනීමට දායක වීම මෙමඟින් සිදු කෙරිණි. මේ යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති කිපයක් නම්,

- ❖ බෝග වගා ව්‍යාපෘති - පලතුරු, එළවළු, පලා වර්ග, අල වර්ග, ක්ෂේත්‍ර බෝග, ධාන්‍ය වර්ග

මිදි වගාව - උඩපලාත ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය

ගෝවා වගාව - වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

විශේෂයෙන් මෙවැනි ව්‍යාපෘති ග්‍රාමීය ප්‍රජාව වෙත ලඟා කරදීමත්, විවිධාංගීකරණයත්, නව ක්‍රම අත්හදා බැලීමත්, සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැරව සිතීමට පෙළඹවීමත් තුලින් නව කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම හා මනා කළමණාකාරිත්වය තුලින් ප්‍රතිලාභින්ගේ ආදායම් තත්වය ඉහළයාමත් පසුගිය වර්ෂය තුලදී පෙන්නුම් කෙරිණි.

දේශීය ආහාර ව්‍යාපෘති 20,079 ක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභීන් විශාල පිරිසකට සෙත සැලසීමට ද එමඟින් ඔවුන්ගේ ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම තුලින් ජාතික නිෂ්පාදනයට දායකත්වයක් ලබා දීමට ද හැකිවිය.

මීරි ඇඹරැල්ලා වගාව - හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

3. සුළු පරිමාණ වැවිලි බෝග හිමියන් දිරිමත් කිරීමේ ව්‍යාපෘතිය.

කුඩා ඉඩම් සහිත සුළු පරිමාණ වගාකරුවන් දිරිමත් කිරීම හා වගාව සඳහා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම මෙහි මූලික අරමුණ විය. මේ යටතේ තේ, පොල්, රබර් වගාවන්ට අමතරව කුරුඳු වගාව ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කෙරිණි. මෙහිදී විශේෂයෙන්ම අදාල බෝගයන්හි පැල තවාන් ආරම්භ කිරීම සඳහා මූලික තැනක් දෙනු ලැබිණ.



තේ වගාව - අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

4. පෝෂණ ප්‍රවර්ධනය සඳහා ගෙවතු සංවර්ධනය කිරිම.

තම ගෙවත්ත තුලින්ම දෛනික පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමත්, ආහාර සුරක්ෂිතභාවය පවත්නා ගැනීමත්, අතිරේක ආදායම් මාර්ගයක් උපයා ගත හැකි ව්‍යාපෘතියක් ගෘහස්ථ පරිශ්‍රය තුලින්ම ඇති කිරීමත් අරමුණු කර ගනිමින් සමෘද්ධි වැඩසටහන යටතේ ගෙවතු 13,598 ක් සංවර්ධනය කල අතර දිවි නැගුම වැඩසටහන පලමු අදියර යටතේ සමෘද්ධි නිලධාරීන්ගේ අධික්ෂණය යටතේ ගෘහස්ථ ඒකක 469,537 ක් සංවර්ධනය කෙරිණ. සංවර්ධනය කරන ලද ගෙවතු වල පහත අයිතමයන් අඩංගු කෙරිණ

ගෙවතු වගාව - අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

I. පළතුරු බෝග -
අඹ, කෙසෙල්, පැපොල්, අන්නාසි, මැංගුස්, රඹුටන්, දොඩම්, දෙහි, වැල් දොඩම්, ආදි පලතුරු වර්ග

II. එළවළු -
බටු ,තක්කාලි, මිරිස්, මෑ, කරවිල, පතෝල, වට්ටක්කා, බංඩක්කා, කැරට්, බීට්, දඹල ආදි එළවළු වර්ග.

III. පලා වර්ග -
කතුරු මුරුංගා, ගොටු කොළ, මුකුණුවැන්න, කංකුන්, තම්පලා ,නිවිති ආදි පලා වර්ග.

IV. අල බෝග -
බතල, මඤ්ඤොක්කා , කිරි අල, වැල් අල, ඉන්නල, රාජා අල ආදිය.

V. දේශීය ඖෂධ වර්ග -
බිං කොහොඹ, කටුවැල් බටු, කෝමාරිකා, ඉඟුරු, කහ, පොල් පලා, සේර ආදිය

VI. වෙනත් බෝග -
පොල්, තැඹිලි, පුවක් , කරපිංචා, සේර, බුලත් ආදිය.

VII. කොම්පොස්ට් පොහොර නිෂ්පාදන ඒකක.

VIII. මී මැසි පාලන ඒකක.

ගෙවත්ත තුල මී මැසි පාලනය

5. නවීන කෘෂි තාක්ෂණික ව්‍යවසායකත්ව දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

කෘෂි ආශ්‍රිත ව්‍යාපෘති හා ස්වයං රැකියාවල ගුණාත්මය සහ ඵලදායිතාවය ඉහල නැංවීම හා තිරසර බව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කෘෂි තාක්ෂණික ව්‍යවසායකත්ව දැණුම න්‍යායාත්මක හා ප්‍රායෝගිකව වර්ධනය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළු රේඛීය ආයතන වල තාක්ෂණික සහාය ලබා ගනිමින් මෙම පුහුණු වැඩසටහන් සාර්ථක කර ගැනීමට හැකියාව ලැබිණ.

ඇන්තුරියම් වගාව පිළිබඳ පුහුණුව - උද්භිද උද්‍යානය,ගම්පහ

2011 කෘෂි සංවර්ධන වැඩසටහන්හි භෞතික ප්‍රගතිය (ව්‍යාපෘති සංඛ්‍යාව)



2011 - කෘෂි සංවර්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය (රු.මි.)



6.0 සත්ත්ව පාලන හා ධීවර සංවර්ධන වැඩසටහන.

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය උදෙසා සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති වලට ඔවුන් යොමු ගත කිරීමේ භාරදූර වගකීමට උර දෙමින් කටයුතු කිරීම මෙම වැඩසටහනෙහි වගකීම වේ.

ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ජීවන රටාව මූලික කරගත් ජනතාවක් ඈත අතීතයේ සිටම ජීවත් විය. මෙහිදී කෘෂිකාර්මික ක්ෂේත්‍රය යටතේ පශු සම්පත් අංශය ප්‍රමුඛ ස්ථානයක් ගනී. ජල හිඟය සහ භූමියේ පවතින විවිධ හේතූන් නිසා බෝග වගාවන් කළ නොහැකි බිම් යොදාගෙන සත්ත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කල හැකිවේ. එමෙන්ම ශ්‍රී ලංකාව සාගරයෙන් වටවූ දූපතක් වන අතර රට තුලද විවිධ ප්‍රමාණයෙන් යුත්, විවිධ වර්ගයේ ජලාශයන් පිහිටා ඇත. මේවා ප්‍රයෝජනයට ගෙන ධීවර කර්මාන්තය ප්‍රචලිත කිරීමට ද වැඩි විභවයක් පවතී.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමෘද්ධි ප්‍රතිලාභීන් සහ අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය උදෙසා විවිධ ව්‍යාපෘති වලට ඔවුන් යොමුගත කිරීමේ භාරදූර වගකීමට උරදී සිටී. ඉහත විභවයන් සැලකිල්ලට ගනිමින් විශේෂයෙන් සත්ත්ව පාලන හා ධීවර වැඩසටහන් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් ඉලක්ක ගත කරගනිමින් මේ දක්වා ක්‍රියාත්මක කර ඇත. මෙහිදී සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති සඳහා පුද්ගලයන් යොමු කිරීම තුලින් ඔවුන්ගේ විරැකියාව අඩුවීම, ආර්ථිකව සවිමත් වීම සහ පවුලේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු වීම සිදුවේ.

2011 වර්ෂෙය් දී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දිවයින පුරා ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයක් ස්ථාපනය කිරීමේ "දිවිනැගුම" ජාතික ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පශු සම්පත් හා ධීවර ක්ෂේත්‍රය සඳහා ද ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත.

දිවිනැගුම වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සත්ත්ව පාලන හා ධීවර වැඩසටහන පහත අරමුණු පෙරදැරි කර ගනිමින් 2011 වර්ෂයේ විවිධ සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1. තිරසර සහ කාර්යක්ෂම ලෙස සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති වල නිරත වීම සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් සහ අඩු ආදායම්ලාභීන්ට පහසුකම් සැලසීම තුලින් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීම.
2. සැකසුම් ක්‍රියාදාමයන් තුළින් සත්ත්ව පාලන හා ධීවර ප්‍රාථමික නිෂ්පාදන වල අගය වැඩි කිරීමේ ව්‍යාපෘති හඳුන්වාදීම සහ අලෙවි පහසුකම් සලසාදීමට කටයුතු කිරීම.
3. ඒකාබද්ධ පෝෂණ වැඩසටහන් තුලින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
4. සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති වල ඵලදායීතාවය ඉහළ නැංවීමට අවශ්‍ය සේවා සහ තාක්ෂණය හඳුන්වා දීමට අදාලව සියළුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

සත්ත්ව පාලන හා ධීවර සංවර්ධන වැඩසටහන

2011 වර්ෂයේ දී සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති සඳහා විභවයක් පවතින සියළුම ග්‍රාමසේවා කොට්ඨාශ ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. සත්ත්ව පාලන හා ධීවර වැඩසටහන වෙනුවෙන් 2011 වර්ෂය සඳහා රු. මිලියන 400.7 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙම ප්‍රතිපාදන වැය කර පහත සඳහන් ප්‍රධාන වැඩ සටහන් ආරම්භ කරන ලදී.

1. සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති අවස්ථා ඇති කර ඒ සඳහා ප්‍රතිලාභීන් යොමු ගත කිරීම.
2. ප්‍රාථමික නිෂ්පාදන වල අගය වැඩි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම පිණිස සුදුසු ව්‍යාපෘති හඳුන්වාදීම.
4. ව්‍යාපෘති සඳහා සෘජුව සම්බන්ධ වන ප්‍රතිලාභීන් සඳහා ව්‍යාපෘති බද්ධ දැනුම ලබාදීම.

01. සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති අවස්ථා ඇති කර ඒ සඳහා ප්‍රතිලාභීන් යොමු ගත කිරීම.

මේ යටතේ ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස කිරිගව සංවර්ධන ව්‍යාපෘතිය දැක්විය හැක. මෙහිදී කිරිගවයින් ලබාදීම , ගවගාල් සකස් කිරීම , ජීවවායු ඒකක පිහිටුවීම , ගව අභිජනන ඒකක පිහිටුවීම දැක්විය හැක.

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් අතර සිටින සුළු පරිමාණ කිරි ගොවීන්ගේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමත්, වාර්ෂිකව මෙරට කිරිපිටි ආනයනය සඳහා වැයවන අධික විදේශ විනිමය ප්‍රමාණය යම් තරමකින් හෝ අඩු කොට දේශීය නැවුම් කිරි පාරිභෝජනය වැඩි කිරීමත් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු ලෙස දැක්විය හැක. තවද සාම්ප්‍රදායික ක්‍රම වලින් යම්තාක් දුරට බැහැර වී වැඩි කිරි නිෂ්පාදනයක් ලබාගැනීම , බල ශක්ති අර්බුදයට පිළියම් යෙදීම සහ කිරිගව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කිරිගවයින්ගේ හිඟයට පිළියම් යෙදීම සඳහා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව ප්‍රාදේශීයව පවතින විභවයන් සහ ප්‍රතිලාභීන්ගේ කැමැත්ත අනුව එළුවන් ඇති කිරීම , ඌරන් ඇති කිරීම , ව්‍යාපාර මට්ටමින් බිත්තර නිෂ්පාදනය , බ්‍රොයිලර් නිෂ්පාදනය , ජීවවායු ඒකක ඇති කිරීම , මිරිදිය හා කරදිය ධීවර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , විසිතුරු මසුන් ඇති කිරීම යනාදී ව්‍යාපෘති 6,345 ක් 2011 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී.

02. ප්‍රාථමික නිෂ්පාදන වල අගය වැඩි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ව්‍යාපෘති තුලින් ලබාගන්නා ප්‍රාථමික නිෂ්පාදන වැඩි වශයෙන් පවතින කාල වලදී ඒවා අපතේ යා නොදී අගය වැඩි කිරීම තුලින් වැඩි ආදායමක් ලබාගැනීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ. මේ යටතේ කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ ධීවර නිෂ්පාදන ප්‍රමුඛ වේ. 2011 වර්ෂයේ දී මෙම ව්‍යාපෘති 134 ක් ආරම්භ කරන ලදී.

03. පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම පිණිස සුදුසු ව්‍යාපෘති හඳුන්වාදීම.

පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට ගෘහාශ්‍රිතව කිකිළියන් ඇති කිරීමේ ව්‍යාපෘති ප්‍රචලිත කිරීම ප්‍රධාන වශයෙන් ආරම්භ කරන ලදී. මසක් වයසැති කිකිළි පැටවුන් 10 ක් පමණ එක් පවුලක් සඳහා ලබාදුන් අතර, පසුගිය වසර තුලදී ව්‍යාපෘති 1,914 ක් ක්‍රියාත්මක කරන ලදී.

තවද මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මසක් වයසැති කිකිළි පැටවුන් සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් සපයා දීමට කටයුතු කරන ලදී. මේ යටතේ ගාල්ල , කළුතර , පුත්තලම , පොළොන්නරුව , මාතර , වව්නියා , අනුරාධපුරය , මාතලේ , කෑගල්ල , කුරුණෑගල , බදුල්ල , යන දිස්ත්‍රික් වල දිනක් වයසැති කිකිළි පැටවුන් මසක් දක්වා වර්ධනය කිරීමට ප්‍රතිලාභීන් සම්බන්ධ වූ අතර , මේ යටතේ සෘජුව මසක් වයසැති කිකිළි පැටවුන් 76,165 බෙදා දෙන ලදී.

මේ අනුව දිස්ත්‍රික් මට්ටමින් සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති 8,393 ක් සඳහා රු. මිලියන 234.378 ක් වැය කර ඇත.

04. ව්‍යාපෘති සඳහා සෘජුව සම්බන්ධ වන ප්‍රතිලාභීන් සඳහා ව්‍යාපෘති බද්ධ දැනුම ලබාදීම.

විෂයානුබද්ධ තාක්ෂණික පුහුණු හා සහාය සේවා සම්බන්ධීකරණය කිරීම ප්‍රධාන අරමුණ වේ. සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති වල යෙදෙන හා අළුතින් ආරම්භ කිරීමට සැලසුම් කල ව්‍යාපෘති වල ඵලදායීතාවය ඉහල නංවා ජාතික ආදායමට වැඩි දායකත්වයක් ලබාදීම මෙහිදී අරමුණ කරගන්නා ලදී. ව්‍යාපෘතියක් සාර්ථක වීමට නම් නව දැනුම හා තාක්ෂණික උපදෙස් ව්‍යාපෘතිලාභීන්ට නිරන්තරයෙන්ම ලබාදීම අත්‍යාවශ්‍යවේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘතිලාභීන් කණ්ඩායම් ගතකොට අදාල ක්ෂේත්‍රයේ නිපුනතාවයෙන් හෙබි සම්පත්දායකයින් යොදවාගෙන සාර්ථක පුහුණු වැඩසටහන් පවත්වන ලදී. බොහෝ අවස්ථා වල වෙනත් රේඛීය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් යොමු කරන ලදී. සෘජු ප්‍රතිපාදන හා සමෘද්ධි බැංකු මගින් ක්‍රියාත්මක විවිධ ණය ලබාගෙන සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රතිලාභීන් සඳහා මෙම පුහුණු වැඩසටහන් පවත්වන ලදී. කිරිගවයින් ඇති කිරීම , බිත්තර නිෂ්පාදනය , ඌරන් තර කිරීම , එළු පාලනය සහ මිරිදිය මසුන් ඇති කිරීම යනාදී විවිධ ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක විය. මීට අමතරව වැඩසටහන් අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචන කටයුතු ද සිදුකරන ලදී. මේ සඳහා රු. 113,972 ක් වැය කරන ලදී.

මීට අමතරව වෙනත් වැඩ සටහන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් රු.613,350.00 ක මුදලක් වැය කර ඇත. ඒ අනුව සත්ත්ව පාලන හා ධීවර අංශය 2011 වර්ෂයේ දී රු. මිලියන 234.992 ක මුදලක් මෙම ක්ෂේත්‍රයේ ව්‍යාපෘති සංවර්ධනය වෙනුවෙන් යොදවන ලදී.

2011 වසරේදී දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කළ ව්‍යාපෘති සහ වැය කරන ලද මුදල

දිස්ත්‍රික්කය	ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	මුදල රු.මි.
කොළඹ	66	2.310
ගම්පහ	352	12.093
කළුතර	221	5.869
ගාල්ල	183	7.046
මාතර	223	5.308
හම්බන්තොට	103	2.414
මොණරාගල	59	1.304
බදුල්ල	281	9.530
මහනුවර	405	11.018
මාතලේ	146	5.099
නුවරඑළිය	493	13.289
අනුරාධපුරය	457	15.147
පොළොන්නරුව	266	8.022
කුරුණෑගල	446	15.123
පුත්තලම	657	19.971
රත්නපුර	176	5.062
කෑගල්ල	181	5.315
වව්නියාව	287	11.234
යාපනය	1699	30.749
ත්‍රිකුණාමලය	424	12.909
අම්පාර	675	18.908
මඩකලපුව	593	16.651
එකතුව	**8393**	**234.378**



ආයෝජන රු. මිලියන දිස්ත්‍රික් මට්ටමින්
35
30
25
20
15
10
5
0
රු. මිලියන
කොළඹ
ගම්පහ
කළුතර
ගාල්ල
මාතර
හම්බන්තොට
මොණරාගල
බදුල්ල
මහනුවර
මාතලේ
නුවරඑළිය
අනුරාධපුරය
පොළොන්නරුව
කුරුණෑගල
පුත්තලම
රත්නපුර
කෑගල්ල
වව්නියාව
යාපනය
ත්‍රිකුණාමලය
අම්පාර
මඩකලපුව
දිස්ත්‍රික්කය



ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්
1800
1700
1600
1500
1400
1300
1200
1100
1000
900
800
700
600
500
400
300
200
100
0
ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව
කොළඹ
ගම්පහ
කළුතර
ගාල්ල
මාතර
හම්බන්තොට
මොණරාගල
බදුල්ල
මහනුවර
මාතලේ
නුවරඑළිය
අනුරාධපුරය
පොළොන්නරුව
කුරුණෑගල
පුත්තලම
රත්නපුර
කෑගල්ල
වව්නියාව
යාපනය
ත්‍රිකුණාමලය
අම්පාර
මඩකලපුව
දිස්ත්‍රික්කය

ආරම්භ කරන ලද ව්‍යාපෘති වර්ගීකරණය

ව්‍යාපෘතිය	ව්‍යාපෘති සංඛ්‍යාව
කිරිගව පාලනය	1973
එළු පාලනය	1023
ඌරු පාලනය	198
බිත්තර නිෂ්පාදන (පෝෂණ)	1914
බිත්තර නිෂ්පාදන (ව්‍යාපාර)	893
බ්‍රොයිලර් නිෂ්පාදනය	281
ගවගාල් සකස් කිරීම	640
කරදිය ධීවර නිෂ්පාදනය	996
මිරිදිය ධීවර නිෂ්පාදනය	183
විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය	56
ධීවර නිෂ්පාදන / කිරි ආශ්‍රිත නිෂ්පාදන	134
වෙනත්	102
එකතුව	**8393**



7.0 කර්මාන්ත අංශය.

සමෘද්ධිලාභී පවුල් සවිබල ගැන්වීම උදෙසා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදි කර්මාන්ත ව්‍යාපෘති සඳහා විශේෂ ස්ථානයක් හිමි වි ඇත . වර්තමාන තරගකාරි වෙළඳපොලට ගැලපෙන කාර්මික නිෂ්පාදනයන් සිදු කිරිමේදි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මෙන්ම ගෘහ කර්මාන්ත ද සංවර්ධනය කිරිම සඳහා අවධානය යොමු කරන ලදි .සමෘද්ධිලාභින් විසින් දැනටමත් ආරම්භ කර පවත්වාගෙන යන කර්මාන්ත ව්‍යාපෘතිවල පවත්නා අඩුපාඩු හා ගැටළු හඳුනා ගෙන වර්තමාන වෙළඳපලට ගුණාත්මක හා උසස් නිමාවෙන් යුක්ත නිෂ්පාදනයන් එක් කිරිමට කර්මාන්ත ව්‍යාපෘති වලට කර්මාන්තයට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබාදීම ප්‍රධාන අරමුණ කරගෙන 2010 කර්මාන්ත වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

2011 වර්ෂයේ දිවිනැගුම වැඩසටහන ජාතික වැඩසටහනක් ලෙස දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය. මෙම ජාතික වැඩසටහනේ ප්‍රධානතම අංශයක් ලෙස ගෘහස්ථ කර්මාන්ත ඒකක ඇති කිරීම වැදගත් ස්ථානයක් හිමිකර ගනී. ඒ අනුව යමින් සමෘද්ධිලාභි හා අඩුආදායම්ලාභී පවුල්වල පෝෂනය හා ආහාර සුරක්ෂිතතාව මෙන්ම ආර්ථික මට්ටම වර්ධනය කිරීම උදෙසා සමෘද්ධි අධිකාරියේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර්මාන්ත සංවර්ධන අංශය විශේෂ ස්ථානයක් හිමි කරගෙන ඇත.

තම නිවසේ සිටම ආර්ථික මට්ටම වර්ධනය කර ගැනීම උදෙසා වර්තමාන තරගකාරි වෙළඳපොලට ගැලපෙන කාර්මික නිෂ්පාදනයන් සිදු කිරිමට අවධානය යොමු කරන ලදි. සමෘද්ධිලාභින් විසින් දැනටමත් ආරම්භ කර පවත්වාගෙන යන කර්මාන්ත ව්‍යාපෘතිවල පවත්නා අඩුපාඩු හා ගැටළු හඳුනා ගෙන වර්තමාන වෙළඳපලට ගුණාත්මක හා උසස් නිමාවෙන් යුක්ත නිෂ්පාදනයන් එක් කිරිමට අවශ්‍ය තාක්ෂණික උපකරණ හා දැණුම ලබාදීම ප්‍රධාන අරමුණ කරගෙන මෙම වර්ෂයේ කර්මාන්ත වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

ගෘහස්ථ කර්මාන්ත ඒකක සංවර්ධනය කිරීම පෙරටු කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කල අතර දේශීය වෙළඳපොල අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සාම්ප්‍රදායික හා පාරම්පරික සුළු කර්මාන්ත ව්‍යාපෘති 14204 ට වැඩි සංඛ්‍යාවක් සංවර්ධනය කිරීමට කර්මාන්ත අංශය විසින් රුපියල් මිලියන 373.4 ක මූල්‍යමය දායකත්වයක් ලබා දී ඇත.

1. සුළු පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන

සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ විශේෂ උද්‍යෝගයක් හා උනන්දුවක් මෙම වසරේත් මෙම වැඩසටහනට දැකගත හැකි අතර නව තාක්ෂණික උපකරණ මිලදී ගෙන තම කර්මාන්තය වැඩි දියුණු කර ගැනීමටත් ශ්‍රමය වඩාත් වැඩියෙන් භාවිතා කරමින් ගෘහාශ්‍රිතව මෙම ව්‍යාපෘති පවත්වාගෙන යෑම මගින් ඔවුන්ගේ හා පවුලේ ආදායම් මට්ටම ඉහල නංවාගෙන ඇත.

දිවිනැගුම ජාතික වැඩසටහන හා සමගාමීව දිවයිනම ආවරනය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. සුළු හා කුඩා පරිමාණයේ කේවල ව්‍යාපෘති මේ යටතේ බහුලව සංවර්ධනය කිරිමට ආරම්භ කර ඇත. 2011 වසර තුළ මෙලෙස සංවර්ධනය කළ ව්‍යාපෘති ගණන 14,204 කි. වැය කරන ලද මුදල රුපියල් මිලියන 373.4 ක් වේ. මෙම වසරේ සංවර්ධන කල ව්‍යාපෘති වල සංයුතිය හා ඡයාරූප පහත පරිදි වේ.

- පැස්සුම් කර්මාන්තය
- වඩු කර්මාන්තය
- ඇඳුම් මැසීම
- කම්මල් කර්මාන්තය
- පෙදරේරු කර්මාන්තය
- ලාක්ෂා කර්මාන්තය
- ගඩොල් කර්මාන්තය
- ස්වර්ණාභරන හා මැණික් කර්මාන්තය
- සහල් සැකසුම් කර්මාන්තය
- මැටි ආශ්‍රිත නිෂ්පාදන
- කොහු ආශ්‍රිත නිෂ්පාදන
- අභ්‍යාස පොත් හා කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන
- වේවැල් හා පන් ආශ්‍රිත නිෂ්පාදන
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- සම් ආශ්‍රිත නිෂ්පාදන
- ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන
- ඇලුමිණියම් භාන්ඩ නිෂ්පාදනය
- පොල්තෙල් නිෂ්පාදනය
- හඳුන්කූරු/ පහන් තිර නිෂ්පාදන
- පැණි හකුරු/රස කැවිලි නිෂ්පාදනය
- කුළුබඩු හා ධාන්‍ය ඇඹරීම
- බේකරි කර්මාන්තය
- කාර්මික වැඩ

සුළු පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති දිස්ත්‍රික්ක මට්ටමින්

1	කොළඹ	843	25,992,631.65
2	ගම්පහ	2060	58,002,435.17
3	කළුතර	665	16,932,980.00
4	ගාල්ල	1166	30,459,396.92
5	මාතර	1064	24,627,780.16
6	හම්බන්තොට	834	12,580,071.34
7	මහනුවර	999	26,667,952.06

8	මාතලේ	548	14,895,926.36
9	නුවරඑළිය	316	7,735,961.50
10	කුරුණෑගල	706	18,796,135.97
11	පුත්තලම	282	8,767,696.00
12	අනුරාධපුරය	647	16,719,594.00
13	පොලොන්නරුව	163	4,285,587.62
14	බදුල්ල	193	4,129,061.24
15	මොණරාගල	147	4,133,951.55
16	රත්නපුර	972	26,307,984.43
17	කෑගල්ල	855	22,231,725.11
18	අම්පාර	282	7,589,453.33
19	ත්‍රිකුණාමලය	165	4,238,128.52
20	මඩකලපුව	273	17,885,398.53
21	වව්නියාව	87	2,797,469.50
22	යාපනය	937	17,588,003.63
	එකතුව	**14204**	**373,365,324.59**



සුළු පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති මට්ටමින්

අනු අංක	කර්මාන්තය	සංඛ්‍යාව
1	පැස්සුම් කර්මාන්තය	502
2	වඩු කර්මාන්තය	2916
3	ඇඳුම් මැසීම	2984
4	කම්මල් කර්මාන්තය	161
5	පෙදරේරු කර්මාන්තය	1201
6	ලාක්ෂා කර්මාන්තය	25
7	ගඩොල් කර්මාන්තය	996
8	ස්වර්ණාභරන හා මැණික් කර්මාන්තය	82
9	සහල් සැකසුම් කර්මාන්තය	271
10	මැටි ආශ්‍රිත නිෂ්පාදන	892
11	කොහු ආශ්‍රිත නිෂ්පාදන	787
12	අභ්‍යාස පොත් හා කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන	354
13	වේවැල් හා පන් ආශ්‍රිත නිෂ්පාදන	71
14	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන	621
15	සම් ආශ්‍රිත නිෂ්පාදන	119
16	ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන	41
17	ඇලුමිණියම් භාන්ඩ නිෂ්පාදනය	36
18	පොල්තෙල් නිෂ්පාදනය	47
19	හඳුන්කුරු/ පහන් තිර නිෂ්පාදන	146
20	ඉටිපන්දම් නිෂ්පාදනය	52
21	පැණි හකුරු/රස කැවිලි නිෂ්පාදනය	724
22	කුළුබඩු හා ධාන්‍ය ඇඹරීම	201
23	බේකරි කර්මාන්තය	327
24	කාර්මික වැඩ	648
	එකතුව	14204



8.0 අලෙවි සංවර්ධන අංශය

සමෘද්ධි වැඩ සටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් විසින් කරගෙන යනු ලබන විවිධ කර්මාන්ත, ධීවර හා සත්ත්ව පාලන සහ කෘෂි නිෂ්පාදනයන් අලෙවි කර ගැනීම සඳහා අවශ්‍ය අලෙවි පහසුකම් හා විවිධ සහායන් ලබාදීම හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපොලක් හා මිලක් ලබාදීම අලෙවි සංවර්ධන වැඩ සටහනේ මූලික අරමුණු වේ.

අලෙවි හා සේවා ව්‍යාපෘති සංවර්ධන වැඩසටහනේ මූලික පරමාර්ථ වන්නේ ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් ඉලක්ක කොටගෙන.

- දැනටමත් අලෙවි හා සේවා ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම හා චිරස්ථායී තත්ත්වයට පත් කිරීම.
- කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටින ඉහත පවුල්වල සාමාජිකයින් සඳහා අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ ලබාදීම තුලින් (මූල්‍යමය පහසුකම් සපයා) ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

එමෙන්ම ඉහත අරමුණ කරා ලඟා වීමට අවශ්‍ය මඟ පෙන්වීම හා වෙනත් සහාය සේවාවන් ලබා කරදීම තුලින් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා අතරමැදියන් අවමකරමින් සාධාරණ මිලක් ලබාදීම හා වර්තමාන වෙළඳපල රටාවට ගැලපෙන පරිදි නිෂ්පාදන බිහිකිරීම තුලින්, නව වෙළඳපලවල් කරා ඔවුන්ගේ නිෂ්පාදන යොමු කිරීමට සහාය වීමද සිදුකරනු ලබයි.

මෙම මූලික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් 2011 වර්ෂය තුලදී අලෙවි සංවර්ධන අංශය විසින් ගෘහස්ථ ආර්ථික ඒකක දශලක්ෂයක් ස්ථාපිත කිරීමේ දිවි නැගුම ජාතික වැඩසටහනට සමගාමීව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති/ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබාදී ඒවා කේෂ්ත්‍රය තුල ක්‍රියාත්මක කරන ලදී.

i **අලෙවි වැඩසටහන් :**
* ගෘහස්ථ අලෙවිසැල් සඳහා අවශ්‍ය උපකරණ
* සහල් වෙළඳාම සඳහා අවශ්‍ය උපකරණ
* ජංගම වෙළඳාම

ii **සේවා :**
* සැලුන් සඳහා උපකරණ
* චිත්කල් වැඩ සඳහා උපකරණ
* ආපන ශාලා /කේටරින් සේවා
* වාහන අළුත් වැඩියා
* වාහන සේවා මධ්‍යස්ථාන
* රූපලාවන්‍ය කටයුතු
* ගෘහස්ථ සේවා
* ළමා සුහසාධන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ලී බඩු හා උපකරණ
* සන්නිවේදන සඳහා අවශ්‍ය උපකරණ

2011 වර්ෂයේදී අලෙවි සංවර්ධන වැඩසටහන සඳහා රු:මි: 310.0 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කරතිබු අතර, සැලසුම් කල අලෙවි සංවර්ධන ව්‍යාපෘති හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 309.98 ක ප්‍රතිපාදන නිදහස් කරන ලදී. එහෙත් වර්ෂය

අවසානය වන විට ඉහත සඳහන් අලෙවි ව්‍යාපෘතින් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ප්‍රතිපාදන වලින් මිලියන 144.16 ක් වැය කොට අලෙවි හා සේවා ව්‍යාපෘති 7727 ක් ආරම්භ කර ඇත. මීට අමතරව සමෘද්ධි බැංකු සංගම් වල රඳවා ඇති චක්‍රීය අරමුදල් යොදවා අලෙවි හා සේවා ව්‍යාපෘති 2186 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු.මි. 61.32 ක් යොදවා ඇත.(ඇමුණුම් අංක 01)

පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුලදී ඉහත වර්ග කර ඇති පරිදි විවිධ අලෙවි වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් යොමුකොට එමඟින් ඔවුන් සාර්ථක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් බවට පත් කිරීමට සමෘද්ධි අලෙවි වැඩසටහන තුලින් ඵලදායී කාර්යභාරයක් ඉටුවී ඇති බව ක්ෂේත්‍රයෙන් ලබාගත් දත්ත අනුව පැහැදිලි වේ.

2011.12.31 දින වන විට ක්‍රියාත්මක කරනු ලැබූ අලෙවි හා සේවා ව්‍යාපෘති පහත දැක්වෙන අතර දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කර ඇති අලෙවි හා සේවා ව්‍යාපෘති වල වර්ගීකරණ වාර්තාව පහත දැක්වේ.

<u>දිවි නැගුම ජාතික වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළ සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආරම්භ කල අලෙවි හා සේවා ව්‍යාපෘති පිළිබඳ තොරතුරු</u>

ව්‍යාපෘති වර්ගය	ක්‍රියාත්මකකරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	ව්‍යාපෘති වර්ගය	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව
සිල්ලර අලෙවි සැල	2239	හාල් අලෙවි	195
ජංගම වෙළඳ ව්‍යාපෘති	791	මිරිදිය මත්ස්‍ය වෙළඳාම	32
ආපන ශාලා ව්‍යාපෘති	546	ලොතරැයි වෙළඳාම	25
කෘෂි ආම්පන්න අලෙවි	186	රූපලාවන්‍ය / මනාලියන් ඇන්දවීම	258
නිමි ඇඳුම් අලෙවි	235	සංනිවේදන මධ්‍යස්ථාන	168
වයරින් සේවා	66	චින්කල්	119
උපකරණ කුලියට දීම	73	තීන්ත ආලේපන / පින්තාරු	131
ඇඳුම් මැසීම	313	පැස්සුම් වැඩ	119
ලොන්ඩරි	05	රියදුරු පුහුණුව	7
ශබ්ද විකාශන යන්ත්‍ර	23	ටින්කරින්	78
ඡායා රූප ශිල්පය	68	මාළු වෙළඳාම	239
මල් පැල අලෙවිය	37	වාහන අළුත්වැඩියාව	161
පලතුරු හා එළවළු අලෙවිය	234	වෙනත් සේවා	1323
විසිතුරු භාණ්ඩ අලෙවි	56		
මුළු එකතුව			**7727**

ඉහත දක්වා ඇති සටහන් මඟින් ඒ ඒ ප්‍රධාන අලෙවි වැඩසටහන් යටතේ 2011 වර්ෂය තුලදී සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වූ සියළුම ග්‍රාම නිලධාරී වසම් වල ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් විසින් ක්ෂේත්‍රය තුල ව්‍යාපෘති ගන්වන ලද ආකාරය සහ ඒ සඳහා අලෙවි සංවර්ධන අංශය මඟින් සෘජුවම ලබාදෙන ලද මූල්‍ය දායකත්වය පිළිබිඹුවන අතර එයින් දිවයිනේ සමස්ථ ආර්ථික සංවර්ධනය සඳහා සමෘද්ධි අලෙවි වැඩසටහන තුලින් ලබාදී ඇති දායකත්වය පෙන්නුම් කෙරේ.

පසුගිය වර්ෂයේ දී මෙන්ම 2011 වර්ෂයේදී අලෙවි වැඩසටහන සඳහා වෙන්කර තිබූ මුදලින් වැඩි ප්‍රමාණයක් වැයකොට තිබුනේ සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩුආදායම්ලාභීන් විසින් පවත්වා ගෙන යනු ලබන කුඩා පරිමාණයේ ව්‍යාපාර සඳහා අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ ලබාදීම සඳහාය.

මේ යටතේ ජංගම වෙළඳ කුටි , පදික වෙළඳ කුටි, පාපැදි, වැනි ජංගම වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කටයුතු වැඩි දියුණුකර පවත්වාගෙනයාමට හා අළුතින් ආරම්භ කිරීම යටතේ ව්‍යාපෘති 791 ක් ද 2011 වර්ෂයේදී කැපීපෙනෙන ලෙස ක්‍රියාත්මක වූ අලෙවි වැඩසටහනක් බව දත්ත අනුව පැහැදිලි වේ.

එමෙන්ම සේවා ක්ෂේත්‍රයේ ව්‍යාපාති සඳහා ඉහල දායකත්වයක් ලබාදී ඇති බව සංඛ්‍යා ලේඛන වලින් පෙනේ. විශේෂයෙන් වර්තමාන වෙළඳපල තුල වැඩි නැඹුරුවක් හා ඉල්ලුමක් පවතින රූපලාවන්‍ය කටයුතු , සංනිවේදන මධ්‍යස්ථාන, උත්සව භාණ්ඩ සැපයීම හා කෑම සැපයීම , ඡායාරූප ශිල්පය පැස්සුම් වැඩ, ටින්කරින් වැඩ, උපකරණ කුලියටදීම, ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම, වැනි ව්‍යාපෘති සඳහා විශේෂ අවධානයක් යොමු කොට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා අවශ්‍ය මඟපෙන්වීම ලබාදීම තුලින් ඔවුන් සාර්ථක ව්‍යාපාරිකයන් බවට පත් කොට ඇත.

එමෙන්ම 2011 වර්ෂයේදී එක් දිස්ත්‍රික්කයක් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රු. 150000/- ක් පමණක් ලබා දෙමින් සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් වල සහායෙන් සෑම දිස්ත්‍රික්කයකම සාර්ථක ලෙස අලෙවි ප්‍රදර්ශන 22 ක් පැවැත් වීය. ඊට අමතරව දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගනු ලැබූ සාර්ථකම ව්‍යවසායකයින් හඳුනාගෙන මහනුවර බෝගම්භර ක්‍රීඩාංගනයේදී ජාතික මට්ටමේ අලෙවි ප්‍රදර්ශනය 2011දෙසැම්බර් 18,19 හා 20 තෙදින පුරා පවත්වන ලදී.

දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන -2011

අලෙවි හා සේවා අංශය

අවසන් කල ව්‍යාපෘති වල වර්ගීකරණය අනුව ප්‍රගතිය (සංඛ්‍යාත්මකව) 2011.12.31 දිනට

ව්‍යාපෘති වර්ගය	කොළඹ	ගම්පහ	කළුතර	ගාල්ල	මාතර	හම්බන්තොට	මහනුවර	මාතලේ	නුවරඑළිය	කුරුණෑගල	පුත්තලම	අනුරාධපුර	පොළොන්නරුව	කෑගල්ල	රත්නපුර	බදුල්ල	මොණරාගල	අම්පාර	ත්‍රිකුණාමලය	මඩකලපුව	වවුනියාව	යාපනය	එකතුව
සිල්ලර ඇලෙවිසැල්	95	187	192	328	196	56	133	41	122	79	42	93	62	236	167	30	22	36	19	42	38	23	2239
ජංගම වෙළඳ ව්‍යාපෘති	4	132	224	115	35	12		13	12	27	15	65	3	29	12	3	3	7	4	54		22	791
ආපන ශාලා ව්‍යාපෘති	11	50	25	84	4	32	48	47	8	16	3	87	9		6	41	6	2	1	9	10	47	546
කෘෂි ආම්පන්න අලෙවි				106		0					4				1			0				75	186
නිම් ඇඳුම් අලෙවි		11	50	14	55	11		2	16		12	12			12		1	0		28		11	235
වයරින් සේවා		29		5	4				1		12	3										12	66
උපකරණ කුලියට දීම		18		16	10	10		4			7	1	5		1		1						73
ඇඳුම් මැසීම	9	51		13	65	10					81	14	32		29			5	3		1		313
ලොන්ඩරි		5																					5
ශබ්ද විකාශන යන්ත්‍ර				6	2	1		2		2	5	1			1			0		3			23
ඡායාරූප ශිල්පය		15		7	6	1	3	1	3	1	7	2	20		2								68
මල්පැල අලෙවිය		17				1			10		6	1			1							1	37
පළතුරු හා එළවළු අලෙවි	95			6	20	8			10			41	5		19			1	3	26			234
විසිතුරු භාණ්ඩ අලෙවි		8						1		5	8	3			2		2					27	56
හාල් අලෙවිය	121			1								1			1		1	43		27			195
මිරිදිය මත්ස්‍ය වෙළදාම		2		2							25				1							2	32
ලොතරැයි වෙළදාම		3		5	12	1						2			2								25
රූපලාවන්‍ය / මනාලියන් ඇන්දවීම	18	47	22	29	15	2	20	10	6	19	18		10	19	11		2	1	2	3	4		258
සන්නිවේදන මධ්‍යස්ථාන		19		10		2		2				5		3	120		1	1	5				168
වින්කල්		15	28	13	5	5		2		9			2			2		11	3		24		119
තීන්ත ආලේපන / පින්තාරු		36	0	24	47	2				3	9	7	1		2								131
පැස්සුම් වැඩ		22	15	14	41	2					14	6	2		2					1			119
රියදුරු පුහුණුව															7								7
ටින්කරින්		2		15	14		6				31		9		1								78
මාළු වෙළදාම			89	14	31	5		4			28	43	3		1			18		3			239
වාහන අළුත්වැඩියාව		11		41	6	8	10	2	1	8	42	18	2		2		3	1		2	2	2	161
වෙනත් සේවා		23	173	341	33	7	73	1	15	83	105	57	13	207	146		6	24	1	7		8	1323
අවසන් කල මුළු ව්‍යාපෘති ගණන	**353**	**703**	**818**	**1209**	**601**	**176**	**293**	**132**	**204**	**252**	**474**	**462**	**178**	**494**	**549**	**76**	**48**	**150**	**41**	**205**	**79**	**230**	**7727**

අලෙවි සංවර්ධන වැඩසටහන 2011.12.31 දිනට

අනු අංකය	දිස්ත්‍රික්කය	නිදහස් කිරීම් රු.			අනුමත ව්‍යාපෘති		අවසන් ව්‍යාපෘති		පුහුණු/වැඩමුළු වෙනත් විශේෂ වැඩසටහන්	වැය කරන ලද මුළු මුදල (රු)	වක්‍රීය	
		ව්‍යාපෘති	පුහුණු	වැඩමුළු	සංඛ්‍යාව	මුදල රු.	සංඛ්‍යාව	මුදල රු.			සංඛ්‍යාව	මුදල
1	කොළඹ	19,794,381	65,000	778,572	677	19,794,381.00	353	8,267,470.00	727,289.00	8,994,759.00	77	1,263,766.00
2	ගම්පහ	42,021,515	65,000	1,470,000	2420	63,949,920.00	703	15,847,570.72	1,827,014.23	17674584.95	1,078	23,626,311.00
3	කළුතර	22,505,976	70,000	990,450	1019	20,730,000.00	818	8,762,584.80	819,296.70	9581881.30	380	11,710,000.00
4	ගාල්ල	31,115,150	150,680	1,135,000	1248	30,430,000.00	1,209	15,207,921.43	1,087,945.39	16295866.82		8,880,000.00
5	මාතර	21,554,739	880,000	730,000	693	16,130,000.00	601	12,119,223.23	788,344.48	12907567.71	124	1,674,090.00
6	හම්බන්තොට	7,966,950		848,125	368	7,380,500.00	176	3,690,525.49	729,683.00	4420208.49	123	2,247,413.31
7	මොණරාගල	1,336,800	3,300	489,000	50	1,278,517.00	48	1,102,019.02	514,448.00	1616467.02		
8	බදුල්ල	3,565,825	75,000	150,000	56	1,365,000.00	76	908,976.20	681,427.31	1590403.51		
9	මහනුවර	17,466,150	115,100	1,438,000	357	10,881,950.00	293	2,441,323.84	1,593,625.60	4034949.44	25	500,000.00
10	මාතලේ	8,074,000	205,000		252	8,074,000.00	132	1,642,661.54	655,843.10	2914960.16	97	2,493,633.00
11	නුවරඑළිය	6,485,200	50,000	669,900	334	7,865,500.00	204	5,580,563.31	630,124.00	6210687.31		
12	අනුරාධපුරය	11,265,900		932,000	511	10,390,881.00	462	8,693,835.95	705,964.30	9399800.25	16	451,916.00
13	පොළොන්නරුව	10,693,252	50,000	330,000	325	10,160,700.00	178	4,992,274.17	480,290.40	5472564.57	35	1,045,545.00
14	කුරුණෑගල	7,437,268	172,946	1,910,000	279	7,192,650.00	252	5,089,962.48	1,668,803.86	6758766.34	27	623,417.20
15	පුත්තලම	14,559,742	-	634,180	518	14,198,928.00	474	6,586,167.06	720,856.55	7307023.61	9	1,668,803.86
16	රත්නපුර	14,920,000	93,950	810,000	585	14,789,415.55	545	12,372,201.29	837,681.50	13209882.79		
17	කෑගල්ල	10,535,500	51,815	889,360	446	10,535,500.00	494	8,849,037.52	821,655.70	9670693.22		
18	වව්නියාව	3,440,400	52,575	205,525	107	3,440,400.00	79	2,320,400.00	252,625.00	2573025.00		
19	යාපනය	13,606,380	225,000		731	13,606,380.00	230	6,084,025.95	5,521,797.80	11605823.75		
20	ත්‍රිකුණාමලය	3,690,000	100,000		91	3,690,000.00	41	1,730,485.88	201,883.00	1932368.88		
21	අම්පාර	11,192,400	708,000		364	10,206,520.00	150	2,883,284.70	840,783.95	3724068.65	117	3,218,525.00
22	මඩකලපුව	8,566,451	222,450	418,000	292	8,566,451.00	205	6,354,032.39	630,745.00	6984777.39	78	1,918,091.00
	ප්‍රධාන කාර්යාලය							2,630,777.14	-	2630777.14		
	එකතුව	**291,793,979**	**3,355,816**	**14,828,112**	**11723**	**294,657,593.55**	**7,723**	**144,157,324.11**	**22,738,127.87**	**167,511,907.30**	**2,186**	**61,321,511.37**


ක්‍රියාත්මක කල අලෙවි හා සේවා ව්‍යාපෘති සංඛ්‍යාව
(වර්ගීකරණය අනුව)
2239
791
546
186
235
66
73
313
5
23
68
37
234
56
195
32
25
258
168
119
131
119
7
78
239
161
1323
සිල්ලර ඇලවිසැල්
ජංගම වෙලඳ ව්‍යාපෘති
ආපන ශාලා ව්‍යාපෘති
කෘෂි ආම්පන්න අලෙවි
නිමි ඇඳුම් අලෙවි
වයරින් සේවා
උපකරණ කුලියට දීම
ඇඳුම් මැසීම
ලොන්ඩරි
ශබ්ද විකාශන යන්ත්‍ර
ඡායාරූප ශිල්පය
මල්පැල අලෙවිය
පළතුරු හා එළවළු අලෙවි
විසිතුරු භාණ්ඩ අලෙවි
හාල් අලෙවිය
මිරිදිය මත්ස්‍ය වෙලදාම
ලොතරැයි වෙලදාම
රූපලාවන්‍ය / මනාලියන් ඇන්දවීම
සන්නිවේදන මධ්‍යස්ථාන
වින්කල්
තීන්ත ආලේපන / පින්තාරු
පැස්සුම් වැඩ
රියදුරු පුහුණුව
වින් කරින්
මාළු වෙලදාම
වාහන අළුත්වැඩියාව
වෙනත් සේවා

9.0 මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය.

වර්තමානය හා ආනාගතය යා කරමින් ජගත් තලයට පිවිසෙන මග පැහැබර වන්නේ දැනුම, කුසලතා හා ආකල්ප නිවැරදිව උකහා ගත් ඔබ තුලින් පමණි.

හැදින්වීම

මානව හිතවාදී දැයක් ගොඩනැගිමෙහිලා "මිනිසා හදා පවුල හදමු, පවුල හදා රට හදමු, රට හදා ලොව දිනමු" යන්න යථාවත් කිරීම සඳහා ගම් - නගර අතර වෙනසක් නොවී පොදු ජන සුභ සිද්ධිය තුලින් ආර්ථික සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ මිනිසෙකු ලොවට ගෙන ඒම සඳහා නොබිඳුනු දම්වැලක් ලෙසින් සවිය ලබාදෙන සමෘද්ධි ව්‍යාපාරයේ නියමුවන්ගේ දැනුම් පිපාසාව සංසිඳවන්නට මානව සම්පත් සංවර්ධන අංශය ඉමහත් වෙහෙසක් ගනු ලැබීය. නිමේෂයකින් වෙනස් වන විශ්වතලය තුළ අපගේ නිලදරුවන් නොපසුබටව ඉදිරියට යාම සඳහා තාක්ෂණ ඥාණය සහ විෂය දැනුම අතින් අඛණ්ඩ පෝෂණය ලබාදිය යුතුය. මේ සඳහා මානව සම්පත් සංවර්ධන අංශය විසින් හඳුනාගත් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දේශීය හා විදේශීය දැනුම, අත්දැකීම් හා පළපුරුද්ද ලබා ගැනීමට මංපෙත හෙලිකර දී ඇත. ඒ තුලින් ක්‍රියාශීලි සහ නිර්මාණශීලි නිලදරුවන් බිහි කිරීමට සමත් වීමු. එය ජාතියේ දුගීබව තුරන් කිරීම සඳහා විවිධ ප්‍රවේශ මාර්ග බිහි කිරීමට ශක්තියක් විය. වසර 30 ක කටුක අත්දැකීම් හා මානසික වහල් බවින් තෙරපී සිටි අපේම ජන කොටසක් වෙත දයාබර වී යහපත් පවුල් පසුබිම් ගොඩ නගන්නට හා සමස්ථ ජාතියම වේගවත් සංවර්ධනය සඳහා ඔසවා තබන්නට අපගේ නිලදරුවන් සාමුහිකව දරන උත්සාහය දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය තුලින් පරිපූර්ණ කරනු ලැබුයේ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මානව සම්පත් සංවර්ධන අංශයයි. ඒ සඳහා අප විසින් ප්‍රමුඛ සංරචකයන් කිහිපයක් ඔස්සේ නිලදරුවන් හැසිරවනු ලැබීය.

කාර්ය භාරය

01. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනිම හා පුහුණුව පිළිබඳ සැලසුම් කිරීම හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

02. විදේශ ශිෂ්‍යත්ව සඳහා නිලධාරීන් තෝරා ගැනිම හා යොමු කිරීම.

03. සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම්වලට අයත්, ඉඩම් අත්පත් කර ගැනීම.

04. අංශයට අදාලව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන සඳහා මාසික කාර්තුමය හා වාර්ෂික පුරෝකථන වාර්තා සකස් කිරීම හා ඊට අදාල ප්‍රගති වාර්තා සකස් කිරීම හා ප්‍රගතිය පිළිබඳ මැන බැලීම.

05. සමෘද්ධි නිලධාරීන්ගේ වැඩිදුර අධ්‍යාපන පුහුණු අවස්ථා වැඩි දියුණු කිරිම.

06. තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම.

07. ගෘහ ආර්ථික සංවර්ධනය පිලිබඳ පුහුණු වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කිරීම.

2011 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන

වෙන්කරන ලද මුදල සහ වියදම			
අනු අංකය	වැඩසටහන	වෙන් කල ප්‍රතිපාදන රු.මිලියන	වියදම රු.මිලියන
1	ආකල්ප හා කාර්ය සාධන සංවර්ධනය	5.00	4.885
2	සමෘද්ධි නිලධාරීන්ගේ වැඩිදුර අධ්‍යාපන පුහුණු අවස්ථා	5.00	7.255
3	තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම හා කුසලතා සංවර්ධනය	3.00	3.469
4	සමෘද්ධි අධිකාරියේ වත්කම් සහිත ඉඩම් වල නීත්‍යානුකූල සන්තකය ලබා ගැනීම	3.00	2.794
5	ගෘහ ආර්ථික සංවර්ධනය පිලිබඳ පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම.	4.00	1.265
එකතුව		20.00	19.668



දිළිඳුකම පිටුදැකීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව ඉටුකර ගැනීමට අවශ්‍ය දියුණු කාර්යාල පද්ධති හා වෘත්තීක සංවර්ධනයක් ලඟාකර ගැනීමත්, අධිකාරියේ දර්ශනය හා මෙහෙවර අපේක්ෂිත පරිදි ඉටුකර ගැනීමට හැකියාව ඇති දැනුම හා කුසලතා සපිරි නිලධාරීන් පිරිසක් ඇති කිරීමත්, අධිකාරියේ කාර්යය හා බලතල මනා ලෙස කළමණාකරණය කරගැනීමත්, දිළිඳුකම අවම කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කොට භාවිතා කිරීමත්, අධිකාරියේ කාර්යභාරය නූතන තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පීය ක්‍රම අනුව කළමනාකරණය කිරීමත්, සමෘද්ධි අධිකාරියේ ප්‍රතිපාදන වලින් ඉදිකර ඇති සමෘද්ධි බැංකු හා මහා සංගම් පිහිටි ඉඩම්වල නිරවුල් හිමිකම ලබාගැනීමත් සමෘද්ධි අධිකාරියේ ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම යනාදී වැඩසටහන් ගෘහ ආර්ථික සංවර්ධනය පිලිබඳ වැඩසටහන් සංවිධානය කිරීමත් මානව සම්පත් අංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස හැදින්විය හැක.

පුහුණු වැඩසටහන්

දුගී බව පිටුදැකීමෙහිලා ක්‍රියාත්මක වන දැවැන්ත වැඩ සටහනක නියුක්ත වන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහලනංවාලීම සඳහාත් ඔවුන්ව අභිප්‍රේරණය කිරීම සඳහාත් ඔවුන්ගේ දැනුම කුසලතා වැඩිකිරීම සඳහාත් විෂයානුබද්ධ දැනුම වර්ධනය කළහැකි සහ අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදිය හැකි පාඨමාලා හා පශ්චාත් උපාධි, ඩිප්ලෝමා වැනි පාඨමාලා හඳුන්වාදීම මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයෙන් සිදු කර ඇත. ජාතික මට්ටමේ පුහුණු වැඩ සටහන්, දිස්ත්‍රික් මට්ටමේ පුහුණු වැඩ සටහන් සහ ප්‍රාදේශීය මට්ටමේ පුහුණු පාඨමාලා ලෙස මෙම වැඩසටහන් කොටස් තුනකට බෙදා වෙන් කරමින් මෙම නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙම අංශය මගින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. නවීන තාක්ෂණය ගමට ගෙනයාමේ මහින්ද චින්තන වැඩසටහනට සමගාමීව වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධව මූලික පරිගණක පුහුණුව ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සඳහා ලබාදෙනු ලැබීය. එහිදී විද්‍යුත්තැපැල, අන්තර්ජාල පහසුකම් භාවිතා කිරීම පිළිබඳව එම නිලධාරීන් දැනුවත් කරන ලදි. මීට අමතරව විදේශ ශිෂ්‍යත්ව ලබාදෙමින් නිලධාරීන්ගේ දැනුම කුසලතා ආකල්ප හා අත්දැකීම් හුවමාරු කර ගැනීමට දිස්ත්‍රික් මට්ටමේ විශේෂ දක්ෂතා දැක්වූ නිලධාරීන්ට අවස්ථාව ලබා දෙන ලදි එහිදී ඉන්දියාව, ඊශ්‍රායලය, පකිස්ථානය, ඔස්ට්‍රියාව, ජපානය, තායිලන්තය, බංගලාදේශය ඕස්ට්‍රේලියාව සහ ඉන්දුනීසියාව යන රටවල් වල දිළිඳුකම පිටුදැකීමේ ශිල්ප ක්‍රම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අරමුණින් විදේශ ශිෂ්‍යත්ව ලබාගැනීමට නිලධාරීන්ට අවස්ථාව ලැබුණි.

"දිවිනැගුම" වැඩසටහනට අවශ්‍ය නිලධාරීන්ගේ දැනුම පෝෂණය කරමින් එම නිලධාරීන් මඟින් දිස්ත්‍රික් මට්ටමින් ගෘහ ආර්ථික සංවර්ධනය පිලිබද පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම.

තොරතුරු සන්නිවේදන තාක්ෂණික දැනුම කුසලතා සංවර්ධනය

	දිස්ත්‍රික්කය	වියදම (රු)
1.	කොළඹ	36,520.00
2.	ගම්පහ	14,750.00
3.	කළුතර	17,400.00
4.	ගාල්ල	11,050.00
5.	මාතර	14,700.00
6.	හම්බන්තොට	14,550.00
7.	මහනුවර	31,000.00
8.	මාතලේ	15,600.00
9.	නුවරඑළිය	12,000.00
10.	කුරුණෑගල	32,950.00
11.	පුත්තලම	25,050.00
12.	අනුරාධපුරය	15,050.00
13.	පොළොන්නරුව	6,000.00
14.	බදුල්ල	26,800.00
15.	මොණරාගල	7,350.00
16.	රත්නපුරය	19,650.00
17.	කෑගල්ල	14,550.00
18.	අම්පාර	12,550.00
19.	මඩකළපුව	28,950.00
20.	යාපනය	20,750.00
21.	ප්‍රධාන කාර්යාලය	3,091,667.00
එකතුව		**3,468,887.00**

සමස්ථ දිවයින පුරා ව්‍යාප්තව පවතින සමෘද්ධි බැංකු සංගම් ජාලගත කිරීමෙදි පැන නගින ගැටළු විසදීම සඳහා සමෘද්ධි නිලධාරීන් අතරන් පරිගණක දෘඩාංග දැනුම සහිත පිරිසක් පුහුණු කර ගැනීම වෙනුවෙන් සියළු දිස්ත්‍රික් නියෝජනය වන ලෙස සමෘද්ධි නිලධාරීන් 168 දෙනකු ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පුහුණු කර ගැනීම සඳහා මාස 06ක පාඨමාලා ගාස්තු ලෙස රු: 2,016,000ක් ද e Samurdhi වැඩසටහන යටතේ ලංකාව පුරා සෑම දිස්ත්‍රික්කයකම දත්ත පරිගණකගත කිරීම සඳහා සමෘද්ධි කාර්ය මණ්ඩලය අතරින් තෝරාගත් නිලධාරීන් 577ක් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පාඨමාලා ගාස්තු ලෙස වැය කල රු 807,800ක වියදම ද ප්‍රධාන කාර්යාලීය වියදම් යටතට ඇතුලත්ව ඇත

ගෘහ ආර්ථික සංවර්ධනය පිලිබඳ පුහුණු වැඩ සටහන්.

දිස්ත්‍රික්කය		වියදම (රු)
1.	මාතර	5,000.00
2.	මහනුවර	5,000.00
3.	කුරුණෑගල	630,000.00
4.	ප්‍රධාන කාර්යාලය	625,359.00
එකතුව		**1,265,359.00**



සමෘද්ධි නිලධාරීන්ගේ වෘත්තීය අධ්‍යාපන පුහුණු අවස්ථා

දිස්ත්‍රික්කය		වියදම (රු)
1.	කොළඹ	81,200.00
2.	ගම්පහ	268,850.00
3.	කළුතර	166,500.00
4.	ගාල්ල	442,250.00
5.	මාතර	233,500.00
6.	හම්බන්තොට	259,000.00
7.	මහනුවර	317,250.00
8.	නුවරඑළිය	40,000.00
9.	කුරුණෑගල	303,900.00
10.	පුත්තලම	237,250.00
11.	අනුරාධපුරය	193,550.00
12.	පොළොන්නරුව	25,000.00
13.	බදුල්ල	467,500.00
14.	මොණරාගල	50,000.00
15.	රත්නපුරය	137,250.00
16.	කෑගල්ල	60,500.00
17.	අම්පාර	206,500.00
18.	ත්‍රිකුණාමලය	50,000.00
19.	යාපනය	368,800.00
20.	ප්‍රධාන කාර්යාලය	3,346,000.00
එකතුව		**7,254,800.00**

වර්ෂ 2011 දී මානව සම්පත් අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ වෘත්තීය අධ්‍යාපන පුහුණු අවශ්‍යතා යටතේ සමෘද්ධි බැංකු නිලධාරීන් සඳහා කළමණාකරන මට්ටමේ වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනය මගින් බැංකු මූල්‍ය කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සහ බැංකු මූල්‍ය කටයුතු පිළිබඳ සහතික පත්‍ර පඨමාලාව සඳහා සමෘද්ධි නිලධාරීන් 40 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 1.952 ක් එම ආයතනය වෙත ලබාදී ඇත. එම පාඨමාලා අවසන් කිරීමෙන් පසු සෑම දිස්ත්‍රික්කයකටම වනසේ සමෘද්ධි බැංකු කටයුතු අධීක්ෂණය කිරීම සඳහා එම කණ්ඩායම යොදවනු ඇත. එම නිසා මෙය ඉතා වැදගත් මූල්‍ය ආයෝජනයක් ලෙස සලකනු ලැබේ. මෙම ප්‍රතිපාදන ප්‍රධාන කාර්යාලය මගින් ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනය වෙත සෘජුවම ලබාදී ඇති නිසා 2011 වර්ෂයට අදාලව මානව සම්පත් අංශය මගින් කරනු ලැබූ ප්‍රධාන කාර්යාලීය වියදමක් ලෙස සටහන් කොට ඇති බව සඳහන් කරමු.

ආකල්ප හා කාර්ය සාධන සංවර්ධනය

දිස්ත්‍රික්කය		වියදම (රු)
1.	කොළඹ	23,000.00
2.	ගම්පහ	23,000.00
3.	කළුතර	23,000.00
4.	ගාල්ල	23,000.00
5.	මාතර	23,000.00
6.	හම්බන්තොට	23,000.00
7.	මාතලේ	23,000.00
8.	මහනුවර	23,000.00
9.	නුවරඑළිය	99,900.00
10.	කුරුණෑගල	42,200.00
11.	පුත්තලම	71,500.00
12.	අනුරාධපුරය	160,590.00
13.	පොළොන්නරුව	23,000.00
14.	බදුල්ල	23,000.00
15.	මොණරාගල	23,000.00
16.	රත්නපුරය	23,000.00
17.	කෑගල්ල	23,000.00
18.	අම්පාර	70,500.00
19.	ත්‍රිකුණාමලය	178,545.00
20.	වව්නියාව	23,000.00
21.	යාපනය	23,000.00
22.	මඩකළපුව	60,530.00
23.	ප්‍රධාන කාර්යාලය	3,856,543.00
එකතුව		**4,885,308.00**

සමෘද්ධි අධිකාරියේ වත්කම් සහිත ඉඩම් වල නීත්‍යානුකූල සන්තකය ලබා ගැනීම.

	දිස්ත්‍රික්කය	වියදම (රු)
1.	කොළඹ	531.00
2.	මාතර	14,433.00
3.	හම්බන්තොට	944,000.00
4.	මහනුවර	1,070,000.00
5.	අම්පාර	765,000.00
එකතුව		**2,793,964.00**



10.0 මහ සංගම් අංශය

අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක සමෘද්ධි වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් වඩාත් ඵලදායී සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහාත්, ප්‍රාදේශීයව පිහිටුවා ඇති ප්‍රජා සංවිධාන ව්‍යුහයන්ට නායකත්වය ලබා දීම සඳහාත් පිහිටුවා ඇති මහ සංගම් නිසි පරිදි මෙහෙයවීම මහ සංගම් අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

දිළිඳුකම ජය ගැනීමට සංවිධාන ගතවූ නිර්මාණශීලී ප්‍රජාවක් උදෙසා කුඩා කණ්ඩායම්, ගම්මාන සමිති ඇතුළු ප්‍රාදේශීය ප්‍රජා ව්‍යුහයන්ට නිර්මාණශීලී දායකත්වය සපයමින් ප්‍රජා සංවිධාන ව්‍යුහය දිරිමත් කරමින් එම ව්‍යුහයන් ශක්තිමත්ව හා අර්ථවත්ව පවත්වාගෙන යන අඩු ආදායම්ලාභීන්ගේ ක්‍රියාදාමය සක්‍රීයව මෙහෙයවීම.

කාර්ය භාරය :-

1. අඩු ආදායම්ලාභීන්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා හා ව්‍යාපෘති ක්‍රියාවලිය ශක්තිමත්ව පවත්වාගෙන යාමට සුදුසු ආයතනික ව්‍යුහයක් ගොඩනැගීම.
2. සමෘද්ධි කුඩා කණ්ඩායම්, ග්‍රාමීය සමිති ඇතුළු ප්‍රාදේශීය ප්‍රජා සංවිධාන ව්‍යුහයන් ශක්තිමත් කිරීම
3. අඩු අදායම්ලාභීන්ගේ සමූහ ක්‍රියාකාරකම් හා ආර්ථික ක්‍රියාකාරකම් තුලින් (වෙළඳ පල, තාක්ෂණය) පුළුල් කිරීමට මග පෙන්වීම
4. අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය දායක වන කාර්යක්ෂමව තොරතුරු හුවමාරු පද්ධතියක් මහ සංගම් මට්ටමින් ගොඩනැගීම.

ප්‍රධාන වැඩසටහන්

1. ප්‍රජා සංවිධාන ජාලය ශක්තිමත් කිරීම
2. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
3. මහ සංගම්වල ආයතනික සංවර්ධනය
4. I. නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය
   II. බලංගොඩ සමනලවැව පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය

මහ සංගම් අංශයේ ප්‍රධාන වැඩසටහන් සාක්ෂාත් කර ගැනීමට ගත් ක්‍රියා මාර්ග පහත පරිදිය.

1. ප්‍රජා සංවිධාන ජාලය ශක්තිමත් කිරීම.

සමෘද්ධි වැඩසටහනේ බිම් තලයේ ඇති ශක්තිමත් ඒකකයක් ලෙස 2006 වසරේ සිට 2011 වසර දක්වා ගොඩ නගන ලද කුඩා කණ්ඩායම් 242669 ප්‍රමාණයක් වේ. බැංකු සංගම් ක්‍රියාවලිය හා බැංකු සංගම්හි ණය ලබාදීමේ පදනම ශක්තිමත්ව පවත්වා ගැනීමට මෙම කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය හා සමෘද්ධි සමිති ඉතාමත් ශක්තිමත් වේ. ප්‍රජාව හා බැඳුණු මහ සභා වාර්ෂික නිලවරණ, විධායක කමිටු, සම්මේලන පවත්වා ප්‍රජාව බලගැන්වීමේ හා තීරණ හැකියාව ඔවුන් වෙත පැවරීම සිදුකෙරේ. 2011 වසරේ මෙම ප්‍රජා නියෝජිතයන් පුහුණු කිරීම සඳහා රු. මිලියන 2 මුදලක් වැයකර ඇත.

2. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්

සමෘද්ධි වැඩසටහන තුලින් ගමෙන් සැගවී යන ව්‍යවසායකත්ව හැකියාව ජාතික තලයට කැදවාගෙන ඒමට දරණ මහ පරිශ්‍රමයකි. එය විවිධ පැතිකඩ ඔස්සේ සැගවුණු ව්‍යවසායකත්ව හැකියාව මතුකර ගැනීමට දරණ නොපසුබට උත්සාහයකි. එනම් බැංකු සංගම් හරහා ණය ක්‍රියාවලියට අනුගතවූ දිරිය මිනිසුන් ප්‍රාදේශීය, දිස්ත්‍රික්, හා ජාතික තලය දක්වා ගමන් කරවීම මග පාදන්නක් ලෙස "විස්කම් උදානය" සෑම වසරකදීම දිළිදුකම පිටුදැකීමේ දිනයට සමගාමීව පැවැත්වේ.

එපමණකුදු නොව ප්‍රාදේශීය තලයෙන් මතුවන අති දක්ෂ ව්‍යවසායකයින් දිස්ත්‍රික් තලයටත් සමස්ත දිස්ත්‍රික්ක 25 හා තේරී පත්වුවන් ජාතික තලයටත් පැමිණ අවසානයේ 250 පමණ ඉතා දියුණු මට්ටමේ අති දක්ෂ ව්‍යවසායකයින් ලෙසින් පිරිසක් විස්කම් උදානය ඔස්සේ හදුනා ගැනේ. 2011 වර්ෂයේ ජාතික ව්‍යවසායකත්ව සංසදයට මෙවැනිම පිරිසක් මහ සංගම් අංශයෙන් බිහිකර ඇත.

එමෙන්ම ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියත් යුනිලීවර් ආයතනයත් ඒකාබද්ධව ද රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මට්ටමින් ද රැකියා නොමැති සමෘද්ධි ප්‍රතිලාභීන් සෞභාග්‍යා ස්වයංරැකියා ව්‍යාපෘති තුලින් පමණක් 3000 කට අධික කාන්තාවන් පිරිසක රැකියා අවස්ථා උදාකරදී ඇත. එමෙන්ම එම කාන්තාවන්ගේ දක්ෂ දරුවන්ට වාර්ෂික ශිෂ්‍යත්ව 300 ක් සෑම වසරකදීම ලබාදීම සිදු කෙරේ. එම එක් ශිෂ්‍යත්වය වාර්ෂික වටිනාකම රු. 30000 කි. මීට අමතරව සෞභාග්‍යා අධික්ෂණ නිලධාරීන් 41 දෙනෙකු වැඩ පරීක්ෂක වරුන්සේ වෙළද නියෝජිත තනතුරු ලබාදී ඇත.

3. මහ සංගම් ආයතනික සංවර්ධනය

මහ සංගම් 317 ක් මේ වන විට දිවයින පුරා පිහිටුවා ඇති අතර ඒවායේ ආයතනික ක්‍රියාවලියක් ශක්තිමත් කරවීම උදෙසා තම සන්නිවේදන අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස අන්තර්ජාල පහසුකම් ලබාදී ඇත.

201101/31 සිට 2011/12/30 දක්වා මහ සංගම් උපකරණ ලබාදීමේ ප්‍රගතිය

උපකරණය	සංඛ්‍යාව	මුදල (රු)
පරිගණක	24	1,755,447
කාර්යාලීය උපකරණ	16	2,117,909
විදුලිය සැපයීම්	1	14,250
ෆැක්ස්	5	83,269
මහ සංගම් නාම පුවරු	3	39,830
ඡායා පිටපත්	38	2,653,307
ජලය	1	23,220

තවද තම මහ සංගම් අරමුදල් වලින් (මුල් අවස්ථාවේ පිහිටුවාගත් මහ සංගම් සඳහා) ණයා පිටපත් 41 ක් ප්‍රාක්ෂේපන යන්ත්‍ර 17 ක් ලැප්ටොප් පරිගණක 12 ක් ඩෙක්ස්ටොප් පරිගණක 16 ක් මිලදී ගැනීමට අවස්ථාව හා අනුමැතිය ලබාදී ඇත.

4. පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය

නිල්ලඹ හා බලංගොඩ සමනලවැව පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය මගින් 120 ක පිරිසක් සඳහා නිල්ලඹ පුහුණු මධ්‍යස්ථාන නේවාසික පහසුකම් යටතේ 135 ක පිරිසක් සමනලවැව පුහුණු මධ්‍යස්ථානයෙත් නේවාසික පහසුකම් යටතේ පුහුණුව ලබාදීමේ හැකියාවක් ඇත. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බොහෝමයක් නේවාසික පුහුණු වැඩසටහන් මේ යටතේ සේවය ලබාගනු ඇත. එමෙන්ම පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනයට භූමි අක්කර 1 ක ගම්මිරිස් වගාවක්, අක්කර 02 ක තේ වගාවක් සිදුකර ඇත. නිල්ලඹ කිරිගව ව්‍යාපෘතියක් හා සමනලවැව පුහුණු මධ්‍යස්ථානයේ මී මැසි පාලන ව්‍යාපෘතියක් ආරම්භක ක්‍රියාත්මක කෙරේ.

මීට අමතරව භූමි අලංකරණ කටයුතු ජල කළමණාකරණ පද්ධතිය සුව පහසු පිරිමි හා කාන්තා නේවාසිකාගාර, වැසිකිළි හා නාන කාමර පද්ධති ඉදිකර ඇත.

නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යසථානය සඳහා රු. 8,426,685/
සමනලවැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය සඳහා රු. 1,435,276/

ඉහත මුදල වැය කොට එම ස්ථාන ස්ථානගත හා ප්‍රතිසංස්කරණය කර ඇත.

11.0 සමාජ සංවර්ධන අංශය

සමාජ සංවර්ධනය යනු සමාජයේ සියලුම අංශවල ඇති වන සංවර්ධනයයි . සමස්ථ සමාජයේ ආධ්‍යාත්මික සංවර්ධනය අතින් පිරිපුන් පවුල් පරිසරයක් ඇති කිරීම මූලික අදහස වේ .

පසුබිම

- සියළු අවාසි සහගත සමාජ කොටස්වල සමාජීය වටිනාකම ඉස්මතු කිරීමට කටයුතු යෙදීම
- දිළිඳුකමට මුලසාධක වන සමාජීය හේතු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම.
- අඩු ආදායම්ලාභීන්ගේ සමාජීය හා සංස්කෘතික අගයන් වැඩි කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වර්තමාන කාර්යය භාරය :-

ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාජ සංවර්ධන අංශයට මිලියන 366.3 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන 2011 වර්ෂය තුළ ලැබී ඇත.

2011 වර්ෂයේ ජාතික වැඩසටහන වූ දිවි නැගුම වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් අතුරින් ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන් ඉහත මුදල් යොදා ගෙන දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සමාජ සංවර්ධන අංශය සැලසුම් කරනු ලැබීය.

සමාජ සංවර්ධන වැඩසටහන ප්‍රධාන කොටස් තුනකි.

01. ආධ්‍යාත්මික සංවර්ධනය හා සමාජ සංවර්ධනය
02. දිරිය පියස නිවාස වැඩසටහන (අඩු ආදායම්ලාභී / ආබාධිත)
03. ආදර්ශ ගම්මාන වැඩසටහන.

01. ආධ්‍යාත්මික සංවර්ධනය හා සමාජ සංවර්ධනය

1.1. ආධ්‍යාත්මික සංවර්ධනය

- පූජනීය ස්ථාන වටා ප්‍රජාව ඒකරාශි කිරීම.
- දහම් පාසැල් ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආගමික හා සංස්කෘතික කටයුතු, ශ්‍රමදාන, ඔසු උයන් නිර්මාණය කිරීම, දේශීයත්වයට හුරු කිරීම.
- පොදු දේපල නිවැරදි ලෙස පරිහරණය හා අපට අයත් අපේ දෑ සුරැකීමේ වැඩසටහන.

✸ මේ අනුව වර්ෂයේදී ආධ්‍යාත්මික සංවර්ධනය හා සාරධර්ම නගා සිටුවීමේ වැඩසටහන් 62040 ක් ක්‍රියාත්මක කළ අතර, මේ සඳහා වැය වුණු මුළු මුදල රුපියල් මිලියන 0.2 කි.

1.1.1. මත් හා දුම්වැටි නිවාරණ වැඩසටහන

- අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල අභියෝගයක් වූ මත් හා දුම්වැටි භාවිතයෙන් සිදුවන ආර්ථික හා සමාජීය විනාශය පිළිබඳව දැනුවත් කරමින් මතින් තොර සාරධර්ම පිරි ගමක් ස්ථාපිත කිරීම මූලික අරමුණ විය.

  පසුගිය වර්ෂයන්හි ජාතික මට්ටමින් ක්‍රියාත්මක වූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ප්‍රවර්ථන වර්ෂයේදී තවදුරටත් වැඩි දියුණු කරමින් ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රාදේශීය හඳුනා ගන්නා ලද වැඩසටහන්ද ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවට නංවා ඇත.

1.2.1 මත් ද්‍රව්‍ය භාවිතය, සැපයීම ඉල්ලුම් හා ආකල්ප පිළිබඳ (පවතින තත්වය) තොරතුරු එකතු කර විග්‍රහ කිරීම.

1.2.2 ළමා හා තරුණ කණ්ඩායම් ඵලදායි මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම හා ආකර්ශණය අඩු කිරීමේ ක්‍රියාකාරකම්.

1.2.3. ප්‍රජාව තුළ මධ්‍යසාර භාවිතා කරන්නන්ගේ අසාධාරණ හැසිරීම්වලට ඉඩ නොදෙන ක්‍රියාකාරකම්
ළමා, කාන්තා දැනුවත් කිරීම්.
ළමා, කාන්තා, වැඩිහිටි හා තරුණ කණ්ඩායමක් ඒ වෙනුවෙන් සකස් වී ක්‍රියාත්මක වීම.

1.2.4 ළමුන් ඉලක්ක කර ක්‍රියාත්මක වන ප්‍රචාරණ හා අනෙකුත් බලපෑම්වලට විරුද්ධව ක්‍රියාත්මක වන දෙමව්පිය කණ්ඩායම් නිර්මාණය කිරීම.

1.2.5 මධ්‍යසාර හා දුම්වැටි හා වෙනත් මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් නිදහස් කර ගැනීමේ වැඩසටහන්.

- ප්‍රජා පාදක ප්‍රතිකාරක උපදේශන වැඩසටහන්.
- ප්‍රතිකාර මධ්‍යස්ථාන හෝ ස්ථානවලට යොමු කිරීම.

1.2.6 දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත සාර්ථකව ක්‍රියාත්මක කර වීමට ප්‍රජාව තුළින් බලපෑම් ඇති කිරීම.

1.2.7 දුම්වැටි භාවිතය හා ප්‍රචාරය අධෛර්යමත් කරන වෙළඳසැල් ඇති කරන ක්‍රියාකාරකම්.
වෙළඳසැල් හිමියන් සමඟ පනතේ ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡා කිරීම.
සමාගමට බලපෑම් කළ හැකි පරිදි වසමකට අදාළ වෙළඳ සංගම් දැනුවත් කිරීම.

✷ ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා **මිලියන 5.4 ක්** වියදම් කර ඇත.
ප්‍රගතිය පහත පරිදි වේ.

	වර්ෂය		
	2009	**2010**	**2011**
මත්භාවිතයෙන් මුදාගත් පුද්ගලයින්	14895	24154	20385
දුම්වැටි අලෙවිය නතර කළ කඩ සංඛ්‍යාව	6750	7664	7560
දුම්වැටි භාවිතයෙන් මුදාගත් සංඛ්‍යාව	16750	22352	22100

1.1.2. සමාජීය හා සංස්කෘතික අගයන් වැඩිදියුණු කිරීම (තරුණ /ළමා සමාජ/ ස්වේච්ඡා කණ්ඩායම්)

1.3.1 යහගුණ පිරි සරල ජීවන රටාවකට හුරු පුරුදු කිරීම.

- සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර, ආහාර පුරුදු, ඇඳුම් පැලඳුම් හා මංගල අවමංගල උත්සව ආදී...

1.3.2 ගර්භණී මාතාවන් සඳහා වූ විශේෂ වැඩසටහන්.

- උපදේශන, ආධ්‍යාත්මික වැඩසටහන්, දරු නැලවිලි ගී, පැල සිටුවීම් ආදී ...

1.3.3 ශාරීරික හා මානසික සුවය ලබා ගැනීමට පෙළඹවීම හා මග පෙන්වීම.

- ධර්ම සාකච්ඡා කණ්ඩායම් සාකච්ඡා.
- ධර්ම දේශනා
- දාන ශීල භාවනාමය වැඩසටහන්.

1.3.4 සියදිවි හානිය අවම කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම.

1.3.5 නිවැරදි පෝෂණය නිරෝගිව සිටීම හා කායික යෝග්‍යතා වර්ධනය.

1.3.6 අවුරුදු 19-30 යෞවනයන් සඳහා

- රස වින්දන, නායකත්ව, ක්‍රීඩා, සරල දිවි පැවැත්මට හුරු කිරීම සහ සිතුවිලි ඇති කිරීම, වෘත්තීය මාර්ගෝපදේශනය, යහපත් විවාහයට සූදානම් කිරීම

1.3.7 සරල රස වින්දන මාර්ග ප්‍රවර්ධනය

1.4 පවුල් ඒකකය තුළ සතුට හා සෙනෙහස ප්‍රවර්ධනය කිරීම.

1.4.1 ගෘහස්ථ හිංසනය අවම කිරීම.

1.4.2 පවුල තුල නිවැරදි සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම හා තීරණ ගැනිමේදී එකිනෙකාගේ එකගතාවය තහවුරු කිරීම.

1.4.3 මනා ගෘහ ආර්ථික කළමණාකරණයක් ඇති කිරීම.

1.4.4 පවුල තුළ සරල රස වින්දන ක්‍රියාකාරකම් කිරීම.

1.4.5 පවුල් තුළ නිවැරදි ස්ත්‍රී / පුරුෂ සමාජ භාවය පිළිබද අවබෝධය

1.4.6 රැකවරණය, පෝෂණය හා නිදහස පවුල් ඒකකය තුළ දීම සහතික කිරීමට උපකාරී වන ළමා, තරුණ, වැඩිහිටි සුසංයෝගී සංවර්ධන කාර්යයේ නිරතවීමට වැඩිහිටියන් දිරිගැන්වීම (වැඩිහිටි ලේකම් කාර්යාලය හා ඒකාබද්ධව)
ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව - 15344
මෙම වැඩසටහන් ප්‍රාදේශීයව ක්‍රියාත්මක කළ අතර අවශ්‍ය සම්පත් රේඛීය ආයතන සමග සම්බන්ධීකරණය වි ලබා ගන්නා ලදී.

1.5 ළමා ආරක්ෂාව පිළිබදව ක්රමවත් වූ වැඩ පිළිවෙලක් ගම තුළ ක්‍රියාත්මක කිරීම.

1.5.1 සෑම ගමකම සක්‍රිය ළමා සමාජයක් බිහි කිරීම හා එම ළමා සමාජ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.5.2 සෑම වසමකට ළමා සමාජ දරුවන් සඳහා සෞන්දර්ය වැඩසටහන්, සංස්කෘතික තරග හා විෂය දැනුමට අදාළ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් පැවැත්වීම, රස වින්දන වැඩසටහන්, වෘත්තීය මාර්ගෝපදේශන, සංස්කෘතික මධ්‍යස්ථාන වටා ළමුන් ඒකරාශී කරවීම.

1.5.3 ඉතිරි කිරීම හා සකසුරුවම සඳහා දරුවන් හුරු කිරීම (සිසුරක/ කැකුළු ගිණුම්)

1.5.4 සෑම ළමයෙකුගේම ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම.

අනාගතය භාර ගැනීමට සිටින දරුවන්ගේ ලෝකය ඔප්නැංවීමටත් ඔවුන්ගේ කුසලතාවයන් වර්ධනය කරමින් කායික මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක්ඇති කරමින් අනාගතය සඳහා වර්තමාන ළමා පරපුර සන්නද්ධ කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මේවන විට ක්‍රියාකාරී ළමා සමාජ 13400 ක්‍රියාත්මක වන අතර 293000 සාමාජිකත්වයක් ලබා ගෙන ඇත.

මෙම ළමා සමාජ දරු දැරියන්ගේ සංස්කෘතික හා සාහිත්‍යමය හැකියාවන් ඔප්නැංවීම හා එම හැකියාවන් ජාතික තලයට ගෙන ඒම උදෙසා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික තරගාවලියක් පවත්වන ලදී. 2011 ජාතික මට්ටමේ තරඟාවලිය 2011 දෙසැම්බර් 27,28 ඇඹිලිපිටිය ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මේ සඳහා සියළුම දිස්ත්‍රික්කවල සිංහල හා ද්‍රවිඩ මාධ්‍ය ළමා සමාජ දරුවන් තරග ඉසව් 09 කින් වයස් කාණ්ඩ 03 ක් ඔස්සේ තරඟවලට සහභාගී කරවන ලදී. මෙහිදී තරඟාවලියට සහභාගි වූ සියලුම දරුවන් වෙනුවෙන් ත්‍යාග පාර්සලයක් ලබාදෙන ලදි.

මීට අමතරව 2010 වර්ෂයේදී ජාතික තරඟාවලියේ ජය ගන්නා ලද කැකුළු ළමා සමාජ දරු දැරියන් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර බෙදාදීමේ ප්‍රධාන උත්සවය මෙවර දකුණු පළාතේ වැලිගම නගර ශාලාවේ දී හා උතුරු පළාතේ වව්නියා දමිල මහා විදුහලේ දී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. මෙ යටතේ ආරක්ෂා හා සුභසාධන වැඩසටහන් 5195 ක් ක්‍රියාත්මක කරන ලදි .

1.6 ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව පැවැත්වන වැඩසටහන්

1.6.1 ජාත්‍යන්තර කාන්තා දිනය - මාර්තු - 08

ලෝකයේ අනාගත පරපුරක් බිහි කරමින් මාතෘත්වය නම් උතුම් පදවියෙන් පිදුම් ලබන සහ සමෘද්ධි වැඩසටහනේ සංවර්ධන කාර්යේදී උරෙන්උර ගැටී කටයුතු කරන තැනැත්තියක් ලෙස කාන්තාවගේ දායකත්වය වඩාත් සුවිශේෂි වේ. මෙවන් ප්‍රයත්නයන් තුලින් අවාසිසහගත තත්ත්වයන්ට පත්ව ඇති අඩු ආදායම්ලාභී කාන්තාවන්ගේ මානසික පීඩනය බිඳකින් හෝ දුරලන්නට හැකි වීම භාග්‍යක් කොට සලකමි.

නිරතුරු සහනාධාර මත පමණක් යැපෙමින් සිටිනවා වෙනුවට ඔවුන්ගේ ශක්ති වර්ධනයට හැකියා වර්ධනයට අතහිත දීම ඔවුන් දැනුවත් කිරීම ඒ හා ඉලක්ක වූ ණය පහසුකම් ලබා දීම තුලින් ඔවුන් බල ගන්වා සංවිධාන ගත කිරීම ඵලදායී ප්‍රයත්නයක් ලෙස දකිමු.

පවුලත් පිටස්තර ලෝකයත් එකින් එකට ඈද බැද තබන ශක්තිමත් යදම් වැල කාන්තාවයි. දුප්පතුන් අවම වූ සමෘද්ධිමත් දේශයක් කරා යාමේදී අප පළමුව කාන්තා ශක්තිය කෙරෙහි විශ්වාසය තබමු. මෙවන් කාන්තාවන් උදෙසා ප්‍රාදේශීය දිස්ත්‍රික් මට්ටමින් විවිධ උපහාර උළෙල සහ එම කාන්තාවන් දිරි ගැන්වීම හා දැනුවත් කිරීම වැඩසටහන් සිදුකරන ලදී.

කාන්තාවන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වූ වැඩසටහන්

- ආකල්ප සංවර්ධන වැඩසටහන්
- ගර්භණී මාතා වැඩසටහන්
- මව්පිය වන්දනා වැඩසටහන්
- ගෘහ කළමණාකරණය හා පවුල් සංවර්ධන වැඩසටහන්
- සමෘද්ධි වැඩසටහන තුලින් ඉදිරියට පැමිණි දිරිය කාන්තාවන් ඇගයීම හා උපහාර වැඩසටහන.
- ලේ දන්දීමේ වැඩසටහන්.
- කාන්තා ශක්තීන් එළිදැක්වීමේ වැඩසටහන්.

1.6.2 ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනය

දරිද්‍රතාවයට බලපාන සාධක අතර මත්ද්‍රව්‍ය භාවිතය හා දුම්වැටි භාවිතය ප්‍රධාන වේ. එබැවින් සෑම වර්ෂයක්ම මැයි. 31 ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනය තේමා කොට ගෙන ප්‍රාදේශීය දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මීට අමතරව දීපව්‍යාප්තව කොඩි අලෙවි කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරනු ලැබේ. එමඟින් ලබා ගන්නා මුදල් ප්‍රාදේශීය මට්ටමින් සමාජ සංවර්ධන පදනම් වලද තැන්පත් කරනු ලැබේ. එම මුදල් යොදා ගෙන නිවාස හා සනීපාරක්ෂක වැඩසටහන් ප්‍රාදේශීය සංවර්ධන හා විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙතෙක් ලබා ගත් කොඩි ආදායම් පහත පරිදි දැක්විය හැකිය.

වර්ෂය	කොඩි ආදායම (රු. මිලියන)
2007	51.9
2008	68.1
2009	83.2
2010	79.3
2011	86.3

1.6.3 ජාත්‍යන්තර සාක්ෂරතා දිනය

පාසල් යායුතු වයසේ සිටියත් එහෙත් පවුලේ නැති බැරි කම් මත පාසල් නොයන, අකුරු ලිවීමට, කියවීමට නොහැකි වයස අවුරුදු 05-14 අතර ළමුන් විධිමත් පාසල් වලට ඇතුල් කිරීම සාක්ෂරතා පන්තිවලට ඇතුලත් කිරීම හා වෙනත් වෘත්තීන් සඳහා යොමු කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කර ඇත.

පාසල් ගත කල සංඛ්‍යාව - 1265

සිසු දිරිය ශිෂ්‍යත්ව සංඛ්‍යාව - 3458

1.6.4 ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනය

"වැඩිහිටියන් සඳා අපේ සම්පතයි" යන තේමාව යටතේ වැඩිහිටි දිනය සමරමින් වැඩිහිටි සත්කාරක වැඩසටහන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි සිදුකර ඇත. එහිදි වැඩිහිටියන් සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් (බණ භාවනා, බෝධි පූජා, පිරිත් පිංකම් යන ආදී.) පැවැත්වූ අතර විශේෂ දේශන හරහා වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද රසාඥතාවය වැඩි දියුනු කිරීම සඳහා රසාස්වාදන වැඩසටහන්ද වැඩිහිටියන් හා කුඩා ළමුන් අතර අත්දැකීම් හුවමාරු කිරීමේ වැඩසටහන් ද මාපිය වන්දනා වැඩසටහන් ද සිදුකර ඇත.

1.6.5 දිළිඳුකම පිටුදැකීමේ දිනය

මෙම දිනය තේමා කරගෙන විශේෂ වැඩසටහනක් ලෙස සමෘද්ධි ව්‍යවසායකයින්ගේ දිස්ත්‍රික් මට්ටමින් වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීමට ද සමාජ සංවර්ධන අංශය දායක වී ඇත. ඔවුන් ජාතික මට්ටම දක්වා රැගෙන ඒමක්ද සිදුකරන ලදී.

02. දිරිය පියස නිවාස වැඩසටහන

2.1. දිරිය පියස නිවාස වැඩසටහන

සමෘද්ධි වැඩසටහන තුල ඉතා ආකර්ෂණීය වැඩසටහනක් ලෙස දිරිය පියස නිවාස වැඩසටහන ක්‍රියාත්මක වන අතර මෙම වර්ෂය තුල ද රු.මි. 337.3 ක් වැය කර මෙවැනි නිවාස 3403 ක් නිම කර ඇත. එක් නිවසක් සඳහා රු. 100,000/- ක මුදල් ප්‍රතිපාදන ලබා දෙන ලද අතර මෙහි නිමි වටිනාකම රුපියල් ලක්ෂ 500,000 ක් ඉක්මවා ඇත .

විශේෂයෙන් තම වයස්ගත දෙමාපියන් රැකබලා ගන්නා පවුල් සඳහා ද පවුලේ පාසැල් යන වයසේ ගැහැණු දරුවන් සිටින එමෙන්ම ආබාධිත දෙමව්පියන්, සහෝදරයන් ඇති පවුල් කෙරේද වැඩි අවධානයක් යොමු කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තනන ලද දිරිය පියස නිවාස ලාභීන්ගේ ගෙවතු සැකසීම, ගෘහ කළමණාකරණය හා පවුල් සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම ද ඔවුන් සඳහා සුදුසු ජීවනෝපාය නගා සිටු වීමේ වැඩසටහන් හඳුනා දීම තුලින් ද ඔවුන් සවිබල ගැන්වූවන් බවට පත් කිරීමට ද හැකි වී ඇත.

ඉහත භාණ්ඩාගාර ඍජු ප්‍රතිපාදනවලට අමතරව ලොතරැයි අරමුදල නිවාස 500 ක් ඉදිකර ඇති අතර ඒ සඳහා වැය කරන ලද ප්‍රමාණය රු. මි. 50 කි. මෙයට අමතරව ප්‍රාදේශීයව සමාජ සංවර්ධන පදනමින් අරමුදලෙන් නිවාස 1500ක් පමණ ඉදිකර ඇත.

විස්තරය	වෙන් කළ මුදල රු. මිලියන	ඉදි කළ නිවාස ගණන
භාණ්ඩාගාර ප්‍රතිපාදන	337.3	3403
නිවාස ලොතරැයි අරමුදල්	50	500
සමාජ සංවර්ධන පදනම	75	1500

නිවසේ පෙර තත්වය

නිවසේ පසු තත්වය

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඩබ්.එම්. සෝමාවති මිය

03. වෙනත් සුභසාධන වැඩසටහන් හා විශේෂ වැඩසටහන්

3.1 ආබාධිත සුබ සාධනය

මෙහිදි රට දැය වෙනුවෙන් යුධ වැද එම මෙහෙයුම් වලදී අබාධිත වූ රණවිරුවන් සඳහා අබාධිත සුභ සාධන වැඩ සටහන් යටතේ ද, අනිකුත් ආබාධිත සියල්ලම සාමාන්‍ය ආබාධිත සුභ සාධන වැඩ සටහන යටතේ ද ගෙන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් විවිධ වැඩ සටහන් සිදුකර ඇත. මේ සඳහා සමාජ සංවර්ධන පදනමේ අරමුදල් යොදා ගෙන ඇත.

3.2 බන්ධනාගාර ගතවුවන්ගේ පවුල් සුභ සාධනය.

මෙම පවුල්වල සමාජයේ ගැටළු අවම කිරීම උදෙසා එම පවුල්වල සාමාජිකයින් පිලිගත හැකි තත්ත්වයේ පුද්ගලයන් බවට පත්කිරීම සඳහාන්, විවිධ වැඩ සටහන් සිදුකර ඇත. මොවුන් සමෘද්ධි බැංකු හරහා ණය වැඩ සටහන් වලට යොමුකර නිෂ්පාදන කටයුතු සඳහා යොමුකර ඇත.

3.3. ළමා අපයෝජනය වැලැක්වීමේ වැඩ සටහන්.

ළමා අපයෝජන සිද්ධීන් හදුනා ගැනීම.

- මෙහෙකාර සේවය
- ලිංගික අපචාරවලට ලක්වීම
- පාසල් යන වයසේ දරුවන්ගෙන් පවුලේ නඩත්තුව සලකා ගැනීම
- ගෘහ ප්‍රචණ්ඩත්වය

ඉහත සිද්ධීන් හදුනා ගෙන එම පවුලේ වැඩිහිටියන් සඳහා දැනුවත් කිරීම වැඩසටහන් පැවැත්වීම. එවැනි දරුවන් පාසල් ගත කිරීම. ශිෂ්‍යත්ව ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.4. සියදිවි නසා ගැනීම වලක්වාලීමේ වැඩ සටහන්.

දිවයින පුරා සිටින සමාජ සංවර්ධන සහකාරවරුන් මගින් ප්‍රාදේශීය මට්ටමින් මෙම වැඩ සටහන අනිකුත් වැඩ සටහන් හා සමගාමීව ක්‍රියාත්මක කරනු ලැබේ. සියදිවි හානිය වැලැක්වීම අවම කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කොට ඇත.

- මේ යටතේ සියදිවි හානී කර ගැනීමට මූලික වන පසු බිම සොයා බැලීම .
- එවැනි පවුල්වල පුද්ගලයින් සඳහා දැනුවත් කිරීම හා උපදේශක සේවා වැඩසටහන් පැවැත්වීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධ වී සුදුසු වැඩසටහන් නිර්මාණය කිරීම.
- ළමා සමාජ වටා ළමුන් ඒකරාශී කරවීම
- ආගමික සංස්කෘතික ආර්ථික සංවර්ධන අංශවලින් මෙම තත්ත්වය වැලැක්වීම

3.5 විශේෂ වැඩ සටහන්

- **දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචනය.**

මෙය මාස 02 කට එකක් බැගින් වන සේ දිස්ත්‍රික් ලේකම් / සමෘද්ධි සහකාර කොමසාරිස්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂය කළමණාකරු, දිස්ත්‍රික් ප්‍රගති කළමණාකරු මූලස්ථාන කළමණාකරු, කළමණාකාර අධ්‍යක්ෂ, කලාප කළමණාකරු, සමාජ සංවර්ධන සහකාර සහභාගිත්වයෙන් පවත්වනු ලැබේ. මේ සඳහා ප්‍රතිපාදන සමාජ සංවර්ධන අංශයෙන් නිදහස් කරනු ලැබේ. 2011 වර්ෂයේ වියදම් කළ මුදල 1.2 කි.

2011 වර්ෂයේ වැඩසටහන් සමස්ත ප්‍රගතිය

වැඩසටහන	වෙන්කළ මුදල රු.මි.	වියදම රු.මි.	ප්‍රගතිය
1 ආධ්‍යාත්මික සංවර්ධනය	1.0	0.2	62040
	-	-	13931
3 මත් නිවාරණය හා දුම්වැටි නිවාරණය	5.5	5.44	12958
4 ළමා ආරක්ෂාව සුහසාධනය	5.0	-	9195
5 සාමාජීය හා සංස්කෘතික අගයන් වැඩි දියුණු කිරීම	0.5	0.06	9824
6 ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්	5.0	10.6	5271
7 ප්‍රගති සමාලෝචනය	3.0	1.2	13802
8 දිරිය පියස නිවාස සංවර්ධනය	346.3	337.3	3947
එකතුව	366.3	354.8	

12.0 මාධ්‍ය අංශය.

දුගීබව පිටුදැකීම සඳහා අඩු ආදායම්ලාභී ජන කොටස්වල උත්සාහයන්ට උර දෙන සන්නිවේදන රටාවක් ගොඩනැගීම හා එතුළින් සමෘද්ධි සැඩසටහනේ සංවර්ධනාත්මක හරයන් ජවතාව තුළ ප්‍රචලිත කිරීම ,සමෘද්ධි වැඩසටහන ආශ්‍රිතව නව සංවර්ධන සාහිත්‍යයක් ගොඩනැගීමත් ,අඩු ආදායම්ලාභී ජනතාවගේ රාජ්‍ය නොවන සංවිධානවල ස්වේච්ඡා සේවකයින්ගේ වෘත්තිකයන්ගේ හා දේශපාලන නායකත්වයේ අන්‍යෝන්‍ය අත්දැකීම් සමාජ සංවර්ධන ක්‍රියාවලිය ප්‍රගතිශීලිව ඉදිරියට ගෙන යාම සඳහා උචිත සංවාදයක් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් ගොඩනැගීම

සන්නිවේදනය තුළින් දිළිඳුකම පිටුදැකීම සඳහා වූ දැනුම කුසලතා ආකල්ප වර්ධනය තුළින් සමෘද්ධි ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින්, එහි සංවර්ධනය වඩාත් ඵලදායි සහ අර්ථවත් කරලීම හා ශ්‍රී ලංකීක හා අන්තර් ජාතික ප්‍රජාව අතර එය ප්‍රචලිත කිරීම.

උපාය මාර්ග - සමෘද්ධි ව්‍යාපාරය ප්‍රචලිත කිරීම හා සංවාදයකට ලක් කිරීමට අදාළ වන මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සහය ලබා ගැනීම.

- සමෘද්ධි ව්‍යාපාරයේ විවිධ අංශ අතර මාධ්‍ය සම්බන්ධීකරණයක් ගොඩනැගීම මගින් එම අංශවල සහය ලබාගැනීම.
- දේශපාලන රාජ්‍ය නොවන විවිධ ආයතනවල සහයෝගය ලබා ගනිමින් නව සන්නිවේදනය වඩාත් ඵලදායී ලෙස ඉදිරියට ගෙනයාම.

ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රගතිය විමර්ශනයට ලක් කෙරෙන නවයුගයක උදානය සතිපතා රූපවාහිනී වැඩසටහන් 01 යි.
- සමෘද්ධි අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ විශේෂිත වැඩසටහන් සම්බන්ධව ප්‍රචාරණය කළ විශේෂිත රූපවාහිනි වැඩහටහන් 02 යි.
- සමෘද්ධි අධිකාරිය මගින් ක්‍රියාත්මක ගුවන්විදුලි පිළිසඳර සතිපතා වැඩසටහන් - 50 යි.

මුද්‍රිත මාධ්‍ය -

සමෘද්ධි පුවත්පත ප්‍රකාශන	-	කලාප 02 පිටපත් 80,000
සංවර්ධන වැඩසටහන් පිළිබඳ සැකසූ ප්‍රචාරාත්මක පුවත්පත් දැන්වීම්	-	05
අනෙකුත් ප්‍රකාශන	-	05

මාධ්‍ය ආවරණ - ක්ෂෙත්‍ර මාධ්‍ය ආවරණ - 03

විද්‍යුත් මාධ්‍ය - "සමෘද්ධි පිළිසඳර" ගුවන්විදුලි සජීවි කථිකාවත

සමෘද්ධි අධිකාරිය සහ ගුවන්විදුලි සංස්ථාව අතර ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මකවන සමෘද්ධි පිළිසඳර ගුවන්විදුලි වැඩසටහන සෑම සෙනසුරාදා දිනයකම පෙ. ව 9.30 සිට 10.30 දක්වා වෙළඳ සේවයෙන් විකාශය වේ.

මෙම වැඩසටහන තුළින් සමෘද්ධි ප්‍රතිලාභීන්, පොදු මහ ජනතාව දුරකථන මාර්ග ඔස්සේ සම්බන්ධ කර ගනිමින් ජාතික වශයෙන් ක්‍රියාත්මක වැඩසටහන් හා ප්‍රාදේශීය වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙන්ම ගැටළු සංවාදයට ලක්කොට විසඳුම් ලබා දෙන වැඩසටහනකි. එහිදී අසන්නන් සඳහා පැනයක් යොමුකර පිළිතුරු ලබාගන්නා අතර ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනමනු ලැබේ.

2011 වසරේ සති 50 ක් වැඩසටහන විකාශනය කර ඇත.

නවයුගයක උදානය රූපවාහිනී වැඩසටහන

සමෘද්ධි අධිකාරිය සහ ජාතික රූපවාහිනී ආයතනය අතර ගිවිසුම් ප්‍රකාරව සෑම ඉරිදා දිනකම පස්වරු 6.45 සිට 7.00 දක්වා නවයුගයක උදානය රූපවාහිනී වැඩසටහන ක්‍රියාත්මක විය.

ග්‍රාමීය මට්ටමෙන් සිදුවෙන යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම ප්‍රතිලාභී ප්‍රජාව ආදායම් උත්පාදන වැඩසටහන් තුළින් ජීවිතය ගොඩනාගාගන්නා අයුරු සාකච්ඡා කර පටිගතකර විකාශය කරන වැඩසටහනකි.

මෙම වැඩසටහන 2011. 01. 02 වැනි දින පමණක් විකාශය විය.

සමෘද්ධි දැන්වීම් විකාශය

සමෘද්ධි වැඩසටහන් තුළින් ක්‍රියාත්මක යටිතල පහසුකම් සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, සදාචාර සංවර්ධන වැඩසටහන, දිවි නැගුම ජාතික වැඩසටහන ආදී වැඩසටහන් පිළිබඳව උදෑසන 6.30 ට ස්වාධීන රූපවාහිනිය මගින් විකාශයවන දවසේ පත්තර වැඩසටහන තුළ හා රාත්‍රී 9. 30 ප්‍රවෘත්ති විකාශය අතර තුර තත්පර 30 කෙටි දැන්වීම් විකාශය කිරීම.

2011 මාර්තු සිට ජූලි දක්වා තත්පර 30 දැන්වීම් 54 ක් සහ තත්පර 5 දැන්වීම් 505 ක් වශයෙන් විකාශය විය.

13.0 මෙහෙයුම් හා ඇගයුම් අංශය

මෙහෙයුම් හා ඇගයුම් අංශයේ කාර්යය භාරය මූලික වශයෙන් දෙආකාර වේ. සමෘද්ධි වැඩසටහනේ එකග වූ ක්‍රියාත්මක සැලැස්මට අනුව වර්ෂයේ කාර්යය භාරය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබදව භෞතික හා මූල්‍ය වශයෙන් ඇගයුමට ලක් කිරීමත්, පසුපල අගය පිළිබදව විමර්ශනය මත ඇගයුමක් කිරීමත් මෙම අංශයට පැවරී ඇති මූලික කාර්යය දාමය වේ. ත්‍රෛමාසිකව හා අර්ධ වාර්ෂිකව සිදු කරනු ලබන ප්‍රගතිය විමසුමෙන් මතු වන කරුණු පිළිබදව මතයක් පල කිරීමත් ගැටලු හදුනාගෙන එම ගැටලු වලට පිළියම් යෙදීමත් අපේක්ෂා කරන අනෙක් අරමුණ වේ. මේ අනුව වාර්ෂික සැලැස්මට අවශ්‍ය සංශෝධනය යෝජනා කිරීම ද මේ යටතේ සිදු කෙරේ.

13.1 වාර්ෂික සැලැස්ම හා පෙර අවුරුදු ඒකාබද්ධ සැලැස්ම පිළියෙල කිරීම.

පවතින තත්ත්වය යටතේ හා අනුගමනය කළ යුතු රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ වාර්ෂික සැලැස්ම සකසා ඒ අනුව ඉදිරි පස් අවුරුද්ද සදහා ද ඒකාබද්ධ සැලැස්මක් සැකසිය යුතු බව ට රජය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන ඇත. යහපාලනය සදහා වූ චක්‍රලේඛ උපදෙස් මාලාව අනුව, වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සැකසීම මෙන්ම එම සැලැස්මට අනුගතව ඒකාබද්ධ සැලැස්ම ද යාවත්කාලීන කළ යුතු වේ. මෙම කාර්යය භාරය පැවරී ඇත්තේ ද මෙහෙයුම් හා ඇගයුම් අංශය වෙතය.

13.2 ප්‍රගති සමාලෝචන වැඩසටහන

සමෘද්ධි ප්‍රතිලාභීන් මෙන්ම අඩු ආදායම්ලාභීන් ද ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් බැදී පවතින වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන හදුනාගත හැකිය. එබැවින් පුළුල් පරාසයකට විහිදී යන පරිදි විවිධ වූ සංවර්ධන වැඩසටහන් හා ක්‍රියාකාරකම් ප්‍රතිලාභීන් වෙත හදුන්වාදීම හා ඒවා වඩා ඵලදායීව කේෂ්ත්‍රයේ ක්‍රියාත්මක කිරීම ද මේ යටතේ සිදු කරනු ලැබේ. මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඒවා නිරන්තරවම වාර්ෂික සමෘද්ධි වැඩසටහනට (ක්‍රියාත්මක සැලැස්මට) අනුගත විය යුතු අතර ඒ නිරන්තරවම ප්‍රගතිය විමසුමට ලක් කළ යුතුය. සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිටම එහි ප්‍රගතිසමාලෝචන ක්‍රමවේදය විධිමත්ව හා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර නිරතුරුවම ගනු ලැබීය. ප්‍රධාන අදියර 03 ක් ඔස්සේ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරේ.

(I) ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගතිය විමසුමට ලක් කිරීම.
(II) දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය විමසුමට ලක් කිරීම.
(III) ජාතික මට්ටමින් ප්‍රගතිය විමසුමට ලක් කිරීම.

මෙවැනි ප්‍රගති සමාලෝචන ක්‍රමවේදයක් තුළින් අපේක්ෂා කරනු ලබන්නේ වඩාත් පහසුවෙන් ඒ ඒ අවධීන් වලදී පැන නගිනු ලබන ගැටලු හදුනා ගැනීමට හා එම ගැටලු නිරාකරණය කරගැනීම පහසු කිරීමත්, ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හී ප්‍රගතිය සමාලෝචන කිරීම තුළින් ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත පහසුවෙන් එක් රැස් කර ගැනීමත්ය. මේ සදහා නිරන්තරවම සාමූහිකව රැස්වීමත් කණ්ඩායම් වගකීමකින් යුතුව පසුපල ඇගයුමත් කරනු ලැබීම ද මෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයයි.

13.2.1 <u>ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය</u>

මෙහෙයුම් හා ඇගයුම් අංශය යටතේ සෘජුවම ප්‍රතිපාදන නොදැරුව ද ප්‍රාදේශිය මට්ටමින් සංවිධානය කරනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම් කීපයක් වේ.

- **<u>සති රැස්වීම - ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.</u>**

  සෑම බදාදා දිනකම ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන් පැවැත්වෙන සති රැස්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සේවයේ යෙදෙන සියළුම කළමණාකරුවන් සහභාගී විය යුතු අතර ක්ෂේත්‍රයේ සිදු කෙරෙන සංවර්ධන කටයුතු හා සමෘද්ධි ප්‍රතිලාභීන් පිළිබඳව ද ඊට අදාල අනෙකුත් කරුණු ද මෙහිදී සාකච්ඡාවට ගැනේ.

- **<u>කලාප රැස්වීම - කළාප කළමනාකරුවන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.</u>**

  ප්‍රාදේශීය මට්ටමේ රැස්වීම් අතර කලාප මට්ටමින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ප්‍රධාන වේ. දැනට ක්‍රියාත්මක වන සමෘද්ධි බැංකු සංගම් 1043 ම සතියේ සෑම බ්‍රහස්පතින්දා දිනයකම කලාප කළමනාකරුවන්ගේ ප්‍රධානත්වයෙන් කලාප ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබේ. මේ සඳහා කලාපයට අයත් සියළුම ග්‍රාමසේවා වසම් හි සේවයේ නිරතව සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහභාගී වේ. මෙහිදී ඉතිරි කිරීම් ප්‍රධාන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය යටතේ ණය පහසුකම් ලබා දීමට අදාලව මූලික සාකච්ඡා කෙරේ.

- **<u>කොට්ඨාශ රැස්වීම - ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.</u>**

  මසකට වරක් ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන් පැවැත්වෙන කොට්ඨාශ රැස්වීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියළුම සංවර්ධන නිලධාරීන් සහභාගී වන අතර, එහිදී කොට්ඨාශයේ පොදු ගැටළු පුළුල් වශයෙන් සාකච්ඡාවට භාජනය කෙරේ. ප්‍රගතිය සාකච්ඡා කිරීම සේවක ගැටළු හඳුනාගැනීම ක්ෂේත්‍රයේ පවතින ගැටළු හා පිළියම් සාකච්ඡාවට ද මෙම රැස්වීම යොදා ගැනේ.

13.2.2 <u>දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය</u>

- **මූලස්ථාන කළමනාකරුවන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් - දිස්ත්‍රික් ලේකම්ගේ <u>ප්‍රධානත්වයෙන්</u> පැවැත්වේ.**

  දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කරනු ලබන ඉතාමත් වැදගත් ප්‍රගති සමාලෝචන රැස්වීම වන්නේ මූලස්ථාන කළමනාකරුවන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමයි. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සේවයේ නිරත මූලස්ථාන කළමනාකරුවන්, කළමනාකාර අධ්‍යක්ෂකවරුන් හා ව්‍යාපෘති කළමනාකරුවන් සහභාගී වේ. 2011.12.31 දින වන විට මූලස්ථාන කළමනාකරුවන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 264 ක් පවත්වා ඇත.

- **දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම - දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.**

දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ විෂය භාර අධ්‍යක්ෂවරුන් ද සහභාගී වන අතර රැස්වීම සඳහා දිස්ත්‍රික්කයේ සියළුම සමෘද්ධි කළමනාකරුවන් සහභාගී වේ.

2011 වසරේ දී මෙවැනි දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 05 ක් පවත්වා ඇත.

13.2.3 ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචනය

- **දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම - අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.**

සමෘද්ධි වැඩසටහන සම්බන්ධයෙන් ජාතික මට්ටමින් ප්‍රගතිය සාකච්ඡා කිරීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දීම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ මාසික රැස්වීමේදී සිදු කෙරේ. ප්‍රවර්ථන වර්ෂය තුලදී පවත්වන්නට යෙදුන රැස්වීම් ප්‍රමාණය 08 කි.

13.3 තොරතුරු තාක්ෂණ ඒකකය පවත්වා ගෙන යාම

I. e samurdhi වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සියළු කාර්යයන් පරිගණක ගත කිරීමේ අරමුනින් ශ්‍රී ලංකා තොරතුරු හා භාෂා තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) හා ඒකව මෙම වැඩසටහන අරඹා ඇත. මෙමගින් අඩුආදායම් ලාභීන් සවිබල ගැන්වීම සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් සිදු කරනු ලබන සියළු කාර්යයන් ඉතා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනිමක් සිදු වේ. මෙම වැඩසටහන මූලික අදියර 2ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒවා පහත පරිදි වේ.

පළමු අදියර

- මානව සම්පත් කලමනාකරණ (HRM)
- ප්‍රතිලාභීන්ගේ තොරතුරු කළමනාකරණය (CRM)
- ව්‍යාපෘති හා වැඩසටහන් කළමනාකරණය (PPM)

දෙවන අදියර

- ස්ථාවර වත්කම් කලමනාකරණ (FAM)
- මූල්‍ය කළමනාකරණය (FCM)
- අරමුදල් කළමනාකරණ පද්ධතිය (FMS)
- තොග කළමනාකරණ පද්ධතිය (IMS)

II. e දිරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ශ්‍රී ලංකිකයන්ගේ පර්ගණක සාක්ෂරතාවය ඉහල නැංවීමේ වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ආරම්භ වී ඇත. මේ යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් 20,000 ක් සඳහා එක්දින පරිගණක පුහුණවක් ලබාදීම දිස්ත්‍රික් මට්ටමින් සිදු කර ඇත.

III. ආයතනය සතු සර්වර් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා අභ්‍යන්තර ජාල පද්ධතිය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම

13.4 විශේෂ වැඩසටහන්

සමෘද්ධි වැඩසටහන වඩාත් ශක්තිමත් කොට පවත්වාගෙන යාමේ අරමුණින් සංවිධානය කරනු ලබන වැඩසටහන් කිහිපයකි. සමාජ අවශ්‍යතාවය මත පුළුල් මට්ටමින් කරනු ලබන

අධ්‍යනයට අනුව ගම්මාන සංවර්ධනයට අදාලව දියත් කෙරෙන මෙම වැඩසටහන් පොදු අරමුණු මුල් කරගන්නෙකි. මෙවැනි විශේෂ වැඩසටහන් ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අවශ්‍යතාවය මත සැලසුම් කරනු ලබන වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැකිය. 2011 වසර තුල මෙවැනි වැඩසටහන් 32ක් පවත්වා තිබේ.

පොල් පොහොර සහනාධාර බෙදාදීමේ වැඩසටහන පිළිබඳව දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීම

පොල් වගාවේ නව ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා ''කප්රුක දිරිය'' පොහොර සහනාධාරය ලබාදීම පිළිබඳව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ විශේෂ රැස්වීමක් පවත්වන ලදී. මීට සමගාමීව එම දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වූ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරීන් හා සියලුම මූලස්ථාන කළමනාකරුවන් සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී. එහිදී කප්රුක දිරිය වැඩසටහන 2011 සමෘද්ධි අධිකාරියේ ක්‍රියාත්මක සැලැස්මට කෙසේ ඇතුළත් කළ යුතුද, අප විසින් ඒ වෙනුවෙන් හඳුන්වා දෙන නව වැඩසටහන් මොනවාද යන්නත් ඊට අනුරූප වන අයුරින් දිස්ත්‍රික් සැලසුම් සංශෝධනය කිරීම පිළිබඳවත් මෙහිදී විශේෂ සාකච්ඡා කොට අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට උපදෙස් ලබා දෙන ලදී.

2011 ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම පිළිබඳ විශේෂ වැඩමුළුව

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නව දැක්මට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ පවුලේ පෝෂණය සහ ආදායම වැඩිදියුණු කිරීම උදෙසා ක්‍රියාත්මක කරන ලද ගෘහ ආර්ථික ඒකක දශලක්ෂයක් සංවර්ධනය කිරීම පිළිබඳව කතිකාවක් ඇති කිරීම උදෙසා මෙම විශේෂ වැඩමුළුව සංවිධානය කරනු ලැබීය. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, සියළුම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරීන් හා තෝරාගත් ප්‍රාදේශීය ලේකම්වරු කීපදෙනෙකු සහභාගී වූහ.

ගෘහ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත ගෘහ ආර්ථික ඒකක දශලක්ෂයක් සංවර්ධනය කිරීම පිළිබඳව සමෘද්ධි අධිකාරියට සම්බන්ධ සියලුම මූලස්ථාන කළමනාකරුවන් හා ජීවනෝපාය සංවර්ධන විෂයභාර කළමනාකරුවන් දැනුවත් කරන ලදී. මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය හා පශු සම්පත් අමාත්‍යාංශය ඇතුළු ඊට අනුබද්ධ ආයතන ප්‍රධානීන් විසින් ඒ ඒ ආයතන මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් හා ඒ තුළින් සමෘද්ධි වැඩසටහනට ලබාදිය හැකි දායකත්වය පිළිබඳව දැනුවත් කරන ලදී.

13.5 අංශගත මූල්‍ය ප්‍රගතිය

මෙහෙයුම් හා ඇගයුම් අංශයේ සමස්ථ වැඩසටහන වෙනුවෙන් රු.මි. 20.00 ක් ප්‍රවර්ථන වර්ෂය තුළදී වෙන් කරන ලදි. මෙම මුදලින් 2011 වසර අවසාන වන විට රු.මි. 6.38 ක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රධාන වැය විෂයන් 04 ක් යටතේ වැය කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 31.9% ක් වන අතර එකී තොරතුරු පහත දැක්වේ.

වියදම් දරණ ලද ආයතනය	වැය විෂය								මුළු එකතුව	
	ප්‍රගති සමාලෝචන		විශේෂ		පුහුණු		වෙනත්			
	වෙන් කළ මුදල රු.මි.	වියදම රු.මි.	වෙන් කළ මුදල රු.මි.	වියදම රු.මි.	වෙන් කළ මුදල රු.මි.	වියදම රු.මි.	වෙන් කළ මුදල රු.මි.	වියදම රු.මි.	වෙන් කළ මුදල රු.මි.	වියදම රු.මි.
දිස්ත්‍රික් කාර්යාල	9.04	1.96	8.5	2.61	0.5	0.18	1.96	0.08	20.00	4.83
ප්‍රධාන කාර්යාලය		0.17		1.23		0.07		0.08		1.55
මුළු මුදල	9.04	2.13	8.5	3.84	0.5	0.25	1.96	0.16	20.00	6.38

13.6 සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබා දීමේ අරමුණ මත, 1995 අංක 30 දරණ සමෘද්ධි අධිකාරි පනතෙහි 20 (1 හා 2) වගන්තිය යටතේ 2001 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල ආරම්භ කොට ක්‍රියාත්මක කරනු ලැබීය. මේ සඳහා සෑම සමෘද්ධි ප්‍රතිලාභියෙක්ම මාසිකව රු.10 ක් ගෙවීමෙන් අරමුදලට දායක විය යුතු වේ. දළ වශයෙන් මසකට රු.මි. 16 ක පමණ මුදලක් අරමුදලට බැර වේ.

මෙම අරමුදලේ පරිපාලනය කැබිනට් පත්‍රිකාවක් මගින් අනුමත කරන ලද නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මගින් සිදු කරනු ලැබේ.

එහි සභාපති ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාද සෙසු සාමාජිකයන් වශයෙන් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි කොමසාරිස් ජනරාල්, මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු, සමෘද්ධි අමාත්‍යාංශයේ තවත් එක් නිලධාරියෙක්, සමෘද්ධි කළමණාකරුවන්ගේ සංගමයේ සභාපති සහ සමෘද්ධි සංවර්ධන නිලධාරි සංගමයේ ප්‍රධාන ලේකම්වරයාද අදාල කමිටුවේ සාමාජිකයින් වේ.

දිනුම් ඇදීමට ලක් කරන කාලසීමාව තුළ සමෘද්ධි සහනාධාර සඳහා හිමිකම් ඇති සියළුම ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුලත් කොට සකසනු ලබන පරිගණක වැඩසටහනට අදාල දත්ත ඇතුලත් කරනු ලැබේ. සෑම සමෘද්ධි ප්‍රතිලාභියෙක්ම සඳහාම ලොතරැයි අංකයක් ලබා දෙන අතර දිනුම් ඇදීම සඳහා එම ලොතරැයි අංකය භාවිතා කරනු ලැබේ.

පසුගිය කාල පරිච්ඡේද දෙස විමසා බැලීමේදී අවම වශයෙන් සෑම මසකම ජයග්‍රාහී ප්‍රතිලාභීන් 100 දෙනෙකුට දිනුම් හිමිකර දෙන අතර එක් දිනුමක වටිනාකම රු. 150,000 ක් බැගින් එක් දිනුම් මාසයකදී ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති මූල්‍ය ප්‍රදානය රු.ද.ල 15.00 පමණ වේ.

13.6.1 2011 මුදල් වර්ෂය තුළදී 2008, 2009 සහ 2010 වර්ෂවලට අදාල ජයග්‍රාහකයින්ගේ ත්‍යාග මුදල් නිදහස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර මුදල් නිදහස් කිරීමේ ප්‍රගතිය 2011.12.31 දිනට පහත දැක්වේ.

කාලපරිච්ඡේදය	ත්‍යාග සංඛ්‍යාව	ත්‍යාග මුදල රු.මි.	ප්‍රගතිය	
			ත්‍යාග ලද ප්‍රමාණය	වටිනාකම රු.මි.
2008	1200	180.00	179	153.15
2009	1200	180.00	109	163.65
2010	1200	180.00	95	165.75

මූලාශ්‍රය : ලොතරැයි අරමුදලේ අවසන් ගිණුම් වාර්තා

13.6.2 දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රාහකයින් තේරී ඇති අන්දම හා 2008 වර්ෂයේ ත්‍යාග මුදල් නිදහස් වී ඇති ආකාරය පහත දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	මාසික දිනුම් සංඛ්‍යාව	තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අත්හිටවූ දිනුම් සංඛ්‍යාව	ත්‍යාග මුදල් ලද ත්‍යාගලාභීන් ප්‍රමාණය	තව දුරටත් ලබා දිය යුතු ප්‍රමාණය	නිදහස් කරන ලද ත්‍යාග මුදල් ප්‍රමාණය
1	කොළඹ	4	48	10	37	1	5.55
2	ගම්පහ	8	96	16	80		12.00
3	කළුතර	4	48	8	39	1	5.85
4	ගාල්ල	5	60	10	50		7.50
5	මාතර	5	60	10	50		7.50
6	හම්බන්තොට	4	48	10	38		5.70
7	මහනුවර	7	84	12	72		10.80
8	මාතලේ	3	36		36		5.40
9	නුවරඑළිය	3	36	11	25		3.75
10	රත්නපුර	7	84	16	67	1	10.20
11	කෑගල්ල	4	48	5	43		6.45
12	බදුල්ල	4	48	4	44		6.6
13	මොණරාගල	3	36	5	31		4.65
14	කුරුණෑගල	10	120	16	103	1	15.45
15	පුත්තලම	4	48	6	41	1	6.15
16	අනුරාධපුරය	5	60	12	48		7.2
17	පොළොන්නරුව	2	24	5	19		2.85
18	අම්පාර	5	60	7	52	1	7.8
19	ත්‍රිකුණාමලය	3	36	10	26		3.9
20	මඩකලපුව	6	72	3	69		10.35
21	වවුනියාව	1	12	1	11		1.65
22	යාපනය	3	36	2	34		5.1
	එකතුව	**100**	**1200**	**179**	**1015**	**6**	**152.25**

දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රාහකයින් තේරී ඇති අන්දම හා 2009 වර්ෂයේ ත්‍යාග මුදල් නිදහස් වී ඇති ආකාරය පහත දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	මාසික දිනුම් සංඛ්‍යාව	තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අත්හිටවූ දිනුම් සංඛ්‍යාව	ත්‍යාග මුදල් ලද ත්‍යාගලාභීන් ප්‍රමාණය	තවදුරටත් ලබා දිය යුතු ප්‍රමාණය	නිදහස් කරන ලද ත්‍යාග මුදල් ප්‍රමාණය
1	කොළඹ	4	48	13	35		5.25
2	ගම්පහ	8	96	12	69	15	10.35
3	කළුතර	4	48	12	36		5.40
4	ගාල්ල	5	60	9	41	10	6.15
5	මාතර	5	60	10	25	25	3.75
6	හම්බන්තොට	4	48		15	33	2.25
7	මහනුවර	7	84		11	73	1.65
8	මාතලේ	3	36		10	26	1.5
9	නුවරඑළිය	3	36		6	30	0.90
10	රත්නපුර	7	84	10	63	11	9.45
11	කෑගල්ල	4	48	5	43		6.45
12	බදුල්ල	4	48	9	24	15	3.6

13	මොණරාගල	3	36	6	11	19	1.65
14	කුරුණෑගල	10	120	15		105	
15	පුත්තලම	4	48			48	
16	අනුරාධපුරය	5	60		48	12	7.2
17	පොළොන්නරුව	2	24		19	5	2.85
18	අම්පාර	5	60		53	7	7.95
19	ත්‍රිකුණාමලය	3	36			36	
20	මඩකලපුව	6	72	2	56	14	8.4
21	වවුනියාව	1	12	1	11		1.65
22	යාපනය	3	36	5	31		4.65
එකතුව		**100**	**1200**	**109**	**607**	**484**	**91.05**

දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රාහකයින් තේරී ඇති අන්දම හා 2010 වර්ෂයේ ත්‍යාග මුදල් නිදහස් වී ඇති ආකාරය පහත දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	මාසික දිනුම් සංඛ්‍යාව	තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අත්හිටවූ දිනුම් සංඛ්‍යාව	ත්‍යාග මුදල් ලද ත්‍යාගලාභීන් ප්‍රමාණය	තව දුරටත් ලබා දිය යුතු ප්‍රමාණය	නිදහස් කරන ලද ත්‍යාග මුදල් ප්‍රමාණය
1	කොළඹ	4	48	16	32		4.8
2	ගම්පහ	8	96	17	73	6	10.95
3	කළුතර	4	48	9	37	2	5.55
4	ගාල්ල	5	60	12	40	8	6.00
5	මාතර	5	60	10	25	25	3.75
6	හම්බන්තොට	4	48		15	33	2.25
7	මහනුවර	7	84		9	75	1.35
8	මාතලේ	3	36		10	26	1.50
9	නුවරඑළිය	3	36		5	31	0.75
10	රත්නපුර	7	84		70	14	10.50
11	කෑගල්ල	4	48	7	41		6.15
12	බදුල්ල	4	48	10	24	14	3.6
13	මොණරාගල	3	36	5	15	16	2.25
14	කුරුණෑගල	10	120			120	
15	පුත්තලම	4	48			48	
16	අනුරාධපුරය	5	60		48	12	7.20
17	පොළොන්නරුව	2	24		20	4	3.00
18	අම්පාර	5	60			60	
19	ත්‍රිකුණාමලය	3	36			36	
20	මඩකලපුව	6	72	5	59	8	8.85
21	වවුනියාව	1	12	1	11		1.65
22	යාපනය	3	36	3	33		4.95
එකතුව		**100**	**1200**	**95**	**567**	**538**	**85.05**

මූලාශ්‍රය : ලොතරැයි අරමුදලේ දත්ත සටහන

14.0 බැංකු මූල්‍ය අංශය.

1996 වර්ෂයේදී ආරම්භ කරන ලද සමෘද්ධි අධිකාරියේ " ණය අංශය " කාලීන වශයෙන් සිදුවූ ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතු කොටගෙන 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු " අංශය ලෙස නම් කරනු ලැබීය. බැංකු මූල්‍ය අංශය ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු මෙන්ම සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් පුරුද්ද වැඩි දියුණු කිරීම සඳහා ද කටයුතු කරනු ලබයි.

හැඳින්වීම :-

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ආරම්භවීමත් සමග එහි තවත් අංශයක ලෙස "ණය අංශය" ආරම්භ කෙරිණි.

කාලීන වශයෙන් සිදු වූ වෙනස්කම් හේතුකොට ගෙන මෙම අංශය 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු" අංශය ලෙස නම් කරනු ලැබීය.

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් 1996 දී ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවමින් ලාභදායී ආයතනික රටාවක් ඇති කිරීමටත් බලාපොරොත්තු විය.

01. 1043 ක් වූ සමෘද්ධි බැංකු සංගම් ජාලය තුලින් ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් සපයමින් ප්‍රමුඛතම ක්‍ෂුද්‍ර මූල්‍ය ආයතනයක් බැංකුව බවට පත් කිරීම.

02. අඩු ආදායම්ලාභී සමෘද්ධි බැංකු ගණුදෙනුකරුවන් මූල්‍ය විනයක් සහිත ආර්ථික මිනිසුන් බවට පත් කිරීම.

03. සමෘද්ධි බැංකු සංගම් සඳහා නව තාක්ෂණික බැංකු ක්‍රමය හඳුන්වාදීම.

04. ඉහත අරමුණුවලට අනුගත වෙමින් අඩු ආදායම්ලාභීන්ගේ දුප්පත්කම අවම කිරීම.

ඒ අනුව පිහිටුවන ලද සමෘද්ධි මහ සංගම් සහ සමෘද්ධි බැංකු සංගම්හී ප්‍රධාන මෙහෙයුම් කාර්යාලය බවට බැංකු මූල්‍ය කටයුතු අංශය පත්වූ අතර, ඉහත සඳහන් අරමුණු කරා එම ආයතන මෙහෙයවීම බැංකු මූල්‍ය කටයුතු අංශයේ වගකීම සහ කාර්ය භාරය බවට පත්විය.

1. සමෘද්ධි බැංකු සංගම්, සමෘද්ධි මහා සංගම්හී ණය, තැන්පතු , සංරක්ෂණ ඇතුළු සියළු මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ මගින් උපදෙස් ලබාදීම හා යාවත්කාලීන කිරීම.
2. සමෘද්ධි බැංකු සංගම්හි ගණුදෙනු ක්‍රියාකාරිත්වය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ණය (ප්‍රතිමූල්‍ය) පහසුකම් ලබාදීම.
3. සමෘද්ධි කාර්ය මණ්ඩලය සඳහා සේවක ණය ලබාදීම.
4. සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම්හී අරමුදල් ඵලදායීව ආයෝජනය කිරීම.
5. සමෘද්ධි බැංකු සංගම්වලට නව තාක්ෂණය හඳුන්වාදීම සහ පරිගණකගත කිරීම.

6 බැංකු සංගම්වල ගැටළු දුර්වලතා හා ප්‍රවනතා පිළිබඳව ප්‍රගති සමාලෝචන පැවත්වීම.
7 කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
8 බැංකු සංගම්වල අභ්‍යන්තර කළමනකාරිත්වය පරීක්ෂා කිරීම සඳහා අභඹු විසිත්තයන් කිරීම.
9 සමෘද්ධි බැංකු පද්ධතිය නිසි ලෙස මෙහෙයවීමට අවශ්‍ය වන සංරක්ෂණ (රක්ෂණ) ක්‍රම පවත්වාගෙන යාම.
10 සමෘද්ධි බැංකු සංගම්වල ක්‍රියාකාරිත්වයට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ (Policy mattars) අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම, තීරණ ක්‍රියාත්මක කිරීම.
11 සමෘද්ධි බැංකු සංගම් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දත්ත අවශ්‍ය ආයතන වලට යොමු කිරීම හා එහි ප්‍රගතිය විමසා බැලීම.

මේ අනුව බැංකු මූල්‍ය කටයුතු අංශයේ ක්‍රියාකාරිත්වය දෙයාකාර වේ.

01. සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන.
02. බැංකු මූල්‍ය කටයුතු අංශය තුල ක්‍රියාකාරිත්වය .

1. සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන.

බැංකු සංගම්හී ආරම්භය අදියර 07 කින් ක්‍රියාත්මක වූ අතර 2011.12.31 දින වන විට මුලතිව්, කිලිනොච්චිය මන්නාරම හැර අනෙකුත් දිස්ත්‍රික්කවල බැංකු සංගම් 1,043 ක් ක්‍රියාත්මක වේ.

මේ අනුව බලන විට සමෘද්ධි බැංකු සංගම් ලෙස ආරම්භ වූ ශාඛා ජාලය මෙරට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ දීප ව්‍යාප්තව විහිදී ඇති විශාලතම කුඩා මූල්‍ය බැංකු ආයතනික ව්‍යුහය බවට කෙටි කාලයක් තුලදී පත්වී ඇති අතර සමෘද්ධි බැංකු සංගම් පද්ධතිය ලෝකයේ සිව්වන විශාලතම කුඩා මූල්‍ය බැංකු ආයතනික ව්‍යුහය බවට ආසියානු සංවර්ධන බැංකුව විසින් හඳුනාගෙන ඇත.

සුළු මූල්‍යකරණයේ දැවැත්තයින් අතර, කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන සිටින සමෘද්ධි බැංකු සංගම් පද්ධතිය, දිළිඳුකම පිටු දැකීමෙ අරමුණුවලට අනුගත වෙමින් තැන්පතු ඒකරාශිකරණය අතින් විශේෂත්වයක් හිමි කරගෙන සිටින අතර, නව බැංකු තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කිරීම මූලික වශයෙන් ආරම්භ කර ඇත.

2010 වසර අවසානය වනවිට, බැංකු සංගම් 790 ක් මූල්‍ය ස්වයංපෝෂිත තත්ත්වයට පත්ව තිබු අතර, 2011 අවසානය වනවිට විවිධ මූල්‍ය අර්බුද හමුවේ. එම බැංකු සංගම් ප්‍රමාණය 728 ක් විය.

1.1 බැංකු සංගම්හී සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධනය ප්‍රගතිය - 2011.12.31

සමෘද්ධි ප්‍රතිලාභින් රු. 500/- ක කොටසක් මිලදී ගැනීමෙන් ඔවුනට සමෘද්ධි බැංකු සංගමයේ සාමාජිකත්වය හිමිවෙන අතර, ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

බැංකු සංගම්හී සාමාජිකත්වය ප්‍රගතිය - 2011.12.31

වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	වර්ධනය	වර්ධන අනුපාතය
1999	737,458	507,478	1,244,936		
2000	943,142	628,094	1,571,236	326,300	26
2001	1,042,158	663,905	1,706,063	134,827	9
2002	1,149,226	716,833	1,866,059	159,996	9
2003	1,275,273	777,222	2,052,495	186,436	10
2004	1,351,769	806,470	2,158,239	105,744	5
2005	1,428,848	824,846	2,253,694	95,455	4
2006	1,516,985	853,604	2,370,589	116,895	5
2007	1,575,509	872,490	2,447,999	77,410	3
2008	1,641,872	859,900	2,501,772	53,773	2
2009	1,691,112	896,947	2,588,059	86,287	3
2010	1,830,840	970,693	2,801,533	213,475	8
2011	1,881,808	987,740	2,869,548	68,015	2

වසර **13** ක් තුල සාමාජිකත්වයේ ව්‍යාප්තිය ඉහත සටහන මගින් දැක්වේ. 2010 වසර හා සසඳන විට 2011 වසර තුල ද බැංකු සංගම් සාමාජිකත්වය පසුගිය වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරන අතර, එම වර්ධන අනුපාතය 2% කි. විවිධ ආර්ථික හා සාමාජික ප්‍රශ්න හමුවේ මුල්‍ය ආයතන මුහුණ පෑ අර්බුදකාරි ආර්ථික තත්ත්වයන් තුල ද අපගේ සමෘද්ධි බැංකු සංගම් කෙරෙහි ගණුදෙනුකරුවන් තබනු ලබන විශ්වාසය මේ තුල ගම්‍යමාන වේ.

විශේෂයෙන් 2010 වසර අග භාගයේ සමෘද්ධි බැංකු හරහා හඳුන්වාදෙන ලද විදුලි අත්වැල වැනි විශේෂ ණය යෝජනා ක්‍රමයක් ද මීට බලපා ඇත.

සාමාජිකයින් ගෙවූ කොටස් මුදල

වර්ෂය	මුදල රු . ද. ලක්ෂ	වර්ධනය රු. ද. ලක්ෂ	වර්ධන අනුපාතය
1999	587.18		
2000	985.16	397.98	67.80
2001	1383.15	397.99	40.40
2002	1679.79	296.64	21.40
2003	1930.37	250.57	14.90
2004	2206.62	276.25	14.30
2005	2601.01	394.40	17.90
2006	3096.44	495.42	19.00
2007	3639.53	543.10	17.50
2008	3989.90	350.37	9.63
2009	4,212.42	222.52	5.58
2010	4,790.47	578.05	13.72
2011	5,370.53	580.06	12.11



වසර 12 ක් තුල කොටස ප්‍රාග්ධනයේ ව්‍යාප්තිය ඉහත සටහන මගින් පෙන්නුම් කෙරේ. ආරම්භක අවධියේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධන අනුපාතය 68% ක් වැනි ඉහල අගයක් පෙන්නම් කළ ද, පසුගිය වර්ෂ වලදී වර්ධන අනුපාතය සීඝ්‍ර ලෙස පහල ගොස් ඇත. ප්‍රවර්ථන වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව කොටස් ප්‍රාග්ධනයේ වර්ධනයක් පෙන්නුම් කලද වර්ධන අනුපාතිය මුල් කාලීන වර්ධනයට සාපේක්ෂව අඩු වී ඇත. කෙසේ වුවත් ප්‍රවර්ථන වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධනය සලකා බලන කල කොටස් ප්‍රාග්ධන අනුපාතයන් ඉහළ යාමත් පෙන්නුම් කෙරේ.මෙම තත්වය තවදුරටත් විශ්ලේෂණය කරමින් බැංකු සංගම්හී චිර පැවත්මට දායක වන පරිදි බැංකු මූල්‍ය අංශයේ ඉදිරි සැළසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

2010 වර්ෂයේ රු. මිලියන 4790 ක් වූ කොටස් ප්‍රාග්ධනය 2011 වර්ෂයේදී රු. මිලියන 5370 දක්වා වර්ධනයක් පෙන්නුම් කෙරේ.

1.2 බැංකු සංගම් තැන්පතු වැඩසටහන.

තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා)

වර්ෂය	සංඛ්‍යාව	වර්ධනය	මුදල රු.ද.ල	වර්ධනය රු.ද.ල
1999	1,424,652		768.96	
2000	2,645,574	1,220,922	2,033.45	1,264.50
2001	3,035,233	389,659	3,111.16	1,077.71
2002	3,296,569	261,336	3,857.10	745.94
2003	3,680,786	384,217	4,710.80	853.70
2004	3,989,539	308,753	5,751.81	1,041.01
2005	4,229,575	240,036	6,824.88	1,073.07
2006	4,394,498	164,923	8,131.66	1,306.78
2007	4,613,504	219,006	9,875.63	1,743.97
2008	5,081,229	467,725	11,356.79	1,481.16
2009	5,167,854	86,625	13,536.65	2,179.86
2010	5,505,853	337,999	15,906.77	2,370.12
2011	5,524,025	18,172	18,907.33	3,000.56

2011 වසර තුල මිලියන **3000** ක මුදල් තැන්පත් කරමින් බැංකු සංගම් වැඩසටහන කෙරෙහි තවදුරටත් විශ්වාසය තබා කටයුතු කර ඇති අතර, විශේෂයෙන් බැංකු සංගම් ඉලක්ක කර ක්‍රියාත්මක කරන ලද විශේෂ තැන්පතු වර්ධන වැඩසටහන් මෙම තැන්පතු ප්‍රසාරණය කෙරේ බලපෑම් කර ඇත. අනෙකුත් තරගකාරී ක්ෂුද්‍රමූල්‍ය ආයතන සමග සසදන විට මෙවන් වර්ධනයක් අත්පත් කර ගැනීම අගය කළ යුතුය

1.3 සමෘද්ධි බැංකු සංගම් ණය වැඩසටහන.

* සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩ නැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම බැංකු සංගම් ණය ක්‍රමය යටතේ සිදුවේ.

* සමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා හදිසි මුදල් අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.

* ස්වයං රැකියා, මිහිජය ණය, කිරුළ සංවර්ධන යොවුන් දිරිය වැඩසටහන් තුලින් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.100,000 සිට රු. 250,000/- දක්වා ණය නිදහස් කෙරේ. වගා කටයුතු සඳහා වූ අරමුදල් සඳහා රු. 75,000 දක්වා ණය මුදල් ලබාගැනීමට පහසුකම් ඇත. 2010 වසර අග භාගයේදී ක්‍රියාත්මක කරන ලද කිරුළ සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ එතෙක් ක්‍රියාත්මක කරන ලද ස්වයංරැකියා රු.100,000 යේ නම සීමාව රු.250,000/- දක්වා වැඩි කරන ලදී.

* නිවසක් ඉදිකිරීම, අඩක් නිමවූ නිවාසයක වැඩ අවසන් කිරීම. නිවස අළුත්වැඩියාව වැනි අවශ්‍යතා වෙනුවෙන් රු. 50,000/- දක්වා ණය පහසුකම් ලබාගෙන, නිවසේ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට සාමාජිකයින්හට අත්වැලක් සැපයීමට බැංකු සංගමය සූදානම්ය.

* හදිසි මුදල් අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයෙන් මිදී හිත ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් හට සහනයක් දී ඇත. 2010 වසර අවසානයේ ආරම්භ කරන ලද විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය යටතේ සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු අදායම්ලාභී බැංකු සංගම් සාමාජිකයන්ට පදිංචි නිවසට විදුලිය ලබාගැනීම සඳහා රු30,000/- ක උපරිමයකට යටත්ව ණය ලබාදීම සිදු වේ.

* වර්තමානයේදී, ආදායම් උත්පාදන ණය ව්‍යාපෘති සඳහා ලබාදෙන ණය සඳහා සමෘද්ධිලාභි සාමාජිකයින්ට, 8% ක්ද, අඩු ආදායම්ලාභින්ට 10% ක වාර්ෂික අනුපාතයට ලබාදෙන අතර, අනිකුත් ණය සඳහා 12% ක් වේ. (ස්වශක්ති හා විදුලි අත්වැල ණය හැර)

* 2011 වසර තුල සාමාජිකයින් **522,226** සහ රු.මිලියන **13,189** ක මුදලක් ණය ලෙස ලබා දී ඇත.

* 2011 ණය අයවීමේ ප්‍රතිශතය **111,90** (ඉදිරි වාරික අයවීම් ද ඇතුලත්ය. බොල් ණය අනුපාත 5.51% ක් වේ.

2011.12.31 දිනට ණය නිකුත් කිරීම්

වර්ෂය	සංඛ්‍යාව (සමුච්ත)	මුදල රු.ද.ලක්ෂ	වසර තුල ණය නිකුත් කිරිම රු.ද. ලක්ෂ
1999	209,818	966.31	966.31
2000	481,475	2,788.50	1,822.19
2001	813,334	5,552.75	2,764.24
2002	1,016,392	7,448.08	1,895.33
2003	1,340,126	10,503.30	3,055.22
2004	1,697,866	13,977.81	3,474.51
2005	2,149,135	20,725.03	6,747.22
2006	2,527,841	26,035.09	5,310.06
2007	2,952,840	32,843.04	6,807.93
2008	3,450,469	42,757.37	9,914.36
2009	3,721,662	48,352.73	5,595.36
2010	4,160,596	58,531.61	10,178.88
2011	4,682,822	71,721.04	13,189.43



ණය වර්ගීකරණය 2011.12.31 දිනට සමුච්චිත

ණය වර්ගය	රු.දලක්ෂ	දායකත්වය
ස්වයං රැකියා	37,838	53
වගා	8,987	12
වෙනත් (මිහිජය, ධීවර, ස්වශක්ති, ආපදා, කිරුල ණය, යොවුන් දිරිය)	2,257	3
පාරිභෝගික	2,855	4
ජනපුබුදු	13,456	19
නිවාස	6,328	9
එකතුව	**71,721**	**100**



1.4 බැංකු සංගම්හී අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල)

බැංකු සංගම්හී වත්කම් වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් මහ සංගම් හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජන කිරීමට අවසර ලබාදී ඇත. මේ මගින් මහ සංගම් මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

සමෘද්ධි බැංකු සංගම්හී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම.

වර්ෂය	මුදල රු. ද. ලක්ෂ	වර්ධනය රු. ද. ලක්ෂ	වර්ධනය %
1999	583		
2000	1,620	1,038	178
2001	3,175	1,555	96
2002	5,097	1,922	61
2003	5,914	817	16
2004	7,828	1,914	32
2005	7,417	-410	-5
2006	9,936	2,519	34
2007	13,791	3,855	39
2008	18,833	5,042	37
2009	24,039	5,206	28
2010	27,248	3,209	13
2011	39,048	11,800	43



සමෘද්ධි බැංකු සංගම්හී අතිරික්ත මුදල් ආයෝජනය ඉහත සටහන මගින් පෙන්නුම් කරන අතර, බැංකු සංගම් ආරම්භක අවධියේ ආයෝජන වර්ධනය ඉහළ අගයක් පෙන්නුම් කළද පසුකාලීනව එය පහල ගොස් ඇත. ණය වැඩසටහනේ ප්‍රසාරණය හේතුවෙන් ආයෝජනය කළහැකි අරමුදල් ප්‍රමාණය ක්‍රමිකව සීමා වී ඇත. එය සාධනීය ලක්ෂණයකි.

2. බැංකු මූල්‍ය කටයුතු අංශය තුල ක්‍රියාකාරකම්

බැංකු මූල්‍ය කටයුතු කටයුතු අංශය ලංකාව පුරා ස්ථාපිත බැංකු සංගම් හා මහ සංගම්හී මූල්‍ය මෙහෙයුම් ඒකකකය ලෙස කටයුතු කරගෙන යාමේදී ඊට අනුගාමී ලෙස අංශය තුළ විශාල කාර්ය භාරයක් සිදු කෙරේ.

ඒ අනුව බැංකු මූල්‍ය කටයුතු අංශයේ සියළුම වියදම් එම අංශය විසින් දරා ගනු ලබන අතර මීට අමතරව විගණන නිලධාරීන් සම්බන්ධ ගමන් වියදම්, විමර්ශන නිලධාරීන් සඳහා ගමන් වියදම්, බැංකු සංගම් වාර්ෂික වාර්තා සැකසීම සඳහා වැයකරන වියදම් සහ පුහුණු වියදම් මේ යටතට ඇතුලත්වේ. එසේම ප්‍රතිමූල්‍ය ණය බැංකු සංගම්වලට ලබාදීම, මිහිජය පොලී ප්‍රතිපූර්ණය කිරීම, කාර්ය මණ්ඩල ණය පහසුකම් සඳහා අරමුදල් සපයන්නේද බැංකු මූල්‍ය අංශයේ ආදායමෙනි. බැංකු සංගම් හා අදාල ප්‍රවර්ධන හා ප්‍රචාරන කාර්යයන් සඳහා ද මෙම අංශයෙන් මුදල් වැය කෙරේ.

බැංකු මූල්‍ය කටයුතු අංශයේ සමස්ත ආදායම හා වියදම පහත දැක්වෙන පරිදි වේ.

ආදායම	රු.ද. ලක්ෂ		වියදම	රු. ද. ලක්ෂ
ආයෝජනයෙන්	1315		අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා ගෙවූ පොලිය	835.3
ණයදීමෙන්	132		අංශයේ පරිපාලන වියදම්	171
බොල් ණය ආපසු අයවීම්	0		වියදම ඉක්මවූ ආදායම	441
අමතර ආදායම්	0.3			
	1447.3			1447.3





2.1 සමෘද්ධි බැංකු සංගම් හී අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් ක්‍රියාවළිය.

2.1.1 හැදින්වීම.

අඩු ආදායම්ලාභී ජනතාව වැඩි වැඩියෙන් ඉතිරි කිරීමට හුරු කිරීමක් වශයෙන් හා ඔවුන්ගේ අනාගත අභිවෘද්ධියෙ වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් වැඩසටහන ආරම්භ වුනි. මෙහිදී රජය මගින් දෙනු ලබන සහනාධාර මුදලින් යම්කිසි කොටසක් මාසිකව ඉතිරි කිරිම් අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස හදුන්වයි.

මේ වන විට සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන සහනාධාර මුද්දර අතරින් රු.1500, රු.1015, රු.900, රු.615 මුද්දර වලින් පිලිවෙලින් රු.300, රු.200, රු.150 ක් හා රු.100 ක මුදලක් අනිවාර්ය ඉතිරි කිරීම් වශයෙන් මාසිකව ඉතිරි කරනු ලබයි. මෙම මුදල් සමෘද්ධි අධිකාරිය වෙත ගෙන්වා ඉහළ පොලි අනුපාතිකයක් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කර ප්‍රතිලාභීන්ට සැහීමකට පත්විය හැකි ප්‍රශංසනීය ප්‍රතිලාභයක් ලබාදීම මේ වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් අදියර දෙකකින් ක්‍රියාත්මක වේ.

01 1999 නොවැම්බර් මස සිට මේ දක්වා එවන ලද අනිවාර්ය ඉතිරි කිරීම් අර මුදල් .
මෙහිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඒ ඒ ප්‍රතිලාභීන් අයත් වන බැංකු සංගම් නමින් අදාල සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් මාසිකව ආයෝජනය පිණිස සමෘද්ධි අධිකාරිය වෙත එවනු ලැබේ.

02 1995 සිට 1999 ඔක්තෝබර් දක්වා මහජන බැංකුවේ ලංකා බැංකුවේ ආයෝජිත අරමුදල් වලින් සමෘද්ධි බැංකුව සමග හොදින් ගණුදෙනු කරනු ලබන ප්‍රතිලාභීන්ගේ 25% ක් සතු අරමුදල් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ගෙන්වා ගෙන ආයෝජනය කිරීම.

අධිකාරියේ ආයෝජන කරන ලද අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් පහත පරිදි වේ.

2011.12.31 දිනට ආයෝජනය සඳහා ලද අනිවාර්ය ඉතිරි කිරීම්

වර්ෂය	අරමුදල් (රු.ද.ලක්ෂ)	වර්ධනය
2000	1045	-
2001	2424	56%
2002	3852	37%
2003	5510	30%
2004	6652	17%
2005	7349	9%
2006	8282	11%
2007	9099	9%
2008	9960	9%
2009	10,738	7%
2010	12,886	17%
2011	13,702	6%



2008 වසරට සාපේක්ෂව 2009, මෙන්ම 2011 වර්ෂයේදී වසරේදී අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් වර්ධනය යම් දුරකට අඩුවීමට හේතුව සමෘද්ධි සහනාධාර ලබන්නන්ගේ වෙනස්වීම බව මෙහි දී මතක් කළ යුතුය.

2.1.2. අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම.

ආයෝජනය සඳහා අධිකාරියට එවනු ලබන අනිවාර්ය ඉතුරුම් අරමුදල් ආයෝජන ඒකකය හරහා ආයෝජනය කිරීමෙන් උපයන ලද පොලී මුදලෙන් සෑම වසරක් අවසානයේම ඒ ඒ බැංකු සංගම් සඳහා පොලී ගෙවීම් සිදුකරනු ලැබේ. එමෙන්ම 2006 වසරේ සිටම සමෘද්ධි මහා සංගම් ක්‍රියාකාරි හා ශක්තිමත් කිරීමේ අරමුනින් මෙම පොලී ගෙවීම සමෘද්ධි මහා සංගම් ඔස්සේ සිදු කෙරේ. එලෙසම සමෘද්ධි මහා සංගම් /බැංකු සංගම් සඳහා තාක්ෂණික හා ඵලදායී ක්‍රම හඳුන්වාදීමේ අරමුනින් 2008 වසරේ සිට අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම සෘජුවම මහා සංගම් ජංගම ගිණුමට ප්‍රේෂනය කෙරිනි. එම ක්‍රියාකාරිත්වය තුලින් මේ මගින් බැංකු මුලා කටයුතු අංශයට ද වසරකට මිලියන 3 ක පමණ අමතර අදායමක් ලබාගැනීමට හැකිවිය. (මාර්ගස්ථ මුදල් රැඳවීමේ කාලය එක් දිනක් දක්වා අඩුකිරීම තුලින්) අනිවාර්ය ඉතුරුම් සඳහා ප්‍රතිලාභීන්ට ලබාදෙන පොලී ප්‍රතිශතය තරගකාරී වාණිජ බැංකු සමග සැසදීමේ දී ඉහල අගයක් ගන්නා අතර, එය ගිණුම් හිමි ප්‍රතිලාභීන්ට ලබාදෙන විශේෂ වරප්‍රසාදයකි.

වර්ෂය	ගෙවන ලද පොලී අනුපාතිකය %
2000	14.0
2001	17.75
2002	13.0
2003	8.1
2004	7.5
2005	7.75
2006	10.06
2007	14.0
2008	14.0
2009	14.0
2010	9.5
2011	7.1

2011 වසරේ මූල්‍ය වෙළඳ පොල පොලී අනුපාතය පහල අගයක් වූව ද අනිවාර්ය ඉතුරුම් සඳහා 7% පොලී අනුපාතිකයක් බැංකු සංගම් වෙත ලබා දීමට හැකිවීම අගය කල යුතුය. (මෙම වසරේ වානිජ බැංකු විසින් තම ඉතුරුම් වලට ලබාදුන්නේ 5.5% පොලී අනුපාතයකි.

අනිවාර්ය ඉතිරි කිරීම් ගෙවන ලද පොලිය.



2.2 ණය යෝජන ක්‍රමය

බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් බැංකු සංගම් විසින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමවලට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරන ගමන්, සමෘද්ධි අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ද ණය යෝජනා රැසක් දියත් කර ඇත. ඒ අනුව බැංකු මූල්‍ය කටයුතු අංශය මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන් පහත පරිදි වර්ග කර දැක්විය හැක.

2.2.1 ප්‍රතිලාභීන් සඳහා ණය යෝජනා ක්‍රමය

2.2.2 කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය

2.2.1 ප්‍රතිලාභීන් සදහා ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමය

2.2.1.1 ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය.

බැංකු සංගම් ණය ලබාදෙන්නේ තමා විසින්ම ඒකරාශීකරණය කරනු ලබන තැන්පතු වලිනි. ඒ සදහා බැංකු සංගම්වලට අවසර ඇත්තේ මුළු තැන්පතු වලින් 80% ක් දක්වා පමණි. ඉන් ඉදිරියට ලබාදෙන ණය සදහා ඇති වන මූල්‍ය දුෂ්කරතා පියවීම සදහා බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් බැංකු පොලී අනුපාතිකයට වඩා අඩු පොලි අනුපාතිකයක් යටතේ බැංකු සංගම්වලට ලබාදේ. ස්වයං රැකියා, වගා, ධීවර, සත්ත්ව පාලන, වෙළදාම මා සේවාමය ආදායම් උත්පාදන ව්‍යාපෘති සදහා ණය ලබාදේ. ප්‍රතිමූල්‍ය ණය යෝජනා ද්‍රව්‍ය, සමෘද්ධි මහ සංගම් හරහා සිදුවන අතර, බැංකු මූල්‍ය කටයුතු අංශය වාර්ෂික 4% කට මහ සංගම් සදහා ලබාදෙන අතර, මහ සංගම් විසින් බැංකු සංගම්වලට 7% පොලියට ප්‍රතිමූල්‍ය ණය අරමුදල් ලබදෙයි.

ප්‍රතිමූල්‍ය ණය වැඩසටහනෙහි ප්‍රගතිය 2011.12.31 දිනට

වර්ෂය	ණය සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදාහල මුදල රු.ද.ල	අයවීමේ ප්‍රතිශතය
1999	11	523	3	100%
2000	175	5,578	52	92%
2001	324	12,588	117	101%
2002	472	18,400	177	100%
2003	637	23,223	233	100%
2004	786	27,605	283	101%
2005	849	30,351	315.8	102%
2006	971	36,155	389	100%
2007	1,040	40,008	450	100%
2008	1,072	42,631	499.71	100%
2009	1,097	44,180	523.58	100%
2010	1,110	45,284	571.11	91%
2011	1,112	45,399	581.42	95%

ප්‍රතිමූල්‍ය ණය වැඩසටහනෙහි ප්‍රගතිය 2010.12.31



2.2.1.2 සබද , ජන පුබුදු, ගෙදර ණය වැඩසටහන.

මෙම ණය වැඩසටහන් 2010 වසර තුල අත්හිටුවා ඇති අතර, මෙම ණය යෝජනා ක්‍රමයට විකල්පයක් ලෙස ස්වයංරැකියා, පියස හා මිහිජය වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

2.2.1.3 විදුලි අත්වැල ණය වැඩසටහන.

සැමට විදුලිය සැපයීමේ අරමුණින් සමෘද්ධිලාභි හා අඩු ආදායම් ලාභි පවුල් ඒකක සඳහා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මෙම වැඩසටහනට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය මග පෙන්වන අතර ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ලංකා විදුලි බල මණ්ඩලය මේ සඳහා සක්‍රිය දායකත්වය සපයයි.

දීපව්‍යාප්ත සමෘද්ධි බැංකු සංගම් ජාලය හරහා එකවරම මෙම සහනදායි "විදුලි අත්වැල" ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල අරමුදල් බැංකු මූල්‍ය අංශය මගින් ලබා දෙනු ලබයි.

මෙම වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිලාභ වන්නේ අඩු අදායම් ලාභීන් විසින් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට අපේක්ෂිත සුළු කර්මාන්ත හා අලෙවි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂම කර ආර්ථික ශක්තිය ඉහල නැංවීම.

මේ නිසා සමෘද්ධි වැඩසටහන සඳහා ණය ඉල්ලුම වැඩිවී නව සාමාජිකයන් සමෘද්ධි බැංකු සංගම් වලට ඒකරාශි වී තැන්පතු වර්ධනය වීම.

බැංකු මූල්‍ය කටයුතු අංශය මගින් ලබාදෙන සේවා ගාස්තු නිසා බැංකු සංගම් වල ආදායම් ශක්තියද ඉහල නැංවීමට හැකි වීම. ඉහත හේතු නිසා සමෘද්ධි බැංකු සංගම් වල මූල්‍ය ශක්තිය, කාර්යක්ෂමතාවය, විශ්වාසය තවදුරටත් වර්ධනය වීම.

මෙම විදුලි අත්වැල ණය වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් වෙත ලබාදෙන උපරිම ණය මුදල රු. 30,000/= වන අතර මාස 60 ක කාලයක් තුල 12% වාර්ෂික පොළිය සමග ණය මුදල වාරික වලින් අයකර ගනු ලැබේ.

මෙහිදී විදුලි බල මණ්ඩලය මගින් හඳුන්වා දෙන ණය ඉල්ලුම් පත්‍රය අදාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් ලබා ගෙන මෙහෙයුම් උපදෙස් අංක 05 පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉල්ලුම් පත්‍ර පිලිවෙලින් සමෘද්ධි සංවර්ධන නිළධාරී, සමෘද්ධි කළමනාකරු, ප්‍රාදේශිය ලේකම් නිර්දේශ කර විදුලිබල මණ්ඩලය වෙත ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමෙන් පසු විදුලි පහසුකම් ලබාදෙනු ඇත.

2010 වර්ෂය තුල මෙම විදුලි අත්වැල ණය වැඩසටහනට සම්බන්ධ දිවි පාර්ශ්වික ගිවිසුම් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ලංකා විදුලි බල මණ්ඩලය ගිවිසුම් අත්සන් කල අතර එම වර්ෂය තුල ණය නිකුත් කිරීමක් සිදු කර නොමැත.

2011 වර්ෂය තුල මෙම වැඩසටහන සඳහා රු: මිලියන 350 ක මුදලක් බැංකු මූල්‍ය අංශය මගින් නිකුත් කර ඇති අතර, 2011 දෙසැම්බර් 31 වන දින වන විට රු: මිලියන 335 ක මුදලක් අයකර ගත යුතුව ඇත.

තවද විදුලිබල මණ්ඩලය 2011-12-31 වන දින වන විට පුද්ගලයන් 20,694 ක් සඳහා රු: මිලියන 353 ක විදුලිය සම්බන්ධතාවය ලබාදී ඇත.

2.2.2 ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා වන ණය යෝජනා ක්‍රමය

22.2.1 පාරිභෝගික ණය යෝජනා ක්‍රමය.

2004 පෙබරවාරි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන 2008 දක්වා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පමණක් වාර්ෂික පොලී අනුපාතය 9% ක ට රු. 50,000 ක ණය මුදලක් ලබාදෙන ලදී. දැනට මෙම ණය ක්‍රමය සියළුම කාර්ය මණ්ඩලයට විවෘතය. ණය මුදල ආපසු ගෙවීමේ කාලය මාස 60 කි. 2010.10.18 දින සිට 50,000/- ක් වූ ණය මුදල රු. 100,000/- වැඩි කරන ලදී. 2011.12.31 වනවිට රු. 100,000/- ණය මුදල් 3,731 ප්‍රදානය කර ඇත.

2011.12.31 දිනට සේව ක පාරිභෝගික ණය
(සමුච්චිත)

ලබාදුන් ණය සංඛ්‍යාව	මුදල රු.ද. ලක්ෂ	අයවීමේ ප්‍රතිශතය%
19,155	994.52	94.5
22,886	1,367.62	99.5

2.2.2.2 කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමය.

2004 ජූනි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා බැංකු මූල්‍ය කටයුතු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායම් මගින් ප්‍රතිපාදන වෙන්කෙරේ. ණය වැඩසටහන යටතේ ඉඩමක් මිලට ගැනීම, නව නිවසක් ඉදිකිරීම, නිවසක් මිලට ගැනීම හා නිවසක කොටසක් එකතු කිරීම හෝ පුළුල් කිරීම යන කරුණු සඳහා ණය ලබාදීම සිදු කරයි. ණය මුදලෙහි ආපසු ගෙවන කාලය වසර 15 දක්වා දීර්ඝ කර ඇත. නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2011.12.31 දිනට පහත පරිදි ණය නිකුත් කර ඇත. 2010.01.01 දින සිට අදාල පොලී අනුපාතය 10% දක්වා අඩු කර ඇත.

2011.12.31 දිනට නිවාස ණය
(සමුච්චිත)

ලබාදුන් ණය සංඛ්‍යාව	මුදල රු.ද. ලක්ෂ
1,838	762

2.2.2.3 යතුරුපැදි ණය යෝජනා ක්‍රමය.

2004 නොවැම්බර් මාසයේදී ආරම්භ වූ මෙම ණය වැඩසටහන සඳහා, බැංකු මූල්‍ය කටයුතු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායමින් ප්‍රතිපාදන වෙන්කෙරේ . ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් මෙම ණය වැඩසටහන සීමා වී ඇත. 10% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ උපරිමය රු .100,000 ක ණය මුදලක් මාස 60 ක ආපසු ගෙවීමේ කාලය මත යතුරු පැදි ණය ලබාදෙනු ලැබේ.

2011.12.31 දිනට යතුරු පැදි ණය
(සමුච්චිත)

ලබාදුන් ණය සංඛ්‍යාව	**මුදල රු.මි.**
3,557	299.7

2.3 සේවක ශාරීරික අනතුරු රක්ෂණය.

සමෘද්ධි බැංකු සංගම් සතු මුදල් බැංකු සංගම්වල සිට වානිජ බැංකුවල තැන්පත් කිරීමට ගෙනයාමේදී හා වානිජ බැංකුවේ සිට සමෘද්ධි බැංකු සංගම්වලට මුදල් ගෙනඒමේදී සිදුවන මුදල් මංකොල්ලකෑම්වලදී බැංකු කාර්ය මණ්ඩලයට සිදුවන ශාරීරික අනතුරු වෙනුවෙන් මෙම වැඩසටහන යටතේ වන්දි ප්‍රදානය කරනු ලැබේ. 2005 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාවට නැංවූ ශාරීරික අනතුරු රක්ෂණ අරමුදලට සෑම බැංකු සංගමයක්ම වසරකට රු. 1,000/- ක් ගෙවා රක්ෂණ ආවරණය ලබාගත යුතුය.

මේ යටතේ ලබාගත හැකි උපරිම වන්දි මුදල .
සමෘද්ධි කළමනාකරු රු .200,000/-
සමෘද්ධි සංවර්ධන නිලධාරී රු. 150,000/-

2011 වසරේ මෙම වැඩසටහන යටතේ රක්ෂණ වාරික ලෙස බැංකු සංගම් මගින් රු.1,434,700/- ක මුදලක් ලැබී ඇත. 2011 වසර සඳහා වන්දි ගෙවීම් කර නැත.

2.4 සමෘද්ධි බැංකු සංගම් අතරුදි මුදල් සංරක්ෂණය

2.4.1 සමෘද්ධි බැංකු සංගම්හී අතරුදි මුදල් හා එකී බැංකු සංගම්වල සිට වාණිජ බැංකුවලට රැගෙන ඒමේදී සහ රැගෙන යාමේදී ඇතිවන මුදල් සොරකම් කිරීම හෝ මංකොල්ලකෑම් වලදී මුදල්වලට ඇතිවන හානිය මෙමගින් ප්‍රතිපූර්ණය කෙරේ.

2.4.2 බැංකු සංගම් මහා සංගම්වල එදිනෙදා ද්‍රවශීලතා වුවමනාවන් සලකා බලා ඒ අනුව මෙම සංරක්ෂණ ආවරණය සඳහා බැංකු මූල්‍ය අංශයෙන් විමසිය හැක. ඒ සඳහා වාර්ෂිකව වාරික මුදල් බැංකු මූල්‍ය අංශයට එවා සංරක්ෂණ ආවරණය ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. එහි ප්‍රගතිය 2011.12.31 දිනට බැංකු සංගම් 1043 හා මහා සංගම් 203 ක් මෙම සංරක්ෂණය ආවරණය ලබාගෙන ඇත .

2.4.3 බැංකු සංගම් (ශාරීරික අනතුරු රක්ෂණ මුදල ද ඇතුලත්ව) හා මහා සංගම් විසින් එවන ලද වාරික මුදල් බැංකු මූල්‍ය අංශය විසින් ගොඩනංවා ඇති අරමුදලකට බැර කර ඵලදායී ආයෝජන යොදවා අරමුදල පුළුල් කර ඇත. ඒ අනුව ආයෝජනය කල මුදල 2011 වනවිට රු. ද.ලක්ෂ 113.52 ක් වේ.

2.4.4 2011 වසර සඳහා බැංකු සංගම් මගින් අතරැදි රක්ෂණ වාරික ලෙස රු. 14,166,584.76 ක මුදලක් එවා ඇත. 2011 වසර සඳහා වන්දි ගෙවීම් කර නැත.

2.5 තිරසාර කෘෂිකර්ම ජල කළමනාකරණ ව්‍යාපෘතිය

ඕස්ට්‍රේලියානු රජය ණය ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සමෘද්ධි බැංකු සංගම් හා ගොවිජන බැංකු හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය මගින් පූර්ණ කාලීන ගොඩ ගොවිතැනහි නිරත ගොවීන් වෙත අක්කර 1/2 ක් සඳහා සූර්ය බල බිංදු ජල වාරි කට්ටල ලබාදෙනු ලැබේ.

නව තාක්ෂණය භාවිතා කරමින් මනා ජල කලමණාකාරිත්වයකින් යුක්තව,නිෂ්පාදන වියදම් අවම කරමින් කුඩා ඉඩම්වල නිෂ්පාදන ඵලදායිතාවය වැඩිකර ගොවීන්ගේ ආදායම් තත්වය ඉහල නැංවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

සූර්ය බල බිංදු ජල සම්පාදන තාක්ෂණය යටතේ එළවළු , පළතුරු , මාංශ භෝග ,තෙල් භෝග වගා කිරීමට නිර්දේශිතය. මෙම වාරි පද්ධතියක් රු. 345,452.25 ක වටිනාකමකින් යුක්ත වන අතර සමෘද්ධිලාභි ගොවින් වෙත මෙහිදි වැඩි අවධානයක් යොමු කරමින් නව තාක්ෂණය යටතේ වගා කටයුතු සිදුකර වානිජ කෘෂිකර්මයට ප්‍රවිෂ්ඨ කරවිමෙන් ඔවුන්ගේ ආදායම් තත්වය වැඩිකර, ජිවන තත්වය උසස් කිරිමත්, සමාද්ධි බැංකු සංගම් වල මූල්‍ය ශක්තිය දියුණු කිරිමත් බැංකු මූල්‍ය අංශයේ අපේක්ෂාව වේ. මේ වනවිට සූර්ය බල බිංදුජල සම්පාදන වාරි කට්ටල 2715 ක් පමණ සමෘද්ධි බැංකු සංගම් හරහා ලබාදීමට කටයුතු කර ඇත.

2.6 බැංකු සංගම්, මහා සංගම් මූල්‍ය මෙහෙයුම් කටයුතු.

සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම්හී කටයුතු සෑම මුදල් වර්ෂයක් අවසානයේ එනම් ජනවාරි 1 වෙනි දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිදුවූ කටයුතු පිළිබඳ වාර්ෂික විගණන වාර්තාවක් සකස් කරයි. මෙම විගණන වාර්තා සකස් කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි වෙත ලබා දී ඇත.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි. 2011 වසරට පෙර විගණනය නොකළ බැංකු සංගම් හා මහ සංගම්වලට විගණනය කටයුතු බාහිර විගණන නිලධාරින් ලෙස රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයන්හි ගණකාධිකාරිවරු වෙත භාරදී සිදු කරන ලදී.

2.7 බැංකු අධීක්ෂණ ඒකකය.

බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ අනුව සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් මෙහෙයුම් ක්‍රියාවලිය විධිමත්ව සිදුවන්නේ ද යන්න අධික්ෂණ කිරිම හා මග පෙන්වීම් කටයුතු සිදු කිරිමටත් සමස්ත බැංකු සංගම් පද්ධති හා කාර්යක්ෂතාවය ඵලදායිතාවය වර්ධනය කිරිම අරමුණු කරගෙන “ බැංකු අධික්ෂණ ඒකකය” බැංකු මූල්‍ය කටයුතු අංශය තුල ස්ථාපනය කර ඇති අතර පහත සඳහන් කටයුතු එම ඒකකය තුලින් ඉටු කරනු ලැබේ.

* බැංකු සංගම් හා මහ සංගම්හි විගණන විමසුම් සෝදිසි විගණන වාර්තා මගින් හා වෙනත් ආකාරයෙන් ලැබෙන පැමිණිලි අනුව පසු විපරම් කටයුතු සිදු කිරීම, ඒ අනුව අනාවරණය වන අඩුපාඩු නිවැරදි කිරීම හා අභ්‍යන්තර විගණන, නීති විමර්ශන හා අදාල අංශ වෙත අවශ්‍ය තොරතුරු යොමු කර අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදු කරයි.

* බැංකු සංගම් හා මහ සංගම්වල ගිණුම් කටයුතු ආයතන කටයුතුවල හා දෛනික කටයුතුවල පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.

* මාසික කේවල ශේෂ පිරික්සුම් තුලනය කිරීමේ කටයුතු, බැංකු ජංගම සේවා, සමෘද්ධි බැංකු සංගම් ඒකාබද්ධ කිරීම, ස්වාභාවික ආපදා හේතුවෙන් බැංකු සමංගම්වලට සිදුවන හානි හේතුවෙන් බැංකු මෙහෙයුම් කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම හා නිවැරදි කිරීම් කටයුතු සිදු කිරීම.

* බැංකු සංගම්වල හා මහ සංගම්වල ඇති වන විවිධ කාලීන අවශ්‍යතා අනුව අවශ්‍ය මෙහෙයුම් උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කිරීම තුලින් බැංකු සංගම් හා මහ සංගම්වල ඵලදායිතාවය ඉහළ දැමීමට දායකවීම "බැංකු අධීක්ෂණ ඒකකය" මගින් සිදු කෙරේ.

* අඛණ්ඩව අධීක්ෂණය කිරීම මෙන්ම, ක්ෂණිකව ඇති වන අවශ්‍යතා සඳහා අවශ්‍ය සහාය ලබාදීම හා සම්බන්ධීකාරක කටයුතු පහසු කිරීම පිණිස බැංකු අධීක්ෂණ ඒකකය දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවීමට මේ වනවිට කටයුතු කරමින් පවතී.

2.8 පුහුණු කටයුතු

1043 වන සමෘද්ධි බැංකු සංගම් ජාලයේ හා 317 ක පමණ වන මහ සංගම් හි සේවය කරන කාර්ය මණ්ඩල බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරීම් බැංකු මූලා‍ කටයුතු අංශයේ පුහුණු ඒකකය මගින් සිදු කරයි.

ගණුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් සැකසීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුට ලබාදීමට කටයුතු කරයි. මෙයට අමතරව මහ සංගම් කටයුතු හා මහ සංගමයේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු මහ සංගම් කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කටයුතු කරනු ඇත. එසේම ක්ෂේත්‍රයේ රාජකාරි කරන සංවර්ධන නිලධාරින්ට ද බැංකු කටයුතු පිළිබඳ අවබෝධයක් ලබාදීමේ අරමුණින් විශේෂ පුහුණු වැඩසටහන් කීපයක් පවත්වන ලදී.

මේ අනුව 2011 වසර තුලදී පවත්වන ලද පුහුණු වැඩසටහන සඳහා 500 ක් පමණ බැංකු නිලධාරින් සහභාගි විය. මේ සඳහා රු. ද. ලක්ෂ 2 ක් පමණ වැය කොට ඇත.

2.9 කළමනාකරණ තොරතුරු ඒකකය

1043 ක් වූ සමෘද්ධි බැංකු සංගම්හී තොරතුරු කළමනාකරණය සිදුකෙරෙන්නේ බැංකු මුලාා කටයුතු අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මගිනි. ඒ අනුව සෑම බැංකු සංගමයක් හා මහ සංගමය මාසිකව තම බැංකු සංගම් ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු හා කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර බැංකු සංගම්හී පවතින තත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත් බැංකු සංගම්හි ප්‍රගතිය ඇගයීම සඳහා අවශා අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව බැංකු සංගම් ඇගයීම් සිදූ කිරිමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගී කරගෙන බැංකු සංගම් හා මහ සංගම්හි තොරතුරු බැංකු මුලාා කටයුතු අංශා වෙත සම්ප්‍රේෂණය කිරිමට කටයුතු කර ඇත.

සමෘද්ධි බැංකු සංගම් පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් බැංකු සංගම් පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරිම හා ඇගයීම් කාර්ය සිදූ කිරීමට කටයුතු කරනු ලැබේ.

2.10 අලෙවි ප්‍රවර්ධන ඒකකය.

බැංකු කරණය තුල වැදගත් අංශයක් වන අලෙවිකරණ මූලධර්මය මෑත කාලීනව සමෘද්ධි බැංකු සංගම් කේෂ්ත්‍රයට හඳුන්වාදීමට බැංකු මුලාා කටයුතු අංශය කටයුතු කර ඇත. ඒ අනුව සමෘද්ධි බැංකු සංගම්වල තැන්පතු ප්‍රවර්ධන කාර්යය උදෙසා බැංකු මුලාා කටයුතු අංශයේ අලෙවිකරණ ඒකකය මගින් විශේෂ වැඩසටහන් දියත් කර ඇත.

- 2011 වසර තුල හෙළ සංස්කෘතික සිරිත් හා ජන ක්‍රීඩා ඉදිරි පරපුරට රැකදීම හා සමෘද්ධි බැංකු සංගම් ජනතාව අතර ප්‍රචලිත කිරීම අරමුණු කරගත්, රට වටා සෑම බැංකු සංගමයක්ම ආවරණය වන පරිදි අළුත් අවුරු දු 1000 ක් පවත්වන ලදී. ඒ සඳහා ඉතුරුම් රු.ද. ලක්ෂ 11 ක මුදලක් බැංකු මුල්‍ය කටයුතු අංශය මගින් බැංකු සංගම්වලට දෙන ලදී.

- සමෘද්ධි බැංකු සංගම්වල ඉතුරුම් ප්‍රවර්ධනය සඳහ 2011 වසර තුල පහත වැඩසටහන් 8 ක් සැලසුම් කර දියත් කරන ලදී.

  I සිංහල - හින්දු අවුරුදු උත්සවයට සමගාමීව අවුරුදූ ගණුදෙනු සතියක් නම් කර එමගින් රු.ද.ලක්ෂ 606 ක තැන්පතු ඒකරාශී කරන ලදී.

  II 2011 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් දිරියමාතා තැන්පතු ප්‍රවර්ධන ක්‍රමෝපායක් බැංකු සංගම් 1043 තුල ක්‍රියාවට නංවා සාර්ථක ලෙස පවත්වන ලදී.

  III ලෝක ළමා දින පදනම් කරගෙන ළමා තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

  IV වෙසක් තෙමගුල සමරමින් “ 2600 වන සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙල ගැසෙමු” යන තේමාව යටතේ 2011 වසරේදී සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් 1000 ක් මූලික කරගෙන ප්‍රතිපත්ති හා ආමිස පූජා පවත්වා ආගමික ප්‍රබෝධයක් උද්දීපනය කිරීමට වෙහෙසක් දරණ ලදී.

  V තෛයිපොංගල් උත්සවය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන.

  VI නත්තල් උත්සවය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන.

බහුතරයක් බෞද්ධයන් වෙසෙන ප්‍රදේශවල 2011 වසර තුලදී බැංකු සංගම් 1000 ක් මූලික කරගෙන ප්‍රතිපත්ති හා ආමිස පූජා පවත්වා ආගමික ප්‍රබෝධයක් උද්දීපනය කිරිමට වෙහෙසක් දරන ලදී.

ධර්මදානයක් ලෙස සමෘද්ධි බැංකු සංගම්වල දායකත්වයෙන් බුදුසරණ වෙසක් කලාප ලක්ෂ 3 ක් ජනතාව අතර බෙදා දුන් අතර, ඊට සමගාමීව පවත්වන ලද ප්‍රධාන ජාතික වෙසක් උත්සවය සඳහා බැංකු මූල්‍ය කටයුතු අංශයේ දායකත්වය ලබාදෙන ලදී. බැංකු සංගම්වල හා මහ සංගම්වල ධර්මදේශනා 1000 ක් පවත්වා, අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරිමට දායක විය. තවද ළමා ගිණුම් ප්‍රවර්ධන අරමුණින් ළමයින් සඳහා පහන් කූඩු තරගයක්ද පැවැත්වීම කටයුතු කරන ලදී.

2011 නත්තල් දිනය නිමිති කරගෙන මීගමුව ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන නත්තල් උත්සවයක් අති උත්කර්ශවත් ලෙස පවත්වන ලදී. ඊට අමතරව නත්තල් වැඩසටහන් රැසක් කතෝලික ජනතාව වෙසෙන අනෙකුත් ප්‍රදේශවලින් පවත්වන කරන ලද ඉල්ලීම්වලට බැංකු මූල්‍ය කටයුතු අංශය දායකත්වය සපයන ලදී.

11 පොදු කරුණු.

11.1 නව වසර තුල අංශය මගින් දියත් කරන ලද අනෙකුත් වැඩසටහන් හා ක්‍රියාකාරකම්

- 2011 වර්ෂය සඳහා බැංකු සංගම් සඳහා ඉලක්ක පහක් සහිත විධිමත් පරිදි වර්ෂය පුරා විහිදී යන බැංකු සංගම් කටයුතු පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර බැංකු සංගම් ඒ සඳහා යොමු කරන ලදී.

  බොහෝ බැංකු සංගම් කටයුතු මේ වනවිට පරිගණක පහසුකම් සලසාදෙමින් අන්තර්ජාල පහසුකම් මගින් ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ තොරතුරු ඒකකය වෙත තොරතුරු ලබාදිම ද අවශ්‍ය මග පෙන්වීම කර ඇත.

- 2011 වසර තුල රාජ්‍ය ප්‍රතිපාදන යටතේ බැංකු සංගම් හා මහා සංගම්හී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

වැඩසටහන	ව්‍යාපෘති සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
අළුතින් ඉදිකරන ලද බැංකු සංගම් මහා සංගම් ගොඩනැගිළි	19	45
අලුත්වැඩියා කරන ලද බැංකු සංගම් මහා සංගම් ගොඩනැගිළි	164	86

- 2011 වර්ෂය තුල ගණකාධිකාරීවරුන් සහ විමර්ශන නිලධාරීන් සඳහා බැංකු සංගම් මහා සංගම් විසිත්ත කිරීම වෙනුවෙන් ගමන් වියදම් රු. 1,364,364.93 ක මුදලක් ලබාදෙනලදී.

- විමර්ශන කටයුතු සඳහා විගණන නිලධාරීන්ට ගමන් වියදම් බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් දරා ඇත. එම මුදල රු. 4,450,952/-ක් ලෙස ගිණුම් ගත වී ඇත.

- බැංකු සංගම් පරිගණකගත කර ඇති රත්නපුර, හම්බන්තොට, මොණරාගල අමතරව අනෙකුත් දිස්ත්‍රික්කවල වූ බැංකු සංගම් පරිගණකගත කිරිම සඳහා අවශ්‍ය වන මෘදුකාංග නිර්මාණය කිරිම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තෝරාගෙන ඇත. තවද සියළුම බැංකු සංගම්වල ප්‍රතිලාභින්ගේ දත්ත පද්ධතියක් ගොඩනැංවීමට කටයුතු ආරම්භ කර ඇත.

15.0 අභ්‍යන්තර විගණන අංශය

ආයතනික පරිපාලන රාමුව තුළ අභ්‍යන්තර පාලනයෙහි එක් අංශයක් ලෙස "අභ්‍යන්තර විගණනය" පෙන්වා දිය හැකිය. අභ්‍යන්තර විගණනය යනු නිරන්තරවම ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම උදෙසා දරනු ලබන ප්‍රයත්නයන් හා එම ප්‍රයත්නයන් ඉටු කර ගන්නේ ද යන්න පිළිබඳව නිරීක්ෂණ කිරිමත්, ඒ පිළිබඳව ආයතනයේ පරිපාලනය දැනුවත් කිරිමත්‍ය.

01. අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර පාලනයට උපකාරි වන්නා සේම ඉන් අභ්‍යන්තර පරිපාලන රටාවට සිදු කරනු ලබන සේවය ද අතිමහත්‍ය. විගණනය පුළුල් අර්ථයෙන් සලකා බැලීමේ දී එය ප්‍රධාන වශයෙන්ම අංශ දෙකකට වෙන් කොට සැලකිය හැකිය.

- කළමණාකරන විගණනය හා
- මූල්‍ය විගණනය යනුවෙනි.

1. කළමණාකරන විගණනයේ දී ආයතනික පරිපාලන රටාවන් හා තීරණයන් ද එම තීරණයන් ආයතනයේ ඉදිරි පැවැත්මට හේතු වූ ආකාරය පිළිබඳව මතයන් ප්‍රකාශ කිරිම මෙමඟින් සිදු කෙරේ.

   i. අධිකාරියේ පනත, එහි අරමුණු හා ප්‍රතිපත්ති අනුව කටයුතු කර තිබේද?
   ii. රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර තිබේද?
   iii. වාර්ෂික ක්‍රියාත්මක සැළැස්මට අනුව කටයුතු කර තිබේද?

   යන්නත්, කළමණාකරන තීරණයන් කුමන අන්දමකින් ආයතනයේ කාර්ය සාධනයට හේතු වී ද යන්නත්, විමසීමට ලක් කිරිමත් ඒ පිළිබඳව විගණනයේ නිරීක්ෂණ හා නිර්දේශ ආයතනයේ පාලන අධිකාරිය වෙත වාර්තා කිරීමත් සිදු කෙරේ.

2. මූල්‍ය විගණනයේ දී ආයතනයේ මූල්‍ය පරිපාලනය ආයතනයේ පැවැත්මට යොදා ගනු ලබන අන්දම පිළිබඳව වාර්ෂික සැලැස්මට අනුව සලකා බැලීම මේ යටතේ කෙරේ. අධිකාරියේ පනත හා එහි අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා

   i. 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන අනුව කටයුතු කෙරෙන්නේද
   ii. 1995 අංක 15 දරණ ගිණුම් හා විගණන ප්‍රමිතීන්ට අනුව කටයුතු කෙරෙන්නේද
   iii. භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් අනුගමනය කෙරෙන්නේ ද යන්න.
   iv. පරිපාලන රෙගුලාසි අනුගමනය කෙරෙන්නේද
   v. මුදල් රෙගුලාසි සහ අනිකුත් විධි විධානයන්ට අනුකූලව කටයුතු කෙරෙන්නේද යන්න පරික්ෂා කර බලා වාර්තා කිරිම ද වේ.

මෙම කාර්යයන් ඉටු කර ගැනීමේ දී යම් අක්‍රමිකතාවයන්, වංචා, දූෂණ ආදිය සිදු වී තිබේදැයි විමසා බලා ඒවා සම්බන්ධයෙන් අපරාධ නීතිය යටතේ හා සිවිල් නීතිය යටතේ කටයුතු කිරීම සඳහා පාලන අධිකාරියට යෝජනා ඉදිරිපත් කිරීම ද මෙමඟින් අපේක්ෂා කෙරේ.

අභ්‍යන්තර විගණන අංශය වෙත ලැබී ඇති කාර්යය මණ්ඩලය සහ සම්පත් උපයෝගී කරගෙන ප්‍රවර්ථන වර්ෂයේ විගණන කාර්යයන් සිදු කර ඇති අතර, සිදු කළ පරික්ෂණ වලින් නිරික්ෂිත කරුණු මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරිමද, විගණකාධිපති වෙත වාර්ෂිකව හා අර්ධ වාර්ෂිකව වාර්තා ලබා දීමද සිදු කරනු ලබන අනෙක් කාර්යයන් වේ.

02. වාර්ෂික සැලැස්ම හා ක්‍රියාකාරිත්වය

සාමාන්‍ය ක්‍රියාවලිය

ප්‍රවර්ථන වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන් අතර:

i. ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශයන් අභ්‍යන්තර විගණන පරික්ෂවට ලක් කිරීම.
ii. දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති සහකාර සමෘද්ධි කොමසාරිස් කාර්යාලයන් හි සියළුම කටයුතු අභ්‍යන්තර විගණන පරික්ෂාවට ලක් කිරිම
iii. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි සමෘද්ධි අංශයේ සියළුම කටයුතු අභ්‍යන්තර විගණන පරික්ෂාවට ලක් කිරිම
iv. කාලප කාර්යාල හා සමෘද්ධි බැංකු සංගම්, මහා සංගම් හි අධිකාරියේ නිලධාරින් විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිලිබඳ පරික්ෂාව
v. සමෘද්ධි වැඩසටහනේ ක්‍රියාකාරිත්වය විමසුමට ලක් කිරිම
vi. වෙනත් විශේෂිත පැමිණිලි හා පෙත්සම් පිළිබඳව පරික්ෂා කිරිම, විශේෂ පරික්ෂණ මෙහෙයවිම හා විමර්ශන කටයුතු සිදු කිරිම යනාදිය ද විය.

විශේෂ ක්‍රියාවලිය

i. මීට අමතරව, සමෘද්ධි බැංකු සංගම්හි (2010) වර්ෂය අවසානයේ ගිණුම් පිළියෙල කිරිමේ කටයුතු ද අප අංශය වෙත පවරා තිබූ අතර බැංකු සංගම්හි ලාභ අලාභ ගිණුම් නිවැරදි තත්වයට ගෙන ඒමත් ඒ අනුව ලාභ විසර්ජනය සඳහා ඉදිරි කටයුතු සැලසුම් කිරිමත් සිදු කෙරුණි.
ii. මෙම අධිකාරියේ විගණන හා කළමණාකරන කමිටුව නිසි පරිදි රැස් කිරිම, යෝජනා ඉදිරිපත් කිරිම හා කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරිම අභ්‍යන්තර විගණන අංශයට පැවරී ඇති විශේෂ කටයුත්තකි. එමඟින් පරිපාලනයට අදාලව තීරණ ගැනිමේ ක්‍රියාවලියට අපගේ සහභාගීත්වය ලබා දිම සිදු කෙරේ.

03. අභ්‍යන්තර විගණන වැඩසටහන

03.1 අභ්‍යන්තර විගණන වැඩසටහන සමස්ත දිවයිනේ පිහිටි සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාල මෙන්ම ප්‍රාදේශිය මට්ටමින් හා කලාප මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන ද විමසුමට ලක් කෙරෙන ලෙස සකසන ලද්දකි. මීට අමතරව මෙම වැඩසටහන මඟින් බැංකු සංගම් 1048 ක් මහා සංගම් 300 ක කටයුතු පිළිබඳව විමසීමට ලක් කරනු ලැබේ.

මේ අනුව

i. ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශයන්ද
ii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය /නියෝජ්‍ය සමෘද්ධි කාර්යාල/ කලාප කාර්යාලය
iii. සමෘද්ධි ලොතරැයි අරමුදල

iv. සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල
v. සමෘද්ධි අරමුදල
vi. සමෘද්ධි බැංකු සංගම් චක්‍රිය අරමුදල
vii. සමෘද්ධි නිලධාරින්ගේ සුභ සාධක අරමුදල
viii. සේවක ණය ක්‍රමය යනාදි අරමුදල් පිළිබඳව
ix. බැංකු සංගම් හා මහා සංගම් යන අංශ ද මෙමගින් පූර්ණ හා නියැදි පදනමින් පරික්ෂාවට ලක් කරනු ලැබේ.

03.1.1 ප්‍රවර්ථන වර්ෂයේ දී ද කාර්යය මණ්ඩලයේ හිඟතාවය අංශගත ප්‍රගතිය කෙරෙහි මහත් බලපෑමක් ඇති කරන ලදී. විශේෂයෙන්ම ක්‍රියාත්මක සැලැස්ම සම්පූර්ණ විගණන කාර්යය මණ්ඩලයක් ඇතිව සැලසුම් කළ ද එම අපේක්ෂාවන් ජය ගැනීමට සේවක මණ්ඩල හිඟතාවය ප්‍රබල වශයෙන් බලපෑමක් ඇති කළ බව සඳහන් කළ යුතුය.

ප්‍රවර්ථන වර්ෂයේ දී මිනිස් දින 29400 ක් වෙනුවෙන් කළ සැලැස්ම සේවක හිඟතාවය මත මිනිස් දින 3200 ක් පමණද හා කාර්ය මණ්ඩලය වෙනත් විශේෂ රාජකාරි සඳහා යෙදවීම හේතුවෙන් මිනිස් දින 3800 ක් පමණද අහිමි විය.(ප්‍රධාන අභ්‍යන්තර විගණක විශ්‍රාම ගැනිම මත මාස 03 ක පමණ කාලයක් නියෝජ්‍ය අභයන්තර විගණක විසින් රාජකාරි ඉටු කරන ලදී.) මේ නිසා මුල් සැලැස්මෙන් 24% ක් පමණ වූ ප්‍රමාණයක් අනුමත සැලසුමෙන් ඉටු කර ගැනිමට නොහැකි විය.

03.2 **අභ්‍යන්තර විගණන වැඩසටහන මඟින් විශේෂ අවධානය යොමු කළ අංශ**

අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව කාර්යාල පරික්ෂාවේ දී අවධානය යොමු කරන ලද මූලික අංශ ලෙස :

- අභ්‍යන්තර පාලන ක්‍රමවල යෝග්‍යතාවය - ප්‍රමාණාත්මක හා ගුණාත්මකව සොයා බැලීම
- වියදම් හා ඇත්හැරීම් විශ්ලේෂණය
- වංචා, දූෂණ හා අක්‍රමිකතාවයන් පිළිබඳව
- ක්‍රම හා පද්ධතින් පිළිබඳ අධ්‍යයනය කිරීම
- මූල්‍ය තොරතුරු හා දත්ත විශ්ලේෂණය

03.3 වර්ෂය තුළ සිදු කළ විගණන පරික්ෂණ

අභ්‍යන්තර විගණන අංශයේ පවතින කාර්ය මණ්ඩලය හා සම්පත් උපයෝගී කරගෙන වර්ෂය තුළ දී පහත පරිදි විගණන පරික්ෂණ සිදු කර ඇත.

කාර්යාලය	සංඛ්‍යාව
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාල	16
නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය	295
ප්‍රධාන කාර්යාලය	16
විශේෂ පරික්ෂණ	153
සමෘද්ධි බැංකු සංගම්	345
සමෘද්ධි මහා සංගම්	95
සමෘද්ධි බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනය	1130

03.4 විගණන විමසුම්

i. ප්‍රවර්ථන වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන විමසුම් අතර ගිණුම්කරණ දෝෂ පිළිබඳ විමසුම් 64 ක් වූ අතර ඊට ලද පිළිතුරු ප්‍රමාණය 36 කි.

ii. ප්‍රධාන කාර්යාලය ආශ්‍රිතව සිදු කරන ලද පරික්ෂණ 16 ක් අතුරින් නිකුත් කරන ලද විගණන විමසුම් ප්‍රමාණය 9 ක් වූ අතර ඉන් 7 කට පිළිතුරු ලැබී ඇත.

03.5 විශේෂ පරික්ෂණ මෙහෙයවීම.

ප්‍රවර්ථන වාර්ෂය තුළ දී විශේෂ පරික්ෂණයන් මෙහෙයවන ලද අවස්ථා 153 ක් වාර්තා විය. මෙම විශේෂ පරික්ෂණ වල ස්වභාවය අනුව වර්ගීකරණය මෙසේය.

- ගිණුම් තැබීම පමාවන් (ශේෂ පිරික්සුම් සකස් නොකිරීම)
- ගිණුම් ගත නොවීම
- වංචා, දූෂණ, අක්‍රමිකතා
- චක්‍රලේඛ උපදෙස් අනුගමනය නොකිරීම
- ණය ලබා දීමේ දී තැන්පත් බාර ගැනීමේ දී සිදු කරන අක්‍රමිකතා

මෙයින් පරික්ෂණ 67 කට අදාල වාර්තා වර්ෂය තුළ නිකුත් කර ඇති අතර, බොහෝ පැමිණිලි නිර්නාමිකව ලැබීමත් පරික්ෂණ අවස්ථාවල දී ඊට අදාල සාක්ෂි ඉදිරිපත් නොවීමත්, සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද, නිරික්ෂණ කරුණු අනුව ඊට හේතු කාරක වූ නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අධිකාරියේ අවධානය යොමු කර ඇත.

03.6 විගණන හා කළමණාකරන කමිටු රැස්වීම

ආයතනික දියුණුව උදෙසා කළමණාකරන හා මූල්‍ය අංශය අතර සමගාමී සම්බන්ධතාවයක් පැවතිය යුතු අතර, ඒ සඳහා විගණන හා කළමණාකරන කමිටුව සහ කාර්යය මණ්ඩලය කමිටු සාකච්ඡාවේ දී සලකා බැලේ. විගණන හා කළමණාකරන කමිටුව වර්ෂය තුළ දී වාර 08 ක් රැස්වීමට හැකි වූ අතර කමිටුව විසින් සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කළ කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා අදාල අංශ වෙත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇත.

03.7 සමෘද්ධි බැංකු සංගම් ගිණුම් විගණනය

i. සමෘද්ධි බැංකු සංගම්, මහා සංගම් හි වර්ෂ අවසාන ගිණුම් සඳහා විගණන මතය හා නිර්දේශ ලබාදීමේ දීප ව්‍යාප්ත වැඩසටහන මෙම වර්ෂය තුළ දී ද ක්‍රියාත්මක කළ අතර, එමඟින් 2009 හා 2010 වර්ෂ වලට අදාලව පිළිවෙලින් සමෘද්ධි බැංකු සංගම් 875 හා 255 ක් පමණ ගිණුම් විගණනයට භාජනය කරන ලදි.

ii. 2006,2007,2008 වර්ෂයන්ට අදාලව සමෘද්ධි බැංකු සංගම් 1395 ක් සඳහා විගණන මතයක් සහිත මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම ප්‍රවර්ථන වර්ෂය තුළ දී විශේෂ කාර්යයක් ලෙස සිදු කරන ලදී.

මෙම පරික්ෂණ අනුව නිරික්ෂිත කරුණු:

i. සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම්හි නිලධාරීන් විසින් ආයතනයේ පාලන අධිකාරිය මඟින් ලබා දුන් උපදෙස් වලට පටහැනිව කටයුතු කර ඇති අවස්ථා කිහිපයක් පිළිබඳව නිරීක්ෂණය වූ අතර, එමඟින් අධිකාරියට සිදු වී ඇති අහිතකර තත්වය මූල්‍යමය වශයෙන් හා පරිපාලනමය වශයෙන් ඇගයුමට ලක් කරන ලදී.

ii. සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් හඳුන්වා දී ඇති ගිණුම් පටිපාටින් හි පවතින දුර්වලතාවයන් මෙන්ම කාර්යය මණ්ඩලයන් ඊට අනුකූලව කටයුතු කිරිමේ දී පුහුණු කාර්යය මණ්ඩලයක අවශ්‍යතාවය පෙන්වා දීම.

iii. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි කළමණාකරුවන්ගේ වගකීම හා ප්‍රජාව වෙත ඔවුන්ගේ වගකීම කෙරෙහි දක්වන අල්ප සැලකිල්ල පිළිබඳව ද නිරික්ෂණය කරන ලදී.

iv. අයථා මූල්‍ය පරිහරණය හා සාවද්‍ය තොරතුරු මත ණය ලබාගන්නා අවස්ථා කිහිපයක් ද ඇති බව නිරික්ෂණය විය.

v. ක්ෂේත්‍ර නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් නිසි පරිදි නීතිරීති හා රෙගුලාසි අනුව කටයුතු නොකරන බව ද ඔවුන් ඒවා නොසලකා කටයුතු කිරීමද සිදු වූ අවස්ථා කීපයක් නිරීක්ෂණය විය

vi. රජයේ දායකත්වය හා අනෙකුත් දායකත්වයන් මත කෙරෙන කාර්යයභාරය වෙන් වෙන්ව පෙන්නුම් නොකරනු ලබන බව නිරීක්ෂණය වු කරුණු අතර වේ.

අනුමත සමස්ථ විගණන වැඩසටහන හා ක්‍රියාත්මක සැලැස්ම අනුව දුෂ්කරතාවයන්ට මුහුණපාමින් ප්‍රවර්ථන වර්ෂය තුළ දී ලබාගත් ජයග්‍රහනයන් අතර ක්‍රම හා පද්ධතින්ගේ ප්‍රතිසංවිධාන කටයුතු කෙරෙහි අධ්‍යාක්ෂ මණ්ඩලයට තහවුරු වීම සුවිශේෂි ජයග්‍රහනයක් වීමත්, එහි දී විගණනයට පිළිතුරු ලබා දීමේ දී අංශගතව පෙන්වනු ලබන උත්සහායන් අගය කළ යුතුය.

04. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩල සංයුතිය

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩලයට අයත් කාර්යාල හා ප්‍රදේශිය මට්ටමට අනුබද්ධිව ක්‍රියාත්මක වේ. එම කාර්යය මණ්ඩලයේ සංයුතිය මෙසේය.

තනතුර	මුළු ගණන	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාලය
ප්‍රධාන විධායක	02	02	-
විධායක නිලධාරීන්	03	03	-
විගණන නිලධාරීන්	63	13	50
විගණන කළමණාකරුවන්	65	02	63
සහායක කාර්ය මණ්ඩලය	03	03	-
අනෙකුත් සේවකයින්	05	05	-
මුළු සංඛ්‍යාව	141	28	113

16.0 විමර්ශන අංශය.

විනය ගරුකත්වය ආරක්ෂා කිරීම තුළ ආයතනික යහපාලනය පවත්වා ගැනීම පහසු වේ. විශේෂයෙන්ම විමර්ශන අංශයේ ක්‍රියාකාරිත්වය තුළින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ යහපැවැත්ම තහවුරු කරනවා පමණක් නොව, සමස්ථ ආයතනයේ කාර්යයන් හි දී විනිවිදභාවය ද ආරක්ෂා කෙරේ.

16.1 "විනය ගරුක කාර්ය මණ්ඩලයක් සඳහා" යන්න තේමාව කරගත් මෙම අංශයේ කාර්යය භාරය කාර්යාලීය සේවක මණ්ඩලයට මෙන්ම ආයතනය සමඟ කටයුතු කරනු ලබන බාහිර පාර්ශවයන්ගේ ද යහපැවැත්ම සඳහා හේතු වන්නකි. ආයතනික විනය කටයුතු පුළුල්වූත්, කාර්යක්ෂම වූත්, මට්ටමකින් පවත්වාගෙන යාම හා ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීමත්, විමර්ශනයක් තුළින් සේවා සේවක දෙපාර්ශවයට සහන සැලැසීමත් මෙම අංශයේ මූලික අරමුණ වේ.

16.2

16.2.1 විමර්ශන අංශයේ මූලික කාර්යභාරය හා එහි අරමුණ :-

01. ආයතනය තුළ විනය පවත්වා ගෙන යාමට සහායවීම.
02. වරද හඳුනාගැනීම. ඒ පිළිබඳව දැනුවත් කිරීම හා දඬුවම් නිර්දේශ කිරීම මඟින් වරදට පෙළඹවීමේ ප්‍රවණතාවය අවම කිරීමට සහාය වීම.
03. සමෘද්ධි නිලධාරීන් තුළ යහපත් පැවැත්ම පිළිබඳ ආකල්පමය වෙනසක් ඇති කිරීම.
04. අවභාවිතයට ලක් කළ මූල්‍ය හා භෞතික සම්පත් පිළිබඳව විමර්ශනය කොට වත්කම් කළමනාකරණයට සහාය වීම.

16.2.2 කාර්යයන්

- පැමිණිලි මත මූලික විමර්ශන කටයුතු මෙහෙය වීම.
- චෝදනා පත්‍ර සකස් කිරීම හා අදාල පුද්ගලයින් සඳහා නිකුත් කිරීම.
- පරීක්ෂණ සභා පත් කිරීම. (පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරීන් පත් කිරීම හා රැකවරණ නිලධාරීන් යොදා ගැනීම අනුමත කිරීම.)
- පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු
- විනය කඩවීම සම්බන්ධයෙන් වූ කටයුතු වලදී සමාද්ධි අධිකාරියේ අනෙකුත් අංශ සඳහා උපදේශණාත්මක සේවාවක් සැපයීම.
- පරීක්ෂණ සභාවෙන් අවසන් වාර්තා ලබා ගැනීම.
- විනය බලධාරියා වෙත පරීක්ෂණ සම්බන්ධ නිර්දේශ කර ඉදිරිපත් කිරීම.
- විනය නියෝග වලට එරෙහිව ලැබෙන අභියාචනා පිළිබඳ කටයුතු කිරීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම දක්වා විමධ්‍යගත කර ඇති විනය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහය වීම.
- විනය කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන කටයුතු කිරීම.

16.3 විනය පරීක්ෂණ

16.3.1 ප්‍රවර්තන වර්ෂය තුළ අත් කර ගත් ප්‍රගතිය.

	අවසන් කළ	තවදුරටත් පවතින
පවතින විනය පරීක්ෂණ	10	43

16.3.2 සමෘද්ධි කළමණාකරුවන්ගේ හා සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ විනය පරීක්ෂණ ප්‍රගතිය

වැඩ තහනම් කළ සංඛ්‍යාව	-	03
සේවයෙන් පහ කළ සංඛ්‍යාව	-	04

සමෘද්ධි සංවර්ධන නිළධාරින්ගේ විනය පරීක්ෂණ ප්‍රගතිය

වැඩ තහනම් කළ සංඛ්‍යාව	-	15
සේවයෙන් පහ කළ සංඛ්‍යාව	-	36

17.0 නීති අංශය

නීති ගරුකවූත්, විනයගරුකවූත්, හා යහපාලනයෙන් සමන්විතවූත් රාජ්‍ය ආයතනයක් ගොඩනැගීම සඳහා පෙර ගමන්කරුවකු වීම හා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ යහපැවැත්ම තහවුරු කිරීම පිණිස ආයතනයේ සමස්ථ කාර්යයන් විනිවිදභාවයකින් යුතුව පවත්වා ගැනීම මගින් උසස් සේවාවක් ජාතියට ලබාදී, දිළිඳුකම දුරලා, සමෘද්ධිමත් දේශයක් බිහි කිරීමට උරදීම අපේ ප්‍රධාන පරමාර්ථය වේ.

ආයතනික කටයුතු පුළුල්වූත්, කාර්යක්ෂමවූත් මට්ටමකින් ඉටු කර රාජ්‍ය සේව්‍ය, සේවක යන දෙපක්ෂයටම වැඩදායී ආයතනයක් බිහි කර ගැනීම නීති අංශයේ අරමුණු වේ.

කාර්යභාර්ය

(1) ආයතනය තුළ නීතිය හා විනය පවත්වාගෙන යාමට සහාය වීම.

(2) නීතිය පිළිබඳ දැනුවත් කිරීම මඟින් වරදට පෙළඹ වීමේ ප්‍රවනතාවය අවම කිරීම.

(3) සමෘද්ධි නිලධාරීන් තුල නීතිය හරහා යහපත් පැවැත්ම පිළිබඳ සුභවාදී ආකල්පයක් ඇති කිරීම.

කාර්යයන්:-

01. පැමිණිලි මත අධිකරණ කටයුතු මෙහෙයවීම.

02. නීතිය කඩවීම සම්බන්ධයෙන් වූ කටයුතු වලදී උපදේශනාත්මක සේවාවක් සැපයීම, නීතිමය ලේඛන සකස් කිරීම.

03. ආයතනය තුළ නීතිය හා විනය පවත්වාගෙන යාමට සහාය වීම.

04. වරද හඳුනාගැනීම - ඒ පිළිබඳව නෛතික උපදේශනය, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, එමඟින් වරදට පෙලඹවීමේ ප්‍රවනතාවය අවම කිරීමට සහාය වීම.

05. සමෘද්ධි නිලධාරීන් තුළ ´´නීතිය´´ පිළිබඳ දැනුම, අවබෝධය ලබාදීම තුළින් යහ පැවැත්ම පිළිබඳ ආකල්පමය වෙනසක් ඇති කිරීමට කටයුතු කිරීම.

06. අධිකාරිය විසින් පවරනු ලබන නඩු සම්බන්ධයෙන් ගරු අධිකරණයේ පෙනී සිටීම හා නියෝජනය වීම සහ අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නීතීඥ සහාය ලබා ගැනීමට කටයුතු කිරීම හා සම්බන්ධීකරණය කටයුතු කිරීම.

07. නීතිය කඩවීම සම්බන්ධයෙන් වූ කටයුතුවලදී උපදේශනාත්මක සේවාවක් සැපයීම, නීතිමය ලේඛණ සකස් කිරීම.

08. ආයතනය මගින් පත් කරන ලද නීතීඥ සංචිතයේ නීතීඥයින් සම්බන්ධීකරණය හා පසු විපරම් කිරීම.

09. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පවරනු ලබන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.

10. නිවාස ණය හා යතුරු පැදි ණය කටයුතු වලදී නීතිමය කටයුතු කිරීම.

11. ඉහත කාර්යන් සඳහා අදාල ලිපි ලේඛන පවත්වාගෙන යාම.

ප්‍රගතිය

1. ආයතනය වෙනුවෙන් පවරා ඇති නඩු වලින් වැඩි සංඛ්‍යාවක් ආයතනයේ වාසියට අධිකරණ තීන්දු ලැබී ඇත.
2. සමහර නඩුවලදී හිග වැටුප් රහිතව සේවය ලබා දීම පමණක් අධිකරණය විසින් සිදු කර ඇත.
3. සමෘද්ධි නිලධාරීන්ගේ නොසැලකිල්ල, අධීක්ෂණයකින් තොර වීම නිසා අධිකාරියට අවාසි සහගත තීන්දු ලැබී ඇත.
4. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නොදැනුවත්කමින් නීතිය ඉදිරියට පැමිණීමට මැලිකමක් දක්වන හෙයින් එවැනි අවස්ථාවලදී ද අධිකාරියට අවාසි සහගත තීන්දු ලැබී ඇත.

නීතිමය ක්‍රියා මාර්ගවල ප්‍රගතිය ,2011/12/31 දිනට

නඩු වර්ගය	තවදුරටත් පවතින
1. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	05
2. අභියාචනාධිකරණ නඩු	03
3. සිවිල් අභියාචනාධිකරණ නඩු	02
4. මහාධිකරණ නඩු	01
5. දිසා අධිකරණ නඩු	05
6. කම්කරු විනිශ්චයසභා නඩු	51
7. මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි	24
8. ඔම්බුඩ්ස්මන් පැමිණිලි	03

18.0 මූල්‍ය කළමනාකරණ අංශය.

ආයතනයේ මූල්‍ය පාලනය යන්නෙන් අදහස් කෙරෙන්නේ වියදම් සීමා කිරීම නොවේ. පවතින සීමිත සම්පත් උපරිම අයුරින් ඵලදායීව ආයතනයේ දියුණුව උදෙසා සොයා ගැනීමයි. මෙහිදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සහ බැංකු මූල්‍ය ඉතුරුම් හා ශේෂය ප්‍රතිපාදන ලෙසින් අධිකාරියට ලැබෙන සියළුම ලැබීම් ඒකරාශි කොට වඩා ක්‍රමවත්ව ආයෝජනය කිරීම හා කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික පරමාර්ථයයි.

18.1 සමෘද්ධි වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරිමේදි ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමටත්,මූල්‍ය විනය පවත්වා ගැනීමටත් යන ද්විත්ව කාර්යය ඉටු කිරිමට සහායවීම මෙම අංශයට පැවරී ඇත.

ප්‍රවර්ථන වර්ෂය තුලදි ක්‍රම හා පද්ධතීන්ගේ ප්‍රතිසංවිධානය ඇති කිරීමටත්, එම අංශ වල මූල්‍ය පරිපාලන ස්ථාන ගත කිරීමටත් පියවර ගන්නා ලදි.

විශේෂයෙන්ම වියදම් මූල්‍ය අංශය එක්ව සහයෝගීව කටයුතු කරන ලද අංශ මාසික ගිණුම් පද්ධතිය තුලට බැංකු සංගම් වල ආයෝජනයන් එක් කර ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව බැංකු මූල්‍ය ක්‍රමය තුළ කුඩා කණ්ඩායම් වලට මූල්‍ය පහසුකම් සැපයීමේ ක්‍රියාවලියේදි මෙම අංශයේ දායකත්වය ඉහළ මට්ටමක තීරණය විය.

18.2 මූල්‍ය අංශයේ කාර්යභාරය පහත පරිදි සාරාංශ කළ හැක.

- ❖ භාණ්ඩාගාරය මගින් ලබා ගන්නා හා මූල්‍ය සම්පත් ප්‍රධාන කොටගෙන වාර්ෂික අයවැය සකස් කිරීම. අයවැය සංශෝධනය කිරීම හා අයවැය පාලනය.
- ❖ සමෘද්ධි වැඩසටහන සඳහා ප්‍රාදේශියව මූල්‍ය සම්පත් ප්‍රධාන කොටගෙන වාර්ෂික අයවැය සකස් කිරීම. අයවැය සංශෝධනයක් සිදු කිරීම හා අයවැය පාලනය.
- ❖ සමෘද්ධි වැඩසටහන සඳහා ප්‍රාදේශීයව මූල්‍ය සම්පත් මුදාහැරීම,මූල්‍ය තොරතුරු රැස් කිරිම හා මූල්‍ය කළමනකාරණය කිරීම.
- ❖ සමස්ථ සමෘද්ධි වැඩසටහනේ ගිණුම්කරණ භාවය සුරකීම සඳහා ප්‍රාදේශීයව ගිණුම් තොරතුරු රැස් කිරීම සහ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් සමඟ ඒකාබද්ධව අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

- අවසාන මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම, විගණන විමසීම් මතුවන කරුණු සම්බන්ධව පසු විපරම් කිරිමේ හා නිවැරදි කිරිමේ ක්‍රියාවලිය සිදු කිරීම.

- කළමනාකරණ හා මෙහෙයුම් තීරණ සඳහා අවශ්‍ය මූල්‍ය දත්ත හා තොරතුරු ලබාදීම හා මඟ පෙන්වීම.

- ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ වත්කම් සුරක්ෂිත හා වැඩසටහන ඵලදායි ලෙස යොදා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කරන ලදි.

- සමෘද්ධි වැඩසටහනට සම්බන්ධ ආදායම රැස් කිරීම හා ගිණුම් ගත කිරීම.

- සමෘද්ධි සංවර්ධන වැඩසටහනට අදාළ සංවර්ධන වියදම් හා සේවක වැටුප් ඇතුළු සියළු වියදම් සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීම, වියදම් දැරීම හා ගිණුම් ගත කිරීම.

- සමෘද්ධි වැඩසටහනේ කාලීන අවශ්‍යතා මත අවශ්‍ය වන ගිණුම් ක්‍රම පිළිවෙත් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

- බැංකු සංගම් වෙත මුද්‍රිත ලිපි ද්‍රව්‍ය ලබාදීම වෙනුවෙන් ලැබෙන චෙක්පත් අදාළ දිස්ත්‍රික්කයන්ට ගිණුම් ගත කොට, බැංකු ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරිම සහ බැංකු සංගම් ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල් පවත්වා ගෙන යාම, අතිරික්ත මුදල් ශේෂ ආයෝජනය කිරීම හා ගිණුම් පවත්වා ගෙන යාම.

- ශ්‍රී ලංකා සමෘද්ධි අරමුදලට මුදල් රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා අවශ්‍යතාවයන්හීදි අරමුදල් ආයෝජනය කිරීම හා ගිණුම් ගත කිරීම.

- මාසිකව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් නිවාස සංවර්ධනය සඳහා අදාළ දායක මුදල් ගෙන්වා ගැනීම, ත්‍යාගලාභීන් සඳහා මුදල් නිදහස් කිරීම, ලොතරැයි වැඩසටහනට අදාළ වියදම් දැරීම, ඉතිරි මුදල් ඵලදායිව ආයෝජනය කිරීම හා මාසිකව හා වාර්ෂිකව ලොතරැයි අරමුදල පිළිබඳ අවසන් ගිණුම් සකස් කර ලොතරැයි භාරකාර මණ්ඩලයට ලබාදීම.

- සමෘද්ධි අධිකාරියේ සියළුම සැපයුම් කටයුතු සංවිධානය කිරීම.

- ගබඩා ද්‍රව්‍ය ලැබීම් සහ නිකුත් කිරීම් කටයුතු.

- සමෘද්ධි නිලධාරි සුභසාධක අරමුදලට මුදල් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අත්තිකාරම් ලෙස මුදල් නිදහස් කිරීම.

දෙවන කොටස

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
2011 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන
ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය 1995 අංක 30 දරණ සමෘද්ධි අධිකාරී පනතින් සංස්ථාපිත ආයතනයක් වේ. මෙහි කර්තව්‍ය වනුයේ සමාජයේ තරුණයන් ස්ත්‍රීන් හා අවාසි සහගත තත්ත්වයකට පත්ව ඇති කණ්ඩායම්වල ආර්ථික හා සමාජ තත්ත්වය වැඩි දියුණු කිරීම වේ.

මෙම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ගිණුම් කරණ සංකල්පවලට අනුව ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර තිබේ. මූල්‍ය ප්‍රකාශන සඳහා උද්ධමන සාධකයේ බලපෑම ගැලපීම් කොට නැත.

2. <u>ගිණුම් කාල පරිච්ඡේදය.</u>

ගිණුම් කාල පරිච්ඡේදය 2011-01-01 සිට 2011-12-31 දින දක්වා වේ.

3. <u>ප්‍රදාන ගිණුම් තැබීම.</u>

1. රජයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන ආදායම් වියදම් ගිණුමට හා ප්‍රාග්ධන ප්‍රදාන රජයේ දායකයට ගැලපීම් කර ඇත.

2. ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අරමුදල්වලින් ලැබීම් හා බැංකු මූල්‍ය අංශයෙන් ලැබීම් සහභාග අයිතිය යටතේ හා පුනරාවර්තන අවශ්‍යතා සඳහා අරමුදල්වලින් ලැබීම් හා බැංකු මූල්‍ය අංශයෙන් ලැබීම් ආදායම් වියදම් ගිණුමේ වෙනත් ආදායම් යටතේ දක්වා ඇත.

4. <u>වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම.</u>

i. ස්පෘශ්‍ය වත්කම් හා ක්ෂය වීම්.

ක්ෂයවීම් සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව පහත සඳහන් අනුපාතයන් අනුව ගණනය කොට ඇත. ඉඩම් හා දේපල ක්ෂය කර නොමැත.

ඉදිකිරීම් වැය	10%
යන්ත්‍ර සූත්‍ර හා ප්‍රචාරණ උපකරණ	20%
වාහන	20%
දුරකථන හා සවි කිරීම්	20%
කාර්යාල උපකරණ	20%
පරිගණක හා උපාංග	25%
අධ්‍යාපන උපකරණ	20%
පුහුණු මධ්‍යස්ථාන උපකරණ	20%
පුහුණු මධ්‍යස්ථාන යන්ත්‍ර	20%

පුහුණු මධ්‍යස්ථාන ගොඩනැඟිලි	5%
පුහුණු මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම	5%
ලී බඩු හා ගෘහ උපකරණ	20%
මුද්‍රණ යන්ත්‍ර හා වෙනත් උපාංග	20%
වායුසමන උපකරණ	20%
කෘෂි උපකරණ	20%
පරිගණක මෘදුකාංග	25%
වෙනත් උපකරණ	20%
මාධ්‍ය උපකරණ	20%
ක්‍රීඩා උපකරණ	20%
යතුරු ලියන	20%
තැපැල් මුද්‍රණ යන්ත්‍ර	20%
ගිනි ආරක්ෂිත කැබිනට්	20%
යන්ත්‍ර උපකරණ	20%
පුහුණු මධ්‍යස්ථාන වෙනත් උපකරණ	20%
පුහුණු මධ්‍යස්ථාන ලී බඩු	20%
මූලස්ථාන කළමනාකාර ලී බඩු	20%
පුස්තකාල පොත්	25%
කාර්යාල සුළු උපකරණ	20%
පරිගණක ජාලය	25%
බැංකු ගොඩනැඟිලි ඉදිකිරීම්	5%
බැංකු ගොඩනැඟිලි වැඩි දියුණු කිරීම්	5%
මහා සංගම් ලීබඩු උපකරණ	20%
මහා සංගම් දුරකථන පහසුකම්	20%
දුරකථන සම්බන්ධතා	20%

වත්කම් මිලට ගත් වර්ෂයේ සම්පූර්ණයෙන් ක්ෂයවීම් ගලපන අතර, ඉවත් කරන වර්ෂයේ ක්ෂයවීම් නොසලකා හරිනු ලැබේ. සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම් සඳහා ක්ෂය අනුපාත දක්වා නැත.

5. තොග

වෙළඳ තොග, ලිපිද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය ගබඩා ද්‍රව්‍ය තොග පිරිවැයට අගය කර ඇත. පිරිවැය ගණනය කර ඇත්තේ ප්‍රථම ලැබීම් ප්‍රථමව නිකුත් කිරීමේ පදනම මතය.

6. ණය ගැතියෝ හා වෙනත් අයවිය යුතු වට්නාකම්

උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු කළ වටිකමට ණයතැතියන් හා වෙනත් අයවිය යුතු වට්නාකම් දක්වා ඇත.

7. වගකීම් හා වෙන් කිරීම්

i. ජංගම වගකීම්

ජංගම වගකීම් වශයෙන් දක්වා ඇත්තේ නියමිත දිනයන්හි දී ගෙවිය යුතු හෝ ශේෂ පත්‍ර දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වට්නාකම් වේ.

ii විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ විශ්‍රාම ප්‍රතිලාභ වෙන් කිරීම සඳහා වන ගිණුම් ප්‍රතිපත්ති වන්නේ සේවකයින් සේවයට බැඳුන දින සිට සම්පූර්ණ කරන වර්ෂ ගණන අනුව විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ වෙන් කිරීමය.

8. ආදායම් හා වියදම්

i. ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කරනු ලැබේ.

ii. අධිකාරිය මඟින් සංවර්ධන වැඩසටහන් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත දැරූ ප්‍රාග්ධන වැය 100% ක් වෙන් කිරීම් කර ආදායම් වියදම් ගිණුමට ලියා හරිනු ලැබේ.

iii. අධිකාරියේ නිලධාරීන්ට ලබාදී ඇති ණය සඳහා ලද පොලීය සේවක ණය අරමුදලට බැර කරනු ලැබේ.

iv. අරමුදල්වලින් කරන ලද ආයෝජනවලින් ලද පොළී ආදායම් අදාල අරමුදලට බැර කරනු ලැබේ.

9. **සංවර්ධන වියදම් වශයෙන් 2008 වර්ෂයට පෙර කපා හැර තිබූ ව්‍යාපෘතිවලින් නැවත අයකර ඇති මුදල් හා ඉදිරියට අයවීමට ඇති මුදල් සඳහා ගැලපීම් ඇතුළත් කර සමෘද්ධි අරමුදල යටතේ ගිණුම් ගත කර ඇත. 2008 වර්ෂයේ සිට සංවර්ධන ව්‍යාපෘතිවලින් අයවන මුදල් සමෘද්ධි බැංකු යටතේ බැරවන බැවින් මෙම මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නැත.**

10. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ කර්තව්‍යය ඉටු කිරීමේදී ශාඛා කාර්යාල ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල පවත්වාගෙන යන අතර, ශාඛා ගිණුම් ක්‍රමයේ පවත්නා විමධ්‍යගත ශාඛා ක්‍රමය උපයෝගී කරගෙන ගිණුම් තැබීම සිදුකරනු ලැබේ. ඒ අනුව ප්‍රධාන කාර්යාලය විසින් එම දිස්ත්‍රික් කාර්යාල වෙනුවෙන් ශාඛා ජංගම ගිණුම් සැසඳීම් කිරීමෙන් අනතුරුව එම ගිණුමේ වර්ෂ අවසාන ශේෂය ශේෂ පත්‍රයේ ජංගම වත්කම් තුළ පෙන්නුම් කිරීම 2005 වර්ෂය දක්වා අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තිය වේ. මෙම ප්‍රතිපත්තිය වෙනස් කරමින් 2006 වර්ෂයේ සිට ගිණුම් සකස් කිරීමේදී දිස්ත්‍රික් ලේකම් ජංගම ගිණුමේ පවත්නා එකිනෙක ගිණුම් ශේෂ වෙන වෙනම ශේෂ පත්‍රය තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

සටහන් :-

1. අයෝජන යටතේ පෙන්වා ඇති කොටස් අයෝජන, මිල ලැයිස්තු ගත නොවන සමාගම්වල කරන ලද ආයෝජන වේ.

2. අරමුදල්වලින් දරණ ලද වියදම්, ආදායම් වියදම් ගිණුමේ සංවර්ධන වියදම් ලෙස පෙන්වා ඇති අතර, එම වියදමට සමාන මුදලක් ආදායම් වියදම් ගිණුමේ වෙනත් ආදායම් යටතේ වෙන වෙනම අරමුදල් වලින් ලැබීම් ලෙස පෙන්වා ඇත. මේ අනුව වර්ෂයේ අතිරික්තය/ (ඌනතාවයට) බලපෑමක් ඇති නොවේ.

3. මාධ්‍ය හා මෙහෙයුම් ඇගයුම් වැඩ සටහන සඳහා දරණ ලද වියදම් 2004 වර්ෂය දක්වා පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්වල පෙන්වා ඇති නමුත් මෙම වැඩසටහන සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ප්‍රතිපාදන ලබාදෙන බැවින් 2005 වර්ෂයේ සිට මාධ්‍ය හා මෙහෙයුම් ඇගයුම් වැඩසටහන් වල වියදම් සංවර්ධන වියදම් යටතේ 100% ක් වෙන් කිරීම් කර පෙන්වනු ලැබේ.

4. 2005 වර්ෂයේ සිට බලංගොඩ පුහුණු මධ්‍යස්ථානය අධිකාරිය යටතේ පාලනය වන ස්වාධීන ඒකකයක් ලෙස සලකා විමධ්‍යගත ශාඛා ක්‍රමය යටතේ ගිණුම් සකස් කරන ලදි. ඒ අනුව පුහුණු මධ්‍යස්ථානය සඳහා වෙනම ආදායම් වියදම් ගිණුමක් සකස් කර ඒ ඇසුරින් පුහුණු මධ්‍යස්ථාන ආදායම ගණනය කර පුහුණු මධ්‍යස්ථානයේ ගණුදෙනු ප්‍රධාන කාර්යාලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර ඇත. පුහුණු මධ්‍යස්ථානයේ පොදු කාර්ය වියදම් අධිකාරියේ අනෙකුත් පරිපාලන වියදම් යටතේ පෙන්වා ඇත.

5. බැංකු මූල්‍ය අංශය අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමට දායකත්වයක් සපයන අතරම ස්වාධීන ඒකකයක් ලෙස කටයුතු කරමින් ලාභ ඉපයීමේ නිරත වී ඇති බැවින් එම අංශයේ ගණුදෙනු ඇසුරින් වෙනම ආදායම් ප්‍රකාශයක් හා ශේෂ පත්‍රයක් සකස් කර එම අංශයේ ලාභය ගණනය කර ඇත. බැංකු මූල්‍ය අංශය අධිකාරිය යටතේ පවතින අංශයක් බැවින් ශේෂපත්‍ර අයිතමයන් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් හා ඒකාබද්ධ කර ඇත.

6. 2009 වර්ෂයේ සිට නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය අධිකාරිය යටතේ පාලනය වන ස්වාධීන ඒකකයක් ලෙස සලකා විමධ්‍යගත ශාඛා ක්‍රමය යටතේ ගිණුම් සකස් කරන ලදි. ඒ අනුව පුහුණු මධ්‍යස්ථානය සඳහා වෙනම ආදායම් වියදම් ගිණුමක් සකස් කර ඒ ඇසුරින් පුහුණු මධ්‍යස්ථාන ආදායම ගණනය කර පුහුණු මධ්‍යස්ථානයේ ගණුදෙනු ප්‍රධාන කාර්යාලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර ඇත. පුහුණු මධ්‍යස්ථානයේ පොදු කාර්ය වියදම් අධිකාරියේ අනෙකුත් පරිපාලන වියදම් යටතේ පෙන්වා ඇත.

7. විශේෂ වැඩසටහන් පිරිවැය ලෙස ගිණුම්වල සඳහන් වන රු: 1,000,000.00 ක පිරිවැය දරා ඇත්තේ දිළිඳුකම පිටුදැකීම සඳහා 2006 වර්ෂයේ පවත්වන ලද සාර්ක් සමුළුවේ වියදම වශයෙනි.

8. 2010 වර්ෂය දක්වා 20% ක්ව ක්ෂය අනුපාතයව පැවති පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම්, බැංකු ගොඩනැගිලි ඉදිකිරීම් සහ බැංකු ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් ගිණුම්වල ක්ෂය අනුපාතය 2011 වර්ෂයේ සිට 5% ක්ෂය අනුපාතයට ගැලපීම් කර ගිණුම්වල අදාල ගැලපීම් සිදුකර ඇත.

9. 2003 වර්ෂයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැටුප් මුදල් රු: 416,319.68 ක මංකොල්ලය මාර්ගස්ථ මුදලක් ලෙස ගිණුමේ පෙන්වා තිබුණු අතර, කෑගල්ල දිස්ත්‍රික් මහාධිකරණයේ පවතින මෙම නඩුව මෙතෙක් අවසන්ව නොමැති හෙයින් නඩු තීන්දුවෙන් තීරණය ලැබෙන තුරු කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්වල පෙන්වා ඇත.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
2011-12-31 දිනට ශේෂ පත්‍රය.

	සටහන්	2011			2010	
		රු:ශත			රු:ශත	
වත්කම්						
ජංගම නොවන වත්කම්						
දේපල පිරියත හා උපකරණ	1		**553,156,895.79**		472,821,130.94	
දේපල පිරියත හා උපකරණ - බැංකු	25		**1,088,134.00**		1,273,100.00	
ආයෝජන	2		**2,278,627,117.91**	**2,832,872,147.70**	2,187,855,069.80	**2,661,949,300.74**
ආයෝජන - බැංකු	24	15,694,945,197.00	**15,694,945,197.00**	15,694,945,197.00	15,437,355,884.00	15,437,355,884.00
සංවර්ධන වියදම්						
සංවර්ධන වියදම් පිරිවැය	3		**16,893,716,666.30**		14,648,866,372.09	
සංවර්ධන වියදම් වෙන්කිරීම්	4		**(16,893,716,666.30)**	-	(14,648,866,372.09)	-
ජංගම වත්කම්						
ලිපිද්‍රව්‍ය හා වෙළඳ තොග	5		**29,073,902.21**		23,571,928.64	
ණය ගැතියෝ	6		**1,899,980.88**		4,774,238.88	
ලැබිය යුතු ණය - බැංකු	23	1,928,513,820.00			1,043,904,524.00	
අඩුකළා :- බොල් ණය වෙන්කිරීම්		(181,155,092.00)	**1,747,358,728.00**			
වෙනත් වත්කම් - බැංකු	27		**1,187,980,697.00**		348,075,460.00	
අත්තිකාරම්	9		**108,652,260.67**		28,906,256.10	
තැන්පතු	7		**1,677,500.00**		1,677,500.00	
ලැබිය යුතු මුදල්	10		**1,224,005,795.11**		1,215,116,513.01	
ලැබිය යුතු සේවක ණය	8		**111,863,728.08**		105,566,616.57	
ලැබිය යුතු ආයෝජන පොළී	11		**50,193,844.78**		42,080,079.54	
ලැබිය යුතු රක්ෂණ වන්දි	13		**379,799.40**		351,349.40	
මාර්ගස්ථ මුදල්	12	32,125,153.12				
අඩුකළා :- මුදල් හානි සඳහා වෙන් කිරීම්		(416,319.68)	**31,708,833.44**		**215,495,981.13**	
බලංගොඩ පුහුණු මධ්‍යස්ථානය	44		**(0.00)**		(12,631.92)	
නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය			**25,000.00**			
මුදල් ශේෂය (දිස්ත්‍රික්)	14		**7,154,424.13**		1,655,050.87	
මුදල් ශේෂය (ප්‍රදේශීය)	14		**56,820,957.17**		142,687,010.57	
මුදල් හා බැංකු ශේෂය - බැංකු	26		**11,038,524.00**		6,666,493.00	
මුදල් ශේෂය (ප්‍රධාන කාර්යාලය)	16		**52,613,616.93**	**4,622,447,591.80**	240,880,697.85	**3,421,397,067.64**
මුළු වත්කම්				**23,150,264,936.50**		**21,520,702,252.38**

	සටහන්		2011 රු:ශත		2010 රු:ශත	
ස්කන්ධය හා වගකීම්						
රජයේ දායකත්වය	48		14,942,423,130.47		14,337,198,797.64	
ලොතරැයි අරමුදලෙන් දායකත්වය			21,706,291.20		21,706,291.20	
වත්කම් පැවරීම ප්‍රා.ලේ. බලංගොඩ			1,900,000.00		1,900,000.00	
බැංකු මූලා සසණ, සවණ, අරමුදල්වලින් දායකය			331,251,010.90		331,251,010.90	
බැංකු මූලා අංශයේ දායකය			12,587,376.38		12,587,376.38	
දායකය - සමෘද්ධි බලකාය			-			
ADB දායකය			149,655.00	15,310,017,463.95	149,655.00	14,704,793,131.12
සමුච්චිත අයිතිය						
අතිරික්තය - ඌනතාවය			(19,225,502,253.64)		(18,195,253,907.03)	
ප්‍රාග්ධන සංචිත - බැංකු	32		975,000,000.00		975,000,000.00	
රඳවාගත් ලාභය - බැංකු	32		3,743,532,057.00	(14,506,970,196.64)	3,302,894,384.00	(13,917,359,523.03)
				803,047,267.31		787,433,608.09
ජංගම නොවන වගකීම්						
අරමුදල්	17		3,314,764,456.83		3,127,214,080.40	
විශ්‍රාම පාරිතෝෂික බැදීම්	18		3,321,005,018.55		2,787,919,202.90	
පාරිතෝෂික මුදල් - ජල සම්පත් මණ්ඩල			377,941.49	6,636,147,416.87	377,941.49	5,915,511,224.79
තැන්පතු - බැංකු	29		12,527,974,903.00		11,710,328,652.00	
සහනදායී ණය ගැනීම් - බැංකු	30		1,350,490,903.00	13,878,465,806.00	822,145,936.00	12,532,474,588.00
පුස්තකාල පොත්			99,985.00	99,985.00	99,985.00	
ජංගම වගකීම්						
උපචිත වියදම් හා වෙන් කිරීම්	19		5,873,688.16		681,458,762.81	
ණය හිමියෝ	20		-			
වෙනත් වගකීම් - බැංකු	31		45,413,417.00		26,906,489.00	
පොදු තැන්පත්	20		114,604,323.16		94,959,513.65	
ගෙවිය යුතු මුදල්	21		1,619,305,796.99		1,322,927,370.28	
ටෙන්ඩර් තැන්පත් හා බැඳුම්කර	22		53,570.84		179,570.84	
නවෝදය විශේෂ තැන්පත්	15		3,724,756.67		4,414,945.13	
ප්‍රාදේශීය පොදු තැන්පත්	15		944,776.25		18,359,342.39	
රැඳවුම් මුදල්	15		42,584,132.25	1,832,504,461.32	135,976,852.40	2,285,282,831.50
මුළු ස්කන්ධය හා වගකීම්				23,150,264,936.50		21,520,702,252.38

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

2011-12-31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ආදායම් වියදම් ගිණුම.

	සටහන්	2011 රු:ශත	2010 රු:ශත
ආදායම්			
රජයේ දායකය (පුනරාවර්ථන)		**7,661,858,000.00**	**7,989,361,000.00**
මූලධන දායකය (සංවර්ධන ව්‍යාපෘති)		**2,023,115,739.33**	-
වෙනත් ආදායම්			
බැංකු මූල්‍ය අංශයෙන් ලැබීම්		71,533,984.63	39,707,061.66
සමෘද්ධි අරමුදලෙන් ලැබීම්	44	6,150.50	3,050.00
ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලෙන් ලැබීම්	45	5,069,475.55	2,389,924.50
නිවාස ලොතරැයි අරමුදලෙන් ලැබීම්	56	229,367,009.14	224,422,925.62
විවිධ ආදායම්	32	6,210,237.82	8,718,644.64
බලංගොඩ පුහුණු මධ්‍යස්ථානයේ අතිරික්තය	47	1,740,742.13	291,487.56
මුළු ආදායම		**9,998,901,339.10**	**8,264,894,093.98**
මෙහෙයුම් වියදම්			
කාර්ය මණ්ඩල පිරිවැය	33	8,159,621,793.90	7,406,755,057.51
ගමන් වියදම්	34	87,913,091.13	96,701,377.90
සැපයීම්	35	33,816,845.73	49,206,214.20
නඩත්තු වියදම්	37	18,258,106.51	17,312,002.93
ගිවිසුම්ගත සේවා	36	76,325,186.66	75,256,665.75
පර්යේෂක හා සංවර්ධන වියදම්	42	2,479,292,929.40	3,043,810,010.20
ක්ෂය		68,238,728.53	156,217,839.38
වෙනත් මෙහෙයුම් වියදම්	38	7,981,558.84	9,080,862.50
බැංකු මූල්‍ය අංශයේ වියදම්	40	25,234,480.69	15,173,333.25
නිල්ලඹ වියදම්	41	2,053,465.64	955,852.53
මුළු මෙහෙයුම් වියදම්		**10,958,736,187.03**	**10,870,469,216.15**
මෙහෙයුම්වලින් අතිරික්තය /(ඌනතාවය)		**(959,834,847.93)**	**(2,605,575,122.17)**
මූල්‍ය පිරිවැය	39	161,888.00	149,573.90
දේපල පිරියත හා උපකරණ විකිණීමේ ලාභය		-	167,080.00
අති විශේෂ අයිතම්වලට පෙර ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය)		**(959,996,735.93)**	**(2,605,557,616.07)**
වර්ෂයේ අතිරික්තය/ (ඌනතාවය)		**(959,996,735.93)**	**(2,605,557,616.07)**
පෙර වර්ෂයේ අතිරික්තය/ (ඌනතාවය)		**(18,195,253,907.03)**	**(15,730,186,264.40)**
පෙර වර්ෂයේ ගැලපීම්		**(70,251,610.68)**	**140,489,973.44**
පෙර වර්ෂයේ ගැලපීම් කළ පසු අතිරික්තය/ (ඌනතාවය)		**(18,265,505,517.71)**	**(15,589,696,290.96)**
ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)		**(19,225,502,253.64)**	**(18,195,253,907.03)**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
2011.12.31 දිනෙන් අවසාන කාල පරිච්ඡේදය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2011 රු:ශත	2010 රු:ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම්		
ආදායම් ඉක්මවූ වියදම්	**(959,996,735.93)**	**(2,605,557,616.07)**
ගැලපීම්		
ක්ෂය ගැලපීම්	**(130,609,294.74)**	156,336,131.88
පෙර වර්ෂ ගැලපීම්	**(70,251,610.68)**	140,489,973.44
පාරිතෝෂික බැදීම් සඳහා වෙන් කිරීම්	**533,085,815.65**	307,539,940.88
වැරදි නිවැරදි කිරීම්	**50,000,000.00**	(167,080.00)
සංවර්ධන වියදම්	**2,244,850,294.21**	2,816,994,110.08
රඳවාගත් ලාභය - බැංකු	**440,637,673.00**	395,107,823.00
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/ (ඌනතාවය)	**2,107,716,141.51**	**1,210,743,283.21**
ලිපිද්‍රව්‍ය හා වෙළඳ තොග (වැඩිවීම්) / (අඩුවීම්)	**(5,501,973.57)**	2,405,146.94
ණය ගැතියෝ (වැඩිවීම්) / (අඩුවීම්)	**2,874,258.00**	3,155,793.07
ලැබිය යුතු ණය - බැංකු (වැඩිවීම්) / (අඩුවීම්)	**(703,454,204.00)**	(10,353,873.00)
වෙනත් වත්කම් බැංකු (වැඩිවීම්) / (අඩුවීම්)	**(839,905,237.00)**	896,593,168.00
අත්තිකාරම් (වැඩිවීම්) / (අඩුවීම්)	**(79,746,004.57)**	(3,981,881.99)
ලැබිය යුතු මුදල් (වැඩිවීම්) / (අඩුවීම්)	**(8,889,282.10)**	104,095,893.24
ලැබිය යුතු මුදල් - 2118 ගිණුමෙන් නිල ගිණුමට	**-**	538,805.50
ලැබිය යුතු මුදල් ලිපිද්‍රව්‍ය අරමුදලෙන් නිල ගිණුමට	**-**	34,282.59
ලැබිය යුතු සේවක ණය (වැඩිවීම්) / (අඩුවීම්)	**(6,297,111.51)**	(3,988,083.35)
ලැබිය යුතු ආයෝජන පොලී (වැඩිවීම්) / (අඩුවීම්)	**(8,113,765.24)**	(31,231,597.47)
ලැබිය රක්ෂණ වන්දි (වැඩිවීම්) / (අඩුවීම්)	**(28,450.00)**	210,780.00
බලංගොඩ පුහුණු මධ්‍යස්ථානය (වැඩිවීම්) / (අඩුවීම්)	**(12,631.92)**	17,611.17
නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය (වැඩිවීම්) / (අඩුවීම්)		6,000.00
උපචිත වියදම් වැඩිවීම / (අඩුවීම්)	**(675,585,074.65)**	76,361,921.93
ණය හිමියෝ	**-**	(14,502,746.00)
වෙනත් වගකීම් - බැංකු	**18,506,928.00**	(14,441,245.00)
පොදු තැන්පත් වැඩිවීම / (අඩුවීම්)	**19,644,809.51**	94,853,530.65
ටෙන්ඩර් තැන්පත් වැඩිවීම් (අඩුවීම්)	**(126,000.00)**	142,780.00
ගෙවිය යුතු මුදල් වැඩිවීම / (අඩුවීම්)	**296,378,426.71**	21,027,864.55
ගෙවිය යුතු මුදල් - 1350 ගිණුමෙන් 2118 ගිණුමට	**-**	(538,805.50)
නවෝදය විශේෂ තැන්පත්	**(690,188.46)**	(423,408.81)
නිවාස ලොතරැයි දායක මුදල්		(65,660.00)
ප්‍රදේශීය පොදු තැන්පතු	**(17,414,566.14)**	(853,198,537.70)
රැඳවුම් මුදල් වැඩිවීම / (අඩුවීම්)	**(93,392,720.15)**	3,711,671.89
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය 01	**5,963,354.42**	**1,481,172,693.92**

ආයෝජන ක්‍රියාකාරකම්		
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	(50,805,071.76)	(258,658,766.11)
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් - බැංකු මූලා	184,966.00	(1,273,100.00)
ස්ථාවර වත්කම් ඉවත්කිරීම්	51,078,601.65	167,080.00
ආයෝජන	(90,772,048.11)	(246,841,047.07)
අයෝජන බැංකු මූලා	(257,589,313.00)	(2,049,022,115.00)
රජයේ ප්‍රදාන ලැබීම්	605,224,332.83	3,236,000,000.00
සංවර්ධන වියදම්	(2,244,850,294.21)	(2,816,994,110.08)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය 02	(1,987,528,856.60)	(2,136,622,058.26)
මූලා ක්‍රියාකාරකම්		
අරමුදල්	187,550,376.43	229,197,769.09
අරමුදල් (බැංකු)	-	99,985.00
තැන්පතු බැංකු	817,646,251.00	885,779,869.00
සහනදායී ණය ගැනීම් - බැංකු	528,344,967.00	(96,083,676.00)
මූලා ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය 03	1,533,541,594.43	1,018,993,947.09
මුදල් හා මුදල්වලට ආසන්න දෑ වල ශුද්ධ වැඩිවීම්	(448,023,877.75)	363,544,582.75
කාල සීමාව ආරම්භයේ මුදල් සහ මුදල්වලට ආසන්න **අයිතමයන්**	607,801,553.10	244,256,970.35
කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල්වලට ආසන්න අයිතමයන්	159,777,675.35	607,801,553.10
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල්වලට ආසන්න අයිතමයන්		
මාර්ගස්ථ මුදල් ශේෂය	32,125,153.12	215,912,300.81
මුදල් හා බැංකු ශේෂ (දිස්ත්‍රික් ලේකම්)	7,154,424.13	1,655,050.87
මුදල් හා බැංකු ශේෂ (ප්‍රාදේශීය)	56,820,957.17	142,687,010.57
මුදල් හා බැංකු ශේෂ (ප්‍රධාන කාර්යාලය)	52,638,616.93	240,880,697.85
මුදල් හා බැංකු ශේෂය (බැංකු මූලා)	11,038,524.00	6,666,493.00
	159,777,675.35	607,801,553.10

වයිඑස්/බී/එස්ඒ/එෆ්ඒ/2011/03   2013 ජනවාරි   දින

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාර පනතේ V කොටසේ අංක 17 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලද. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2012 ඔක්තෝබර් 10 දින නිකුත් කරන ලදි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ

සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය

(අ) මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන දායක මුදල් වලින් බැංකු මූල්‍ය අංශයේ සමෘද්ධි බැංකු සංවර්ධන වැඩ සටහන් සඳහා ලබාදී තිබූ රු. මිලියන 200 ක මුදල සමාලෝචිත වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුමේ පර්යේෂණ හා සංවර්ධන වියදම් තුල ඇතුලත් කර තිබුණද, ඊට අදාල අරමුදල් ලැබීම ආදායම් වියදම් ගිණුමේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානයෙන් ලද රු.571,093 ක මුදලක් පෙර වර්ෂ ගැලපුම් ගිණුමට බැර කිරීම හේතුවෙන් නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානයෙන් ලැබිය යුතු මුදල් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) බැංකු මූල්‍ය අංශයේ රු. මිලියන 241 ක අරමුදල් භාවිතා කරමින් ඉදිකළ ගොඩනැගිලිවල වටිනාකම ජංගම නොවන වත්කම් තුල පිළිබිඹු නොකෙරිණි.

(ඈ) කොටසක් රු.14.50 බැගින් පෞද්ගලික බැංකුවක කොටස් 5,557,188 ක් මිලදී ගැනීම සඳහා රු.80,579,226 ක් ගෙවා තිබුණද ආයෝජන ගිණුමේ රු.55,571,880 ක් ලෙස සටහන් කර තිබීමෙන් ආයෝජන වටිනාකම රු.25,007,346 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) ලිපිද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ඉදිකළ ගබඩා ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.1,251,404 ක් ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම් ගතකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඊ) සමෘද්ධි බැංකු සංගම් පරිගණක ගතකිරීමේ මූලික කටයුතු වෙනුවෙන් බැංකු සංගම් 932 ක් සඳහා ලබාදී තිබූ රු.23,300,000 ක් පරිගණක මෘදුකාංග මිලදී ගැනීමක් වශයෙන් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර ඒ වෙනුවෙන් රු.5,825,000 ක් වාර්ෂික ක්ෂය ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් පිළිවෙලින් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් හා ඌනතාවය රු.23,300,000 කින් හා රු.5,825,000 කින් වැඩියෙන් දැක්වුණි.

(උ) ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ වර්ෂය අවසාන තොග ආගණනයේදී ඇතිවූ රු.3,289,139 ක තොග වෙනස ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂය අවසානයට අරමුදලේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුල ලද රු.13,008,268 ක් වූ සේවක නිවාස ණය පොළී, නිවාස ණය ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ පොළී ආදායම සහ වර්ෂය අවසානයට නිවාස ණය ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(එ) බැංකු මූල්‍ය අංශයෙන් ප්‍රදානිත සේවක ණය ශේෂය වූ රු.1,236,097,118 ක් සඳහා වර්ෂය අවසානයට අයවිය යුතු පොලිය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

පහත සඳහන් ගිණුම්වල ශේෂයන් ඒවාට අදාල උපලේඛන ශේෂයන් සමඟ 2012 දෙසැම්බර් වන විටත් සසඳා නොතිබුණි.

විෂයය	ගිණුම් අනුව ශේෂය	උපලේඛනය අනුව ශේෂය	වෙනස
	රු.	රු.	රු.
සේවක බයිසිකල් ණය	99,739,615	99,698,832	40,783
සේවක නිවාස ණය	612,096,738	610,909,336	1,187,402
ජන පුබුදු ණය	221,930	82,117	139,813

2.2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 5 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.1,899,981 ක් වූ අවිනිශ්චිත ණයගැති ශේෂයන් 4 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මෙම ණයගැති ශේෂ විගණනයට සනාථ කර දීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ආ) කඩිනම් ණය නියාමක වැඩසටහන 2006 වර්ෂයේ සිට අක්‍රියව පැවතියද ඒ වෙනුවෙන් රාජ්‍ය බැංකු 2 ක තැන්පත් කර තිබූ ඇප මුදල් වලින් රු.558,771 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) බැංකු මූල්‍ය අංශයේ ලිහිල් ලෙජර් පත්‍රිකා මුද්‍රණය වෙනුවෙන් වූ ගෙවීම්වලට අදාල වැට් බදු දෙවරක් ගෙවීම හේතුවෙන්, ගිණුම් අංශය වෙත ලබාදුන් අත්තිකාරම් වශයෙන් 2007 වර්ෂයේ සිට බැංකු මූල්‍ය අංශයේ ගිණුම්වල ලැබිය යුතු ලෙස දැක්වුණු රු.517,304 ක ශේෂය මුදල් අමාත්‍යාංශයෙන් ආපසු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

(ඈ) මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණ ලබාදෙන තෙක් බැංකු මූල්‍ය අංශයේ අරමුදල් උපයෝගී කරගෙන සමෘද්ධි බැංකු සංගම් වෙත ලබාදී තිබූ ජන පුබුදු ණය සඳහා වූ සහන පොලී රු.156,433,387 ක් 2012 සැප්තැම්බර් වන විටත් මහා භාණ්ඩාගාරයෙන් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ඉ) ලැබිය යුතු මුදල් ගිණුමේ ඇතුලත් රු.45,364 ක ශේෂයක් 2009 වර්ෂයේ සිට අයනොවී ඇතත්, සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) භාග්‍යා පුවත්පතින් සමෘද්ධි අරමුදල වෙත අයවිය යුතු රු.379,064 ක් අයකර ගැනීමකින් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක සිට ලැබිය යුතු ශේෂයක් වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
(අ) රජයේ ප්‍රාග්ධන දායකත්වය	554,419,261	වත්කම් මිලදී ගැනීම සඳහා යොදවා ඇති ආකාරය දැක්වෙන විස්තරාත්මක ලේඛන
(ආ) සේවක පාර්තෝගික ණය	524,260,761	විස්තරාත්මක උපලේඛන, නිවැරදිව සකස් කළ ගිණුම් ප්‍රකාශ
(ඇ) යටිතල පහසුකම් ව්‍යාපෘති දෙකකට ලබාදුන් ප්‍රතිපාදන	400,000	අදාල ව්‍යාපෘති සඳහා වැය කළ බව සනාථ කරන තොරතුරු
(ඈ) සංවර්ධන වියදම්	2,044,850,294	මහා භාණ්ඩාගාරයෙන් ලද දායකයට අමතරව දරා තිබූ රු.21,734,555 ක මුදල සපයාගත් ආකාරය පිළිබඳ විස්තර, වැඩසටහන් 4 කට අදාල එකතුව රු. 22,424,054 ක විස්තරාත්මක වාර්තා

2.2.5 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත 5 (ඊ) හා 20 (1) වගන්ති	සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් සපයා ගැනීමට ජාතික ලොතරැයි මණ්ඩලයේ සහාය ඇතිව ලොතරැයි පැවැත්වීමට කටයුතු කළ යුතු නමුත් ඒ සඳහා පිහිටුවන ලද ලොතරැයි අරමුදල මගින් වසර ගණනාවක සිට ලොතරැයි පවත්වා නොතිබුණි.
(ආ) ආයතන සංග්‍රහයෙ XXXII පරිච්ඡේදයේ 2.3.2 වගන්තිය	මැතිවරණයකදී අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන නිලධාරියෙකුට නාමයෝජනා පත්‍ර භාර ගන්නා දිනට සතියකට පෙර සිට මැතිවරණ දිනය දක්වා වූ කාල සීමාව සඳහා ඔහු/ඇය පඩි රහිත නිවාඩු ලබා සිටිය යුතු නමුත් පළාත් පාලන මැතිවරණය - 2011 සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වූ අධිකාරියේ නිලධාරීන් 23 ක් සම්බන්ධයෙන් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) <u>මුදල් රෙගුලාස</u>	
(i) මු. රෙ. 715	කාර්යාලයීය භාවිතය සඳහා හෝ තාවකාලිකව තබා ගැනීම සඳහා හෝ නිසි බලය ඇතිව නිලධාරීන්ට, ශාඛාවනට හෝ ඒකකයනට පවරා දුන් බඩු නිසි පරිදි භාරගත් බව හඟවන ලියවිලිත් සමඟ ඒවා හඳුනාගත හැකිවන පරිදි ඉන්වෙන්ට්‍රි නිකුත් කිරීම් හා ලැබීම් පත් වල ඒ ඒ භාණ්ඩයන්හි අනන්‍යතාවය හඟවන අංක සඳහන් කළ යුතු වුවද, ඩිජිටල් වර්ගයේ කැමරා 20 ක් හා ලැප්ටොප් වර්ගයේ පරිගණක 20 ක් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතා ඉටුවන ආකාරයෙන් කටයුතු කර නොතිබුණි.
(ii) මු.රෙ. 1646	සෑම වාහනයකම දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ අදාල මාසයට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරියේ වාහන 33 කට අදාලව 2011 වර්ෂයේ මාස 4 ක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 - 4:2:1 ඡේදය	ආයතනයක ප්‍රසම්පාදන අස්ථිත්වය විසින්, අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් අධිකාරිය විසින් එවැනි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

- 4:2:2 (ආ) ඡේදය	ආයතනයක ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළ යුතු වුවත්, සමෘද්ධි කොඩි දින ආකෘති පත්‍ර හා බැනර් මුද්‍රණය සඳහා එවැනි කාල සටහනක් සකස් කර නොතිබුණි.

(ඉ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය	අධිකාරය සතු පරිගණක සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඊ) 2003 ජුනි 02 දිනැති අංක පී ඊ ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 ඡේදය හා මුදල් රෙගුලාසි අංක 756	වාහන සම්බන්ධව වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි.
(උ) අංක පීඑෆ්/එෆ්එස්/ඒ - වාහන/2009 හා 2010 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය 03 සහ 05 ඡේද	අළුත්වැඩියා කළයුතු තත්වයට පත්වී ඇති වාහන මාස 03 ක් ඇතුලත අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අළුත්වැඩියාවට හෝ අපහරණයට අවශ්‍ය කටයුතු කළයුතු වුවද, අධිකාරයේ වාහන 10 ක් කාර්මික දෝෂයන්ට ලක්වී මාස 3 1/2 සිට වසර 2 දක්වා කාලයක් ගතවී තිබුණද, ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඌ) 2008 දෙසැම්බර් 06 දිනැති අංක 2009/05 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාර චක්‍රලේඛයෙ අ.1(V) (VI) ඡේද	ඉටුකරනු ලබන එක් එක් කොන්ත්‍රාත්තුවලට අදාල සියළුම ලියකියවිලි අදාල සමෘද්ධි සමිති/සමෘද්ධි බලකාය විසින් පවත්වා ගෙන යායුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක සමෘද්ධි බලකාය/සමෘද්ධි සමිති 14 ක් විසින් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(එ) 2009 මාර්තු 03 දිනැති අංක 177 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණ	සමෘද්ධි ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනා නොගත් අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම්වල ශේෂ රාජ්‍ය ආදායමට බැර කරනු පිණිස මහා භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවද, එකතුව රු.12,467,468 ක් වූ හඳුනා නොගත් අනිවාර්ය ඉතිරිකිරීම් 2011 පෙබරවාරි සිට 2012 අගෝස්තු දක්වා මහා භාණ්ඩාගාරය වෙත නොයවා නිසි අනුමැතියකින් තොරව අධිකාරයේ වියදම් සඳහා භාවිතා කර තිබුණි.

(ඒ) සමාජ සංවර්ධන පදනම් ව්‍යවස්ථාව (i) අරමුදල් භාවිතය	- අරමුදලේ කටයුතු පිළිබඳ වාර්තාවක් මාස 06 කට වරක් අධිකාරිය වෙත යැවිය යුතු වුවද නියැදි පරීක්ෂාවට භාජනය වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක සමාජ සංවර්ධන පදනම් විසින් මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. - සෑම වසරකම ආදායමින් අවම වශයෙන් 80% ක් අරමුදලේ අරමුණු සහ පරමාර්ථ වලට අනුකූලව එම වර්ෂය තුලම වියදම් කළ යුතු වුවද, දිස්ත්‍රික්ක 7 ක ඇතැම් සමාජ සංවර්ධන පදනම් මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) රැස්වීම්	සමාජ සංවර්ධන පදනම අවම වශයෙන් මසකට වරක් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල එක් සමාජ සංවර්ධන පදනමක් රැස්වීම් පවත්වා නොතිබූ අතර තවත් සමාජ සංවර්ධන පදනමක් එක් රැස්වීමක් පමණක් පවත්වා තිබූ බව නියැදි පරීක්ෂාවක දී නිරීක්ෂණය විය.
(iii) අරමුදල් රැස්කිරීම හා ගිණුම් තැබීම	මත් හා දුම්වැටි විරෝධී කොඩි සතිය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙත සපයන ද්‍රව්‍ය සඳහා වන මුද්‍රණ වියදම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් විසින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වෙනුවෙන් රු.2,500 ක මුදලක් අයකරගෙන අධිකාරිය වෙත ලබා දිය යුතු වුවද, 2011 වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24 ක් 2012 දෙසැම්බර් මාසය වනතුරුත් එම මුදල් ලබාදී නොතිබුණි.
(iv) විගණනය	පදනම් ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු අතර ආදායම් වියදම්, මාසික ගිණුම් වාර්තා පිටපත් අධිකාරියට එවිය යුතුය. දිගින් දිගටම මේ පිළිබඳව අධිකාරිය දැනුවත් කර ඇති නමුත් දිවයිනේ එකම සමාජ සංවර්ධන පදනමක හෝ 2011 වර්ෂයේ ගිණුම් විගණනය කර නොතිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.959,996,736 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.2,605,557,616 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,645,560,880 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම්වල 21% ක වැඩිවීමක් මෙයට හේතුවී තිබූ අතර ඒ කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ රු. මිලියන 2,023 ක රජයේ මූලධන දායකය වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කිරීම විය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන දායකය රු. මිලියන

328 කින් හෙවත් 4% කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ථ වියදම ඉකුත් වර්ෂයට වඩා 1% කින් වැඩිවී තිබුණ ද පර්යේෂණ හා සංවර්ධන වියදම් 18% කින් අඩුවීම හා කාර්ය මණ්ඩල පිරිවැය 10% කින් වැඩිවීම කැපී පෙනුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යමණ්ඩල පිරිවැය සමස්ථ මෙහෙයම් වියදමින් 74% ක් වූ අතර එය මුළු ආදායමෙන් 82% කි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 කාර්ය සාධනය

4.1.1 අරමුදල් ගිණුම් පවත්වාගෙන යාමේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාජ සංවර්ධන අරමුදල

සමාලෝචිත වර්ෂය අවසානයට දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක සමාජ සංවර්ධන අරමුදලේ පැවති ශේෂ පිළිබඳ විස්තර 2012 දෙසැම්බර් මාසය වනවිටත් අධිකාරිය වෙත ලබා ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ආ) සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007, 2008, 2009, 2010 හා 2011 වර්ෂ සඳහා නිවාස සංවර්ධන ලොතරැයියේ දිනුම් ඇදීම් වලදී දිනුම් ලද එහෙත් 2012 නොවැම්බර් මාසය වන විටත් අදාල ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය නොකළ දිනුම් 380 කට අදාල මුදල් වටිනාකම රු. මිලියන 57 ක් විය.

(ii) දත්ත පද්ධති නිසි පරිදි යාවත්කාලීන නොවීම හා ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව ලබා නොගැනම හේතුවෙන් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව වාර්ෂිකව ප්‍රදානය කළයුතු ත්‍යාග වලින් 12% සිට 18% දක්වා පරාසයක ත්‍යාග ප්‍රමාණයක් ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර නොමැති බව නිරීක්ෂණය විය.

4.1.2 අපේක්ෂිත අරමුණු උදෙසා පාවිච්චි නොකළ අරමුදල්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2001 වර්ෂයේ සිට පැවති සමෘද්ධි ලොතරැයි අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂය රු.55,173,447 ක් වූ අතර, 2011 වර්ෂය තුලද අරමුදලේ අරමුණු ගත කාර්යයන් කිසිවක් ඉටුකර නොතිබුණි.

(ii) සමෘද්ධි බැංකු සංගම්වල ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ අරමුණෙන් පිහිටුවන ලද සමෘද්ධි බැංකු සංගම් ප්‍රවර්ධන හා ප්‍රචාරණ අරමුදලෙහි සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂය රු.20,487,000 ක් වූ අතර, එය අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. 2009 වර්ෂයේ සිට පැවති මෙම අරමුදලෙන් පිළිවෙලින් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී අරමුණුවලට පටහැනිව රු.208,000 ක් හා රු.55,000 ක් වැය කිරීම හැර වෙනත් කටයුත්තක් ඉටුකර නොතිබුණි.

(iii) සමාජයේ විවිධ අවාසි සහගත තත්ත්වයන් හමුවේ අසරණභාවයට පත්වන පුද්ගලයින්ට උපකාර කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇති සමාජ සංවර්ධන අරමුදල සඳහා සමෘද්ධි කොඩි අලෙවියෙන්, දානපතීන්ගේ මුදල් ආධාර හා වෙනත් නිර්මාණශීලී වැඩ සටහන් තුලින් රැස්කරගන්නා අරමුදල් එම කොට්ඨාශය තුලම අරමුණු ගත කාර්යන් සඳහා වැය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 200 ක් සතුව පැවති රු.91,120,903 ක් අදාල අරමුණු සඳහා වැය නොකර නිෂ්කාර්යව පැවතුණි.

4.1.3 සමාලෝචිත වර්ෂය තුල අධිකාරියේ අංශ 12 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් සඳහා ප්‍රතිපාදනය කර තිබූ මුදල රුපියල් මිලියන 3,284.1 ක් වුවද, වැය කර තිබූ මුදල රු. මිලියන 2,257 ක් වූයෙන් ප්‍රතිපාදනවලින් 31% ක් ඉතිරිවී තිබුණි.

4.1.4 අධිකාරියේ සංවර්ධන අංශ 8 ක් විසින් සිය කාර්යයන් ඉටු කිරීමේදී 2011 වර්ෂය වෙනුවෙන් සැලසුම් කළ වැඩ සටහන් 37 කට අදාල ව්‍යාපෘති ඒකක 136,547 කින් ව්‍යාපෘති ඒකක 73,364 ක් හෙවත් 54% ක් පමණක් ඉටුකර තිබුණි.

4.1.5 අධිකාරියේ අංශ 5 ක් විසින් ඉටුකිරීමට අපේක්ෂිත රු. මිලියන 119.46 ක ප්‍රතිපාදන සලසා තිබුණු වැඩසටහන් 4,762 ක් වර්ෂය තුල ඉටුකිරීමට අපොහොසත්ව තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මහලේකම් කාර්යාලයක් ඉදිකිරීම

අධිකාරියට මහලේකම් කාර්යාල පරිශ්‍රයක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් 2003 වර්ෂයේදී රු.37,560,000 ක් වැයකර බද්දට ගෙන තිබුණු අතර බදු ගිවිසුම අළුත් කිරීම වෙනුවෙන් 2010 වර්ෂයේදී රු.346,383 ක් වැය කර තිබුණි.

(i) බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ඉඩම සංවර්ධනය කිරීම සඳහා අවස්ථා දෙකකදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් අවස්ථාව ලබාදී තිබුණද සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අධිකාරිය අපොහොසත්වීම මත බදු ගිවිසුම අවලංගු කර තිබුණි.

(ii) මෙම ඉඩමෙහි අධිකාරියේ ලිපිද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා 2010 වර්ෂයේදී රු.1,888,210 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර ගිවිසුම අවලංගුවීම මත එම ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පළිබඳව අදාල පාර්ශවයන් සමඟ එකඟතාවයකට පැමිණීමට 2012 සැප්තැම්බර් වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(iii) එසේ වුවද අධිකාරියේ ප්‍රධාන කාර්යාලය “සෙත්සිරිපාය” ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන අතර 2011 වර්ෂය සඳහා කුලී වශයෙන් රු.61,925,132 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබණි.

(ආ) අධිකාර්ය විසින් ආයතන දෙකක ආයෝජනය කර තිබූ රු.5,250,000 ක් සඳහා එම ආයෝජන සිදුකළ දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වාත් ප්‍රතිලාභ කිසිවක් ලැබී නොතිබූ අතර ඒ සඳහා සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගැනීමට අධිකාර්ය කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට බැංකු මූල්‍ය අංශයේ හිඟහිටිව පැවති එකතුව රු. 181,155,092 ක බොල්ණය වලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගැනීමට අධිකාර්ය අපොහොසත් වී තිබුණි.

(ඈ) ලිපිද්‍රව්‍ය තොග ගබඩාවේ පවතින අවිධිමත්භාවය නිසා සමාලෝචිත වර්ෂය අවසානයට සිදුවී තිබූ ලිපිද්‍රව්‍ය තොග හානිය රු.3,688,824 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.228,033 කි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව තොග හානිය 1,518% කින් වැඩිවී තිබුණු අතර මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි.

(ඉ) කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි බැංකු සංගම් 02 කට අයත් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මුදල් මුද්දර 1153 ක් සඳහා වූ රු.242,130 ක මුදල් ප්‍රමාණයක් අදාල ප්‍රතිලාභීන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි බැංකු සංගම් 03 ක සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරගත් එකතුව රු.1,669,762 ක මුදල් මුද්දර වටිනාකම් ඔවුන්ගේ ගිණුම්වලට බැරකර නොතිබුණි.

(උ) සමෘද්ධි බැංකු සංගම් සම්බන්ධ නියැදි විගණන පරීක්ෂාවකදී බැංකු සංගම් 03 කට අදාල සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුම්වලට බැරකළ යුතු රු.4,759,050 ක් ගිණුම්වලට බැර කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඌ) සමෘද්ධි බැංකු ශාඛා 87 ක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබූ රු. මිලියන 149 කින් රු. මිලියන 9 ක් සමාලෝචිත වර්ෂය තුල නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල සිදුව තිබූ රථවාහන අනතුරු 12 ක් සඳහා අයකර ගත යුතුව තිබූ එකතුව රු.310,899 ක රක්ෂණ වන්දි මුදල් 2012 අගෝස්තු මාසය දක්වාත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) සමෘද්ධි නිලධාරීන් සඳහා මූලික පරිගණක පුහුණුව ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.1,548,856 ක් ගෙවා තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර වඩා වාසිදායක පුහුණු ආයතනයක් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු වෙත නිකුත් කර තිබූ රු.30,050 ක් පිරිවැය වූ ඩිජිටල් වර්ගයේ කැමරාවක් ආපසු භාර නොගෙන නිලධාරියා සේවයෙන් නිදහස් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ මාර්ගස්ථ මුදල් ගිණුමේ ශේෂය රු.2,804,904 ක් විය. මෙයින් රු.1,139,757 ක චෙක්පත් අධිකාරිය වෙත ලැබීම සඳහා දින 05 ත් දින 30 ත් අතර කාලයක් ගතවී තබූ අතර, රු.246,313 ක චෙක්පත් අධිකාරිය වෙත ගෙන්වා ගැනීම සඳහා මාසයකටත් අධික කාලයක් ගතකර තිබුණි.

(ඇ) අධිකාරියේ සේවයේ නියුතු මාණ්ඩලික හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් මාසික ඉදිරි වැඩ සටහන් සහ කළ වැඩ වාර්තා අදාල ප්‍රධානීන්ගේ අනුමැතිය සහිතව පවත්වාගෙන යායුතු වුවද ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු ඇතැම් නිලධාරීන්ගෙන් මාසික ඉදිරි වැඩ සටහන් සහ කළ වැඩ වාර්තා නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක සිදුකළ යටිතල පහසුකම් ව්‍යාපෘති 13 ක අයිතම 53 ක් සඳහා ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රු.672,834 ක වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) නිසි පරිදි ඉදිකිරීම් හා නඩත්තු කිරීම් සිදුකර නොතිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක ඉටුකර තිබූ ව්‍යාපෘති 03 ක් සඳහා දරන ලද රු.530,240 ක මුදලක් නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.4 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙන</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2007 වර්ෂයේ සිට ජනාධිපති මාධ්‍ය ඒකකයේ භාවිතය සඳහා ලබාදී තිබූ අධිකාරිය සතු මාධ්‍ය උපකරණ ඒකක 32 කින් ආපසු ලද උපකරණ 13 ක් පමණක් නැවත භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින බව රාජ්‍ය සංස්ථාවක තාක්ෂණික ඉංජිනේරුවරයෙකු විසින් සහතික කර තිබුණද ඒ පිළිබඳව සැලකිල්ලක් නොදක්වා උපකරණ තොගය වෙනුවෙන් අයවිය යුතු රු.2,874,258 ක මුදල අදාල ආයතනයෙන් අයකර නොගෙන උපකරණවල මුළු වටිනාකම අධිකාරියේ උපකරණ ක්ෂයවීම් වශයෙන් සමාලෝචිත වර්ෂය තුල ගිණුම් ගත කර තිබුණි.

(ආ) ගෘහ භාණ්ඩ නිෂ්පාදන සමාගමක් වෙනුවෙන් අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු පෞද්ගලිකව ඇපවීම මත පෞද්ගලික බැංකුවකට ගෙවීමට සිදුව තිබුණු රු. මිලියන 2 ක මුදල අදාල සමාගමෙන් අයකර ගැනීමට හා අධිකාරියට පාඩු සිදුවන ආකාරයෙන් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් 2012 අගෝස්තු මාසය වනවිටත් කටයුත කර නොතිබුණි.

(ඈ) බැංකු ලිපිද්‍රව්‍ය ගබඩාකිරීම සඳහා කුලියට ගෙන තිබූ ගබඩාවක පැවති සියළු ලිපි ද්‍රව්‍ය තොග 2010 අගෝස්තු 31 දින වන විට එම ගබඩාවෙන් ඉවත්කර ගෙන තිබූ නමුත් කුලී තැන්පතුව වූ රු.1,500,000 ක් 2012 අගෝස්තු මාසය වනතුරුත් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂය පිළිබඳව කුලී හිමියාගේ සනාථ කිරීමක් විගණනය වෙත ලබා දීමට අධිකාරය අපොහොසත් විය.

(ඈ) බඳවාගැනීමේ පරිපාටියේ නියමිත සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරියෙකු අධිකාරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2010 සැප්තැම්බර් 15 දින බඳවාගෙන තිබුණු අතර පසුව, තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබියදී සම්මුඛ පරීක්ෂණයකින් ද තොරව අධ්‍යක්ෂවරයෙකු ලෙස 2011 මාර්තු 25 දින උසස්වීම් ලබාදී තිබුණි. බඳවාගත් දින සිට 2011 නොවැම්බර් දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.935,620 ක් ගෙවා තිබූ අතර, පූර්ණකාලීනව රියදුරෙකුද සහිතව රජයේ වාහනයක්ද අනුයුක්ත කර තිබුණි. මේ සම්බන්ධව විගණනය විසින් විවිධ අවස්ථාවල දැනුවත් කිරීම් කර තිබුණද අධිකාරය විසින් ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. "නිලධාරියාගේ සුදුසුකම් සපුරන දිනය වූ 2012 ජනවාරි 01 දින අධ්‍යක්ෂ තනතුරට උසස් කරන ලද දිනය ලෙස ප්‍රතිශෝධනය කර ඇති බවත් 2011 මාර්තු 25 දින සිට 2012 ජනවාරි 01 දින දක්වා ගෙවනලද වැඩිපුර වැටුප් හා දීමනා අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්" අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර විය.

(ඉ) <u>අධිකාරයේ සේවය කළ බව තහවුරු කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවීම</u>

(i) සමාලෝචිත වර්ෂය තුල දින 03 ක් පමණක් අධිකාරයේ සේවයට වාර්තා කර තිබුණු නිලධාරියෙකු වෙත වැටුප් හා දීමනා වශයෙන් රු.205,078 ක් ගෙවා තිබූ අතර අධිකාරයේ වාහනයක් පාවිච්චි කිරීම සඳහා ද අවස්ථාව සලසා දී තිබුණි. එම වාහනය සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු. 238,975 ක ඉන්ධන භාවිතා කර තිබුණි

(ii) ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු වන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකුට අධිකාරයේ රාජකාරිවල නිරතවූ බව තහවුරු කර ගැනීමෙන් තොරව 2011 ජූනි සිට නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.130,041 ක් ගෙවා තිබුණි.

4.5 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙහිඕවිට සමෘද්ධි මහ සංගම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු කළ රු.1,143,618 න් 2011 නොවැම්බර් වන විට රු.823,404 ක් ගෙවා තිබූ නමුත්, නව ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම් නිසි ප්‍රමිතියට සිදුකර නොතිබීම හේතුවෙන් ගොඩනැගිල්ල අදාල කටයුතු සඳහා සතුටුදායක අයුරින් භාවිතයට ගත නොහැකිවී තිබුණි.

(ආ) 2008 අගෝස්තු මාසයේ ඉදිකිරීම් ආරම්භ කළ දෙහිඕවිට බෝමළුව සමෘද්ධි බැංකු සංගම් ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ඉදිකිරීමේ කටයුතු සඳහා දරා තිබූ මුළු වියදම රු.1,339,881 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් එහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබූ අතර, 2008 වර්ෂයෙන් පසු මේ පිළිබඳව කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

විනය කාර්ය පරිපාටි ක්‍රියාත්මක කිරීම

අධිකාරියෙන් වැටුප් ගෙවනු ලබන සේවකයින්ගේ විනය ක්‍රියා සම්බන්ධයෙන් ගනු ලැබූ පියවරයන් පිළිබඳ සිදුකළ නියැදි පරීක්ෂණයකදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විනය චෝදනා මත සේවකයින් දෙදෙනෙකුගේ වැඩ තහනම් කර දිගු කාලයක් ගතවී තිබූ නමුත් ඔවුන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ii) එසේම විනය චෝදනාවන්ට ලක්වූ සේවකයින් 12 දෙනෙකු වෙත චෝදනාපත් නිකුත් කිරීමට 2012 සැප්තැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) සේවකයකු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කර දිගු කාලයක් ගතවී තිබූ නමුත් ඒ සම්බන්ධව පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) පරීක්ෂණ මණ්ඩලයක් පත් කර දිගු කාලයක් ගතව ඇතත් සේවකයින් 18 දෙනෙකුට අදාල විධිමත් විනය පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනතුරුත් අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(v) විධිමත් විනය පරීක්ෂණ වාර්තා ලබාගෙන දිගු කාලයක් ගතවී තිබූ සේවකයින් 05 දෙනෙකු වෙත විනය නියෝග නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක: පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව අධිකාරිය සතු සම්පත්වල ධාරිතාවය, සංවිධාන සටහන හා එහි කාර්යයන් පිළිබඳව වගකිවයුතු නිලධාරීන් පැහැදිලිව හඳුනා ගත හැකි වන පරිදි සංයුක්ත සැලැස්ම සකස්කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව විධායක මට්ටමේ තනතුරු 03 ක් ද ඇතුළුව තනතුරු 138 ක් 2011 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු ව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබූ අභ්‍යන්තර විගණන විමසුම්/වාර්තා 2008 වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා වූ අතර අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වාර්තා කිරීම කාලානුරූපී නොවීය. "විගණන නිලධාරීන්ගේ

පුරප්පාඩු හා පරිගණක නිලධාරින්ගේ හිගය මේ සඳහා හේතුවී ඇති බවත් 2012 වර්ෂය වනවිට 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ විගණන විමසුම් හා මූලා‍ය ප්‍රකාශන නිකුත් කර අවසන් බවත් '' අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර විය.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගණම්කරණය
- (i) රජයේ දායකය
- (ii) සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන ගිණුම්
- (iii) සේවක ණය ගිණුම්

(ආ) අයවැය පාලනය
(ඇ) ලිපි ද්‍රව්‍ය තොග පාලනය
(ඈ) ණය කළමනාකරණය

- (i) සේවක ආපදා ණය සහ උත්සව අත්තිකාරම්
- (ii) ජීවනෝපාය සංවර්ධන ණය

(ඉ) ස්ථාවර වත්කම්
(ඊ) අරමුදල් ගිණුම්

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

වාර්තාවේ සඳහන් කරුණුවලට අදාල පිළිතුරු හා ගත් ක්‍රියාමාර්ග පහත පරිදි ඉදිරිපත් කරමි.

2.2.1 <u>ගිණුම් කරන අඩුපාඩු</u>

අ. ආදායම් වියදම් ගිණුමේ පරියේෂණ හා සංවර්ධන වියදම තුළ ඇතුලත්ව තිබූ මිලියන 200 ට අදාල අරමුදල් ලැබීම ජර්නල් සටහන් අංක 15න් 2012 සැප්තැම්බර් මස නිවැරදි කර ඇත.

ආ. මෙය වැරදීමකින් පෙර වර්ෂ ගිණුමට බැර වී ඇති නිසා එම සටහන ජර්නල් සටහන් අංක 10 මඟින් 2012 සැප්තැම්බර් නිවැරදි කරන ලදී.

ඇ. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබා දී ඇති රුපියල් මිලියන 241 ක මුදල තුළින් සත්‍ය වියදම දිස්ත්‍රික්ක තුලින් ලබා ගැනීමෙන් අනතුරුව අදාල වියදම ගොඩනැගිලි වත්කම් ලෙස ගිණුම් සටහන් තැබීම බැංකු මූල්‍ය අංශය මඟින් සිදුකර ඇත.

ඈ. මේ සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් මත අදාල කටයුතු සිදු කර ඇති අතර, නිවැරදි අගය බැංකු මූල්‍ය අංශයේ පොත්පත් වල ගැලපීම කර ඇත.

ඉ. ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම සඳහාත්, එම වත්කම සඳහා ක්ෂය වෙන් කිරීමෙන් සිදුවූ වරද නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් අංක 13 හා 14 මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

ඊ. සිදුවූ වරද නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් අංක 11 සහ 12 මඟින් 2012 සැප්තැම්බර් මස නිවැරදි කර ඇත.

උ. ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ වර්ෂ අවසාන තොග ආගණනයේදී භෞතික තොගය ගිණුම්ගත කිරීම හේතුවෙන් රු. 3,289,139/- ක තොග වෙනස චක්‍රීය අරමුදලේ ජර්නල් සටහන් යොදා ආදායමින් ඉවත්කර සංචිත ගිණුමකට සටහන් කර ඇත.

ඌ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අදාල ණය වාරික අප වෙත එවීමේදී එක් එක් පුද්ගලයාට හිමි වාරික පොලී වෙන් වෙන් වශයෙන් නොඑවන අතර, එවනු ලබන මුළු ණය වාරිකයෙන් පොලී මුදල වෙන් කර ගනු ලබන්නේ ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය අංශයෙනි. මෙලෙස දිස්ත්‍රික්ක විසින් එවනු ලබන ණය වාරිකවලට අයත් චෙක්පත් ලද විගස ඊට අදාල මුදල් ලැබිය යුතු නිවාස ණය ගිණුමට බැර කර ඊට අදාල පොලී වෙන්කර ගැනීමෙන් පසු ලද පොලී නිවාස ණය ගිණුමට බැර කරනු ලබයි.

අදාල වර්ෂයට අයත් පොලී මුදල් එම වර්ෂය තුලම ලද පොලී ගිණුමට බැර කිරීමට මේ වන විට පියවර ගෙන ඇත.

එ. බැංකු මූල්‍ය අංශයෙන් ප්‍රදානිත සේවක ණය ශේෂය සඳහා වර්ෂය අවසානයට අයවිය යුතු පොලිය ගණනය කර ගිණුම්ගත කිරීමට පසු වර්ෂයේ කටයුතු කර ඇත.

2.2.2 නොසැසඳුන පාලන ගිණුම්

පහත සඳහන් ගිණුම් වල ශේෂයන්හි වෙනස මේ වන විට පහත පරිදි අඩුකර ගැනීමට කටයුතු කර ඇත. තවදුරටත් අදාල කටයුතු සිදු කරමින් පවතී.

විෂයය	පොදු ලෙජර ගිණුමේ ශේෂය (රු.)	උප ලේඛනයේ එකතුව (රු.)	පැවති වෙනස (රු)	පවතින වෙනස (රු.)
සේවක යතුරු පැදි ණය	99,739,615.51	99,780,398.72	129,497.00	40,783.22
සේවක නිවාස ණය	601,242,595.89	610,909,336.36	15,586,931.00	1,187,401.64
ජන පුබුදු ණය	221,930.00	82,117.00	139,813.00	139,813.00

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අ. දිගුකලක සිට ඉදිරියට ගෙන යමින් පැවති රු. 1,899,981ක් වූ අවිනිශ්චිත ණයගැති ශේෂය සම්බන්ධයෙන් 2012.12.31 දිනට අවසන් ගිණුම්වල ගැලපීම් කිරීම සඳහා තීරණයක් ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර 244 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මූ.රෙ. 104 අනුව පරීක්ෂණ කමිටුවක් පත්කර ඉදිරි කටයුතු කිරීමට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව කටයුතු කරගෙන යනු ලැබේ.

ආ. <u>කඩිනම් ණය නියාමක අවදානම් අරමුදල</u>

මෙම වැඩසටහන යටතේ බැංකු මූල්‍ය අංශය මඟින් තැන්පත් කර ඇති ඇප මුදල් වලින් 2012 වර්ෂය ආරම්භයේදී අයවිය යුතු මුදල රු.758,022.61 ක් විය.

2012 වර්ෂයේ මේ දක්වා රු.199,251.41 ක් අය විය. ඒ අනුව තවදුරටත් අය විය යුතු මුදල වන්නේ රු.558,771.20 කි. ගෙවීම් පැහැර හැරි නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර ඇත.

ඇ. ආසියානු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලිහිල් ලෙජර් පත්‍රිකා මුද්‍රනය වෙනුවෙන් සිදුකළ ගෙවීම් වලදී සමෘද්ධි අධිකාරිය සහ මුදල් අමාත්‍යාංශය විසින් වැට් මුදල දෙවරක් අඩු කර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබීම හේතුවෙන් බැංකු මූල්‍ය අංශයේ ගිණුම් වල ලැබිය යුතු මුදලක් ලෙස රු.517,304/- ක් පෙන්නුම් කරයි. මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති අතර, ඉදිරියේදී එය නිරවුල් කරගැනීමට කටයුතු කරනු ඇත.

ඈ. මෙම මුදල් ලබාදෙන ලෙස භාණ්ඩාගාරයෙන් කීප අවස්ථාවක දී ඉල්ලීම් කර ඇත. මෙතෙක් මුදල් නොලැබීම මත අධ්‍යක්ෂ මණ්ඩල ලබාදුන් උපදෙස් පරිදි මෙම මුදල් වාර්ෂික ඇස්තමේන්තුව යටතේ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් වලින් හිලව් කර ගැනිමට කටයුතු කර ඇත.

ඉ. 2004 හා 2005 වර්ෂවල සිට ලැබිය යුතු ලෙස පවතින මෙම සටහන් පිලිබඳව සොයා බලා අදාල නිවැරදි කිරීම් මේ වන විට කරගෙන යනු ලැබේ.

ඊ. 2003 වර්ෂයේ සිට පැවතෙන මෙම කරුණට අදාල තොරතුරු සොයාගත නොහැකි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම තොරතුරු ඉදිරිපත් කර ඉදිරි පියවර ගැනිමට කටයුතු කර ඇත.

2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

අ. රජයේ දායකත්වය 554,419,261

විස්තරාත්මක තොරතුරු ගිණුම් අංශයේ ඇත.

ආ. සේවක පාරිභෝගික ණය 524,260,761/-

බැංකු මූල්‍ය අංශයේ ලෙජර් යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ඒ අනුව නිවැරදි උපලේඛන සකස් කර ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ. මෙම කාර්යය දිස්ත්‍රික් මට්ටමින් සිදු කිරිමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරියේදී ගනු ලැබේ.

ඇ. යටිතල පහසුකම් ව්‍යාපෘති දෙකකට ලබාදුන් ප්‍රතිපාදන

i. කණුග්ගල්ල පහලවෙල අසල ඇල වේල්ල හා පැති බැම්ම ඉදිකිරිම.

අදාළ ව්‍යාපෘතියේ පැති බැම්ම ඉදිකිරිම විශේෂ ව්‍යාපෘති වැඩසටහන යටතේ සමෘද්ධි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කර ඇත. ගෙවීම් කිරිමේ දී අදාල අයිතමයන් අනුව ගෙවීම් කර ඇත.

අවසන් නිමි වාර්තාව රු.230,849/- වුවද ගෙවීම් කර ඇත්තේ රු. 184,679/- පමණි. 20% කට වඩා වැඩි ප්‍රජාදායකත්වයක් ලබා ගනිමින් මෙම ව්‍යාපාතිය නිම කර ඇත. (ඇස්තමේන්තු වාර්තා , නිමි වැඩ වාර්තා හා ගෙවීම් වවුචර ගොනු කර ඇත.)

ii. දෙහෙරගොඩ කැන්දලන්ද මාර්ගය ඉදිකිරිම

මෙම මාර්ගය කඳු හා බෑවුම් සහිත මාර්ගයක් වන අතර බැකෝ යන්ත්‍ර යොදවා පාර කැපීම පමණක් සමෘද්ධි අධිකාරියේ ප්‍රතිපාදන මත ග්‍රාමීය සමෘද්ධි බලකාය මඟින් සිදුකර ඇත .

වැය කර ඇති මුදල රු. 197,500/- කි. (ඇස්තමේන්තු වාර්තා, නිමි වැඩ වාර්තා හා ගෙවීම් වවුචර් ගොනු කර ඇත.)

ඈ. සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් සඳහා මුලධන දායකය වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලද මුදලට අමතරව රුපියල් 21,734,555 ක් සංවර්ධන වියදම් සඳහා දරා ඇත්තේ 2011 වසරේ ප්‍රධාන කාර්යාලයේ ආරම්භක මුදල් ශේෂ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මාර්ගස්ථ මුදල් වලිනි. මේ වන විට සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් අදාල අංශ විසින් වැය කළ ප්‍රතිපාදන වලට අදාල දත්ත විස්තර ඒ ඒ සංවර්ධන අංශවල ගොනු කර ඇත.

2.2.5 <u>නීති රීති රෙගුලාසි හා කළමණාකාරීත්ව තීරණවලට අනුකූල නොවීම</u>

අ මෙම ලොතරැයි වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය වෙත පවරා දී තිබූ අතර, ක්ෂණික ලොතරැයි මහජනතාව මිළ දී ගැනිම ඉතාම අඩු මට්ටමක පවතින බැවින්, ලොතරැයිය පවත්වාගෙන යාම සුදුසු නොවන බව ඔවුන් දන්වා ඇත. ඒ අනුව මෙම ලොතරැයිය ක්‍රියාත්මක කිරිම ලොතරැයි මණ්ඩලය විසින්ම නවතා දමා ඇත. එහෙත් ලොතරැයි අරමුදලේ පැවති මුදල් 2012 වර්ෂයේ දී දිරිය පියස නිවාස ඉදි කිරිමේ වැඩසටහන සඳහා යොදා අවසන් කිරීමට ලොතරැයි අරමුදල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කර ඇත.

ආ	ව්‍යවස්ථාපිත ආයතනයක් වන අප ආයතනයේ නිලධාරින් සම්බන්ධව කටයුතු කිරිම සඳහා ශ්‍රී ලංකා ජන රජයේ ආයතන සංග්‍රහය භාවිතා කිරිමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව 2011 පළාත් මැතිවරණය සඳහා ඡන්ද අපේක්ෂකයින් ලෙස තරඟ කළ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සේවයේ නියුතු සියළු නිලධාරින්ට ආයතන සංග්‍රහයේ xxxii වන පරිච්ඡේදයේ 2:3:2 වගන්තිය අනුව නාම යෝජනා භාර දිමට සතියකට පෙර සිට මැතිවරණ දිනය දක්වා වැටුප් රහිත නිවාඩු අනුමත කර ඇත.

තවද නාම යෝජනා බාර දීමට සතියකට පෙර දිනය ලෙස විවිධ දිනයන් ඉදිරිපත් කර ඇති සියළු නිලධාරින්ගේ එම කාලයට අදාලව වැටුප් අය කර ගැනිමට උපදෙස් ලබා දී ඇත.

ඇ	**මුදල් රෙගුලාසි**

(i)	ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් වෙත නිකුත් කරන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හඳුනාගත හැකිවන පරිදි නිකුත් කරන අංකයෙන්ම පරීක්ෂා කර ආපසු භාරගන්නා අතර, දිස්ත්‍රික් කාර්යාල වෙත නිකුත් කරන ඉන්වෙන්ට්‍රිවල එම භාණ්ඩවල පවතින වෙනත් සංකේත අංකත් යොදාගෙන ඇත. මෙම වරද දැනට නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ii)	අධිකාරිය සතු වාහන 33 කට අදාල ධාවන සටහන් පාලන අංශයේ ගොනු කර ඇති අතර, පිටපත් රජයේ විගණන අංශය වෙත සැපයීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම සෑම වාහනයකම දෛනික ධාවන සටහන් පොත් මාසය අවසන් වී ඊලඟ මස 10 වැනි දිනට පෙර පාලන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස සියළු වාහන වල රියදුරන් දැණුවත් කර ඇති බවද, ඒ අනුව නියමිත පරිදි ඒවා ලබාදෙන බව ද කාරුණික දන්වමි.

ඇ	**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2006**

- 4.2.1. ඡේදය	ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ඇතුළු තවත් ආයතන කිහිපයක් එකට ඒකාබද්ධ කර දිවි නැගුම දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමට 2010 වසරේ සිට සැලසුම් සකස් කර තිබීම නිසා නව දෙපාර්තමේන්තුව තුල සිදුවන ප්‍රසම්පාදන අවශ්‍යතා පිළිබඳ පැහැදිලි ලැයිස්තු ගත කිරීමක් සිදු කිරීම අපහසු බැවින් ඉදිරි වර්ෂ 3 සඳහා ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නැත. නමුත් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුල ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කරන මුදලින් දිස්ත්‍රික්ක හා ප්‍රධාන කාර්යාලීය සමෘද්ධි අංශවල අවශ්‍යතා සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පමණක් සකස් කර ඇත
4.2.2.(ආ) ඡේදය	මේ සම්බන්ධයෙන් පැවති අඩුපාඩු පිළිගන්නා අතර, ඒවා නිවැරදි කිරිමට ක්‍රියාකර ඇති බව කාරුණිකව දන්වමි. 2012 වර්ෂයේදි මෙය නිවැරදි කර සමෘද්ධි කොඩි හා බැනර් මුද්‍රණය සඳහා නියමිත දින වකවානු ඇතුලත් කාල සටහනකට අනුව සිදුකර ඇත.

ඉ (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට වාහන මිලදී ගත් වර්ෂවලදී අදාල වාහන වල වටිනාකම හා ප්‍රමාණය වාර්ෂික ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ ලේඛනයන්ට ඇතුලත් කර ඇත. එසේම යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ.

(ii) අධිකාරිය සතු පරිගණක මිලදී ගැනීම් සිදු කරන අවස්ථාවේදීම එම මිලදී ගන්නා පරිගණකවල වටිනාකම වාර්ෂික ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ ලේඛනයට ඇතුලත් කර ඇත. තවද ,භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයිඒඅයි 02/2002/අනුව පරිගණක ලේඛණයක් නඩත්තු කිරීම පරිගණක තාක්ෂණ අංශය විසින් කටයුතු ආරම්භ කර ඇත.

ඊ වාහන සම්බන්ධව වාර්ෂික සමික්ෂණ මණ්ඩලයක් පත් කර සමීක්ෂණ කටයුතු කරමින් පවති.

උ අංක PF/FS/A hehi/2009 හා 2010 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ඡේද අංක 03 සහ 05 අළුත්වැඩියා කළ යුතු තත්වයට පත් වී ඇති වාහනවල පවතින දෝෂයන් පරික්ෂා කර බලා කාර්මික නිලධාරි නිර්දේශ ලබා අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත. වසර 10 කට වඩා පැරණි වාහන අපහරණ කළ යුතු තත්වයේ පසු වුවද, රාජකාරි අවශ්‍යතාවය මත අළුත්වැඩියාවන් ඉටු කර ගනිමින් සේවයේ යොදවා ඇත. අපහරණය කළ යුතුව පවතින වාහන පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අමාත්‍යාංශය මඟින් විමසීම් කර ඇති අතර, අමත්‍යාංශයේ උපදෙස් මත ඉදිරි ක්‍රියා මාර්ග ගනු ලැබේ.

ඌ සමෘද්ධි බලකායන් හා සමෘද්ධි සමිති විසින් ලබාගන්නා සෑම කොන්ත්‍රාත්තුවක් සඳහා ම වන ගණුදෙනු විධිමත්ව පවත්වා ගැනිම සඳහා උපදෙස් ලිඛිතව ලබා දී ඇත. එහෙත් සමෘද්ධි ප්‍රතිලාභින් විසින් මෙම කටයුතු පවත්වාගෙන යාම හේතුවෙන් ඔවුන් ලබාදෙන උපදෙස් අනුව කටයුතු කිරිම බොහෝ විට අතපසු කරනු ලබයි. මේ සම්බන්ධයෙන් සියළුම සංවර්ධන නිලධාරින් වෙත මෙම කටයුතු විධිමත්ව අධික්ෂණය කරන ලෙස දැණුවත් කිරිමට පුහුණු වැඩසටහන් වලදී ද කටයුතු කර ඇත.

එ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ TO/TM/RES/03/2012 සහ 2012.12.12 දිනැති ලිපියෙන් 2012 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීමක් ලෙස ගිණුම් තැබීමට අනුමැතිය ලබාදී ඇත.

ඒ (i) සමාජ සංවර්ධන පදනම් ව්‍යවස්ථාව අරමුදල් භාවිතය.

දෙහිඕවිට හා කිරිඇල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මෙම වාර්තා පිටපත් අප වෙත එවා ඇත. සමාජ සංවර්ධන පදනමේ අරමුදල් වියදම් කිරීම සඳහා 2011 වර්ෂයේ සිට හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය හා එය අධිකාරියට ගෙන්වා අනුමත කර ගත යුතු බව දන්වා ඇති බැවින් සෑම දිස්ත්‍රික්කයකම මෙම කාර්යය නිවැරදි වී ඇත.

(11) **රැස්වීම්**

මෙම සමාජ සංවර්ධන පදනම්වල වාර්තා මේ වන විට අප වෙත ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව රැස්වීම් පවත්වා ඇති බව සඳහන් කරමි.

(111) **අරමුදල් රැස් කිරිම හා ගිණුම් තැබීම**

මුදල් එවීමේ කිසියම් ප්‍රමාදයක් සිදුවී තිබුණ ද මේ වන විට යාපනය හා වව්නියාව හැර අනිකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් අය වී ඇති බවත්, යාපනය හා වව්නියාව දිස්ත්‍රික්කවලින් එම මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇති බවත් දැනුම් දෙමි.

(Iv) **විගණනය**

සමාජ සංවර්ධන පදනමේ ගිණුම් කටයුතු මහා සංගම් ක්‍රියාවලිය තුළ පවතින කාර්යයක් ලෙස පවත්වා ගෙන යන බැවින් වාර්ෂිකව මහා සංගම් විගණනය කිරීමේදී සමාජ සංවර්ධන පදනමේ ගිණුම්ද විගණනය කර ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 <u>අරමුදල් ගිණුම් පවත්වාගෙන යාමේ අඩුපාඩු</u>

අ. **<u>සමාජ සංවර්ධන අරමුදල</u>**

මේ වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 112 කින් අදාල ශේෂ පිළිබඳ විස්තර ලැබී ඇති අතර, ඉතිරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 05 න්ද ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති.

ආ. **<u>සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල</u>**

(i) මේ වනවිට අදාල නිර්ණායක සපුරා ඇති සියළුම ප්‍රතිලාභීන්ට ගෙවීම් කොට අවසන්ව ඇති අතර මිය ගිය සහ සුදුසුකම් නොලත් ප්‍රතිලාභීන්ගේ මුදල් නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත 2012 ගිණුම් මඟින් අරමුදලට බැර කිරීමට කටයුතු කර ඇත.

(ii) සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීම සඳහා සමෘද්ධි ප්‍රතිලාභින්ගේ තොරතුරු ඇතුලත් පරිගණක දත්ත පද්ධති සකස් කරනු ලැබුයේ 2002 වසරේදීය. දිණුම් වාර 14 කදී දත්ත පද්ධතිය යාවත්කාලීන කළ අතර මේ තත්ත්වය මත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ දෝෂ හේතුවෙන් යම් ප්‍රමාණයකට දිණුම් අවස්ථා අහිමි විය.

ඊ- සමෘද්ධි වැඩසටහන යටතේ නව දත්ත පද්ධතියක් සකස් කර ඇති අතර, මීලඟ දිනුම් ඇදීම සඳහා මෙම නව දත්ත පද්ධතිය යොදා ගැනිමට නියමිතව ඇත.

4.1.2 අපේක්ෂිත අරමුණු සඳහා පාවිච්චි නොකල අරමුදල්

(i) ක්‍රියාත්මක නොවන සමෘද්ධි ලොතරැයි අරමුදල් ශේෂය 2012.01.10 දින පැවති 232 වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 15/2012ට අනුව දිරිය පියස නිවාස වැඩසටහන සඳහා යොදා ලොතරැයි අරමුදල අවසන් කිරීමට කටයුතු කර ඇත.

(ii) මෙම මුදල බැංකු සංගම් ප්‍රචාරනය සම්බන්ධව දැන්වීම් පල කිරීමට පුවත්පත් ආයතනයකට හා සමරු කලාපයකට ගෙවීම් කර ඇත. ඒ අනුව මෙම වියදම් අරමුදලේ අරමුණු සඳහා වැයකර ඇති බව කාරුණිකව දන්වමි. ඉදිරි කාලය තුලද අරමුදල අපේක්ෂිත අරමුණු සඳහා යෙදවීමට කටයුතු කෙරේ.

(iii) සමාජ සංවර්ධන අරමුදල් අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සමාජ සංවර්ධන පදනම් විසින් උපයා ඇති මුදල් වේ. එහෙත් ඒවා අදාල කාර්යයන් සඳහා යෙදවිමේ කටයුතු අධික්ෂණය කිරිම මෙම අධිකාරියෙන් සිදු කරනු ලබයි. ඒ අනුව සමාජ සංවර්ධන පදනමේ අරමුදල් වියදම් කිරීම සඳහා 2011 වර්ෂයේ සිට හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය හා එය අධිකාරියට ගෙන්වා අනුමත කර ගත යුතු බව දන්වා ඇති බැවින් සෑම සමාජ සංවර්ධන පදනමකම මෙම අරමුදල් නිවැරදි කාර්යයන් සඳහා ම යෙදවීමට කටයුතු කර ඇත.

4.1.3 සමාලෝචිත වර්ෂය තුළ දී අධිකාරිය අංශ 12 යටතේ ක්‍රියාත්මක කළ වැඩ සටහන් සඳහා අනුමත වූ මුදල රුපියල් මිලියන 3,284.1 ලෙසද, වැය කර ඇති මුදල රුපියල් මිලියන 2,257 ක් ලෙස ද දක්වා ඇති අතර ඒ අනුව අනුමත මුදලින් වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රතිශතය 68.7% ක් බව කාරුණිකව දක්වමි. අනුමත ක්‍රියාකාරි සැලැස්මේ පරිදි දිස්ත්‍රික් වෙත අනුමත ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නිදහස් කළද භාණ්ඩාගාරයෙන් අක් මුදල් නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරිවී ඇත. එමෙන්ම වැඩ නිමකල ව්‍යාපෘති සඳහා උපචිත මුදල මිලියන 393 කි.

4.1.4 මෙම අංශ විසින් සැලසුම් කළ වැඩසටහන් 37 ට අදාල ව්‍යාපෘති ඒකක 136,546 ක අදාලව මුදල් ලැබීමේ දුෂ්කරතාවය මත අවස්ථා කිහිපයකදී සංශෝධනය කිරිමට සිදු විය. තවද, අනුමත වූ මුදල් වසර අග භාගයේ දී ලැබීම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම අපහසු විය. ඒ අනුව මෙම ව්‍යාපෘති ප්‍රමාණය ඉටු කර ගැනිමට නොහැකි වූ බව කාරුණිකව පෙන්වා දෙමි.

4.1.5 අනුමත ප්‍රතිපාදන සීමා විම මත ඇස්තමේන්තු සංශෝධනය කිරිමෙන් මෙම තත්වය ඇති විය. ඒ අනුව රුපියල් මිලියන 119 ක් පමණ පිරිවැය වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට නොහැකි වූ බව කාරුණිකව පෙන්වා දෙමි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

අ. මහලේකම් කාර්යාලය ඉදි කිරිම

(i) අදාල බදු ගිවිසුම මත ගොඩනැගිලි භූමිය සඳහා වරිපනම් අංකය ද ජල විදුලිය ද ලබා ගෙන ඇති අතර ග්‍රාම නිලධාරි මඟින් ගෘහ අංකය ද ලබා ගෙන සමෘද්ධි අධිකාරිය වෙනුවෙන් ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ලක් ද මේ වන විට ඉදි කර ප්‍රායෝජනයට ගෙන ඇත.

(ii) මෙම ඉඩමෙහි ඉදි කර ඇති ගබඩා ගොඩනැගිල්ල සහ භූමිය පිළිබඳ මතු වී ඇති ගැටළුව නිරාකරණය කර ගැනිම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟින් කටයුතු කර ඇති අතර ඉදිරියේදී බිහිවන නව දිවිනැඟුම දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ගරු අමාත්‍යතුමා සහ අමාත්‍යාංශය වෙත අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

(iii) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට මෙතෙක් ප්‍රධාන කාර්යාලයක් නොමැති හෙයින් 27000 කට ආසන්න සේවකයන්ගේ හා අඩු ආදායම්ලාභින්ගේ රාජකාරි කටයුතු වෙනුවෙන් වන ප්‍රධාන කාර්යාලය සෙත්සිරිපාය කාර්යාල සංකීර්ණයේ පිහිටා ඇති අතර ඒ වෙනුවෙන් තවදුරටත් කුලි ගෙවීමක් සිදු වේ.

ආ ගල්ගමුව පළතුරු අපනයන නිෂ්පාදන සමාගමහි කොටස් මිළ දී ගැනිම වෙනුවෙන් රු.4,760,000/- ක් ආයෝජනය කිරිම

සමෘද්ධි අධිකාරිය මඟින් මිලට ගෙන තිබූ කොටස් මිලට ගැනීමට සිලෝන් බිස්කට් සමාගම එකඟවී සිටි නිසා ඒ සඳහා ලිපි යැවුවද ප්‍රතිචාර නොමැති හෙයින් නීතිපති උපදෙස් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පරීක්ෂණ සඳහා යොමුකර ඇත.

ACX සමෘද්ධි පුද්ගලික සමාගම

මෙවැනි ආයතනයක් දැනට නොමැති නිසා ඉදිරි කටයුතු සිදු කිරීමට අමාත්‍යාංශ ලේකම් තුමා පත්කල කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

ඇ. බැංකු මූල්‍ය අංශය මගින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ණය වැඩසටහන් සඳහා ලබා දී ඇති මුදල් අතුරින් අය නොවූ ශේෂයන් සඳහා බොල් ණය සංචිත ලෙස මෙම මුදල වෙන් කර ඇත. මේ යටතේ ක්‍රියාත්මක වූ පීපල් ලීසිං වැඩසටහනට අදාලව මිලියන 38 න් 2012 වර්ෂයේදී රු. 379,569 ක් අයවී ඇත. ඉතිරි මුදල් ද අයකර ගැනීමට කටයුතු කර ඇත.

මෙම වැඩසටහන යටතේ පීපල්ස් ලීසිං සමාගමින් තවදුරටත් අය විය යුතු මුදල ලෙස 2012 වර්ෂය ආරම්භයේ පැවති අගය රු.38,158,865.00 ක් ලෙස දැක්වුව ද මෙම සමාගම විසින් භාණ්ඩ ආනයන බදු ලෙස රු.13,040,056.00 ක මුදලක් අඩු කරගෙන ඇත. එසේම 2012 වර්ෂය තුලදී අවස්ථා තුනකදී මුල් මුදලින් රු.244,341, රු. 109,359.00 හා රු.25869/- ක මුදලක් අය වී ඇත.

ඒ අනුව තවදුරටත් අයකරගත යුතු මුදල වන්නේ රු.24,739,234.18 කි.

සසණ ණය හා සවන ණය

සසණ හා සවණ ණය ලබාගෙන ගෙවීම පැහැර හැර ඇති සියළුම ප්‍රතිලාභීන්ගෙන් අදාල පැහැර හැර ඇති ණය ලංකා බැංකුව හා මහජන බැංකුව සමඟ සාකච්ඡා කර වහාම අයකර ගැනීමට කටයුතු කරඇත.

දියතිලක ඇපරල්ඩ් සමාගම

දියතිලක ඇපරල්ඩ් සමාගමේ ආයෝජනය කර තිබූ රුපියල් මිලියන 28 ක මුදලින් තවදුරටත් අය විය යුතු රුපියල් මිලියන 18.2 ක පමණ මුදල අදාල සාමාගම විසින් නොගෙවිම හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර ඇත.

ඇ. සමෘද්ධි බැංකු සංගම් ලිපිද්‍රව්‍ය මුද්‍රණය ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ විවිධ අංශ විසින් සිදුකල අතර, එහිදී ලිපිද්‍රව්‍ය විශාල තොග ලෙස මුද්‍රණය කර ඇත. නමුත් ගිණුම් ක්‍රියාවලියේ සිදුවන වෙනස්කම් හේතුවෙන් සමහර ලිපිද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් විය. (ලිහිල් ලෙජර් පත්‍රිකා හඳුන්වාදීම සමඟ ඒ වන විට භාවිතා වූ S-14, S-15, S-16, S-17, S-18, S-19, S-20 යන ආකෘති භාවිතයෙන් ඉවත් විය)

එසේම 2000 සිට 2010 දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල මෙන්ම ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ ඇති ලිපිද්‍රව්‍ය විවිධ හේතු නිසා භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. එවැනි සියළු තොග හඳුනාගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගනිමින් 2011 වසරේ ඉවත් කිරීම සිදුකල බැවින් 2011 වසරේ තොග හානි හා කපා හැරීම්වල ප්‍රතිශතය වර්ධනය වීමට හේතුවිය.

ඉ මේ සම්බන්ධව අදාල ප්‍රතිලාභීන් කැඳවා සාකච්ඡා කල අතර මුදල් මුද්දර කොටස් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත භාර නොදීම නිසා මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනිමට නොහැකි වී ඇති බව තහවුරු විය. ඒ අනුව අවශ්‍ය පියවර ගෙන ඇත.

ඊ ප්‍රතිලාභීන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය කර ගත් මුදල් මුද්දර සඳහා වූ මෙම මුදල් ප්‍රතිලාභීන්ගේ ගිණුම් හඳුනාගෙන අදාල ගිණුම් වලට බැර කිරිමට එම බැංකු සංගමය විසින් කටයුතු කර ඇත.

උ ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කළ යුතු අනිවාර්ය ඉතිරි කිරිම් වලට අදාල මෙම මුදල් ප්‍රතිලාභීන්ගේ ගිණුම් හඳුනාගෙන අදාල ගිණුම් වලට බැර කිරිමට එම බැංකු සංගමය විසින් කටයුතු කර ඇත.

ඌ) බැංකු මහ සංගම් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වෙන් කරනු ලබන අරමුදල් ක්ෂේත්‍රයෙන් සිදු කරනු ලබන ඉල්ලීම් මත මුදල් වෙන් කර ඇත. මෙහිදී එවනු ලබන ඇස්තමේන්තු හා ඉදිකිරීමට යනු ලබන ඉඩමේ අයිතියද නිවැරදිව තහවුරු කර ගැනීමෙන් ද අනතුරුව අදාල ප්‍රතිපාදන ලබාදේ. වර්ෂය තුල ලැබුණු නිවැරදි ඉල්ලීම් සඳහා පමණක් ඒ අනුව ප්‍රතිපාදන ලබාදී ඇත.

එ) මෙම 310,899/- ක රක්ෂණ වන්දි මුදල් 2001 සිට 2003 දක්වා වර්ෂවල සිදු වූ රිය අනතුරු හේතුවෙන් අය වීමට ඇති මුදල්ය .මෙම මුදල් අයකර ගැනිම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් වලට ලිඛිතව දන්වා ඇත .මේවා අය කර ගැනිම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවති.

ඒ පරිගණක ජාල ගත කිරිමේ දී සියළු සමෘද්ධි නිලධාරීන්ට මූලික පරිගණක දැනුම ලබා තිබිම අවශ්‍ය වන බැවින්, දිස්ත්‍රික් මට්ටමේ සිටින සියළු සමෘද්ධි නිලධාරීන්ට පරිගණක පුහුණුව ලබා දිම අරමුණ විය. ඒ අනුව ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය රාජ්‍ය ආයතනයක් වීමත් එම ආයතනයේ ශාඛා වැඩි සංඛ්‍යාවක් දිස්ත්‍රික් මට්ටමින් පැවතිමත් හා දින 07 ක් සඳහා පාඨමාලා ගාස්තුව රු.3,352.50 ක් වැනි සාධාරණ පාඨමාලා ගාස්තුවක් වී ඇති බැවිනුත්, මෙම ආයතනය තෝරා ගැනිමට කටයුතු කර ඇත.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

අ පැවරුම් රාජකාරි මත මෙම නිලධාරියා නැවත අධිකාරියේ සේවය කරන බැවින් නිලධාරියාට ගෙවන දීමනාවෙන් මෙම මුදල මෙම මුදල අයකර නව කැමරාවක් මිලට ගැනීමට කටයුතු කර ඇත.

ආ 2012.12.31 දිනට සකස් කරන ලද ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ දෙසැම්බර් 31 දිනට පසුව ලැබෙන දිස්ත්‍රික් මුදල් ශේෂ මාර්ගස්ත මුදල් ලෙස පෙන්වා ඇති අතර අවසන් ගිණුම් ඉදිරිපත් කරන අවස්ථාව වන විට මෙම සියළු මුදල් අධිකාරිය වෙත ලැබී තිබිණ.

ඇ ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරින් විසින් මාසික ඉදිරි වැඩසටහන් සහ කල වැඩ වාර්තා සෑම මසකම 10 වෙනි දිනට පෙර පාලන අංශය වෙත ඉදිරිපත් කිරීමට ලිඛිත උපදෙස් ලබාදී ඇත.

ඇ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

කිරිඇල්ල ව්‍යාපෘති 09 හි කාර්මික නිලධාරි පරීක්ෂාවෙන් පසු මිනුම් කටයුතු කර ගෙවීම් කර ඇති බැවින් අතිරේක මුදලක් වැය කිරීම හෝ මුදල් අපතේ යාමක් සිදුවී නොමැත.මෙහිදිද මුළු ඇස්තමේන්තු වියදම ඉක්මවා ගෙවීම කර නොතිබුනු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදි ස්ථානීය අවශ්‍යතාවය මත වැඩ අයිතමන් ක්‍රියාත්මක කර ඇත.

දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

ව්‍යාපෘතිය	ඇස්තමේන්තු මුදල (රු.)	ගිවිසුම්ගත මුදල (රු)	ගෙවා ඇති මුදල (රු.)
1. අල්ගොඩ ප්‍රජාශාලාව	441,454	378,087	378,087
2. දිගල මාර්ගය	484,851	394,941	394,941
3. බහුකාර්ය ගොඩනැගිල්ල	164,389	123,332	123,332
4. හත්තපිටිය බෝක්කුව	518,479	393,767	393,767

ඉහත පරිදි ගිවිසුම්ගත මුදලට අනුව ගෙවීම් කර ඇත. මුළු ඇස්තමේන්තු වියදම ඉක්මවා ගෙවීම කර නොතිබුනු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදි ස්ථානීය අවශ්‍යතාවය මත වැඩ අයිතමන් ක්‍රියාත්මක කර ඇත.

ඉ අල්ගොඩ ප්‍රජාශාලාව අලුත්වැඩියා කිරිම

මෙම ගොඩනැගිල්ල වසර 30 ක් පැරණි ගොඩනැගිල්ලකි. පැරණි උළු වහලය දිරා ගොස් කඩා වැටි තිබු නිසා සමෘද්ධි අධිකාරියේ ප්‍රතිපාදන මත ඇස්බැස්ටඕ තහඩු යොදා වහලය සැකසීම සිදුකර ඇත. සියළු රැස්වීම් පැවැත්වීම, සමෘද්ධි නිලධාරි කාර්යාලය පවත්වා ගෙනයාම සඳහා මෙම ගොඩනැගිල්ල භාවිතා කර ඇත. වහලය මත ගසක් කඩා වැටීම නිසා සමෘද්ධි බලකා අරමුදලින් මුදල් ලබා ගෙන වහලය හා අනෙකුත් ප්‍රතිසංස්කරණයන් සිදුකිරිමට කටයුතු කර ඇත.

තිඹිරිපොල මල්වර්ෂාව ජල ව්‍යාපෘතිය -

මෙම ව්‍යාපෘතිය අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක කර ඇත. ඉන් පළමු අදියර පමණක් විගණනයට ලක්වී ඇත.

පළමු අදියර යටතේ සමෘද්ධි අධිකාරියේ ප්‍රතිපාදන මත කොන්ක්‍රීට් වළලු දමා ළිඳ සැකසීම, වතුර මෝටරය මිළදී ගැනීම හා එය සවිකිරීමට කුටියක් ඉදිකිරීම හා කාණු කපා බට අඩි 143 එළීම සිදුකර ඇත.

දෙවන අදියර යටතේ පළාත් සභා ප්‍රතිපාදන මත වතුර ටැංකිය සවි කිරීමට ආධාරකයක් ඉදිකිරීම සහ ළිඳේ ටැංකිය සවි කරන ස්ථානයට බට එළීම සිදුකර ඇත.

ප්‍රතිලාභීන් 52 ක් ප්‍රයෝජනය ලබාගැනීමට අපේක්ෂා කරන මෙම ව්‍යාපෘතියේ ප්ලාස්ටික් ජල ටැංකිය මිලදී ගෙන සවිකිරීම, විදුලිබලය ලබාගැනීම හා තවදුරටත් බට එළීම සඳහා iii අදියර යටතේ සමෘද්ධි අධිකාරිය මඟින් මේ වනවිට රු. 226,030/- ක ප්‍රතිපාදන ලබාදී ඇති අතර මෙම වර්ෂය තුල සියළු වැඩ නිමකර ව්‍යාපෘතිය ජනතා අයිතියට පැවරීමට කටයුතු යොදා ඇත.

කිරිඇල්ල දෙහෙරගොඩ අළුත්පාර පානීය ළිඳ ඉදිකිරීම

ඇස්තමේන්තුව අනුව අඩි 25 ප්‍රමානයට හැරීමට ඇතිමුත් කබොක් මතුවීම නිසා මත අඩි 6 – 7 ප්‍රමානය හැරීම සිදුකර ඇති අතර එම ප්‍රමාණයට අනුව ගෙවීම් කර ඇත.එසේම නියමිත ප්‍රමිතියට සිදුකර ඇති බව කාර්මික නිළධාරී වාර්තා කර ඇත.

විගනන අවස්ථාව වනවිට ළිඳ අපිරිසිදු තත්ත්වයේ පැවතුනද මේ වන විට ළිඳ පිරිසිදුකර ජලය ප්‍රයෝජනයට ගනී.

මෙම ව්‍යාපෘතිය නිරීක්ෂණය සඳහා ස්ථානීය පරීක්ෂාවක් සිදුකරන ලද අතර එහිදී ප්‍රදේශවාසීන් පවසන ලද්දේ ඉදිකර ඇති මෙම කුඩා ළිඳ පවුල් 10 කට පමණ ජලය ලබාගත හැකි ඵලදායි ව්‍යාපෘතියක් බවයි.

4.4 <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>

(අ) මූ.රෙ. 104 අනුව පරීක්ෂණ කමිටුවක් පත්කර තීරණයක් ගන්නා තෙක් භාවිතා කල නොහැකි උපකරණ සම්බන්ධව කටයුතු කල නොහැකි නිසා එතෙක් උපකරණ තොගයේ වටිනාකම නැවත වත්කම් ලෙස ගිණුම්ගතකර ක්ෂය කිරීමට අධ්‍යක්ෂ ජනරාල් තුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇත.

(ආ) සීගිරි වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදන සාමාගම වෙත මෙම මුදල් ගෙවන ලෙස අවස්ථා කීහිපයක දීම ලිඛිතව දන්වා ඇත. එහෙත් මෙතෙක් මෙම මුදල් නොගෙවීම හේතුවෙන් එම සමාගමට එරෙහිව සහ එවකට සිටි නිලධාරීන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනිමට නීතිපති වෙත යොමු කර ඇත.

(ඇ) සළුසල ආයතනය විසින් මෙම මුදල් එහි පවතින බවත්, දැනට මුදල් ආපසු ලබා දීමට එම ආයතනය සතුව ප්‍රතිපාදන නොමැති බවත්, ආයතනය දැඩි මූල්‍ය දුෂ්කරතාවයන්ට පත්ව ඇති බවත්, දන්වා ඇත. එමෙන්ම භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා ඇති බවද, ඒ ලැබුණු විගස මෙම මුදල් ගෙවන බවද ලිඛිතව දන්වා ඇත.

(ඈ) නීති විමර්ශන අංශය ආරම්භ කරන ලද මුල් කාලයේ සිටම මෙම අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් යොදවා ඇත්තේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින්ය. නීති නිලධාරින් විසින් නීති කටයුතු පවත්වාගෙන යන ලද අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ඔවුන්ගේ මෙහෙයුම් හා පරිපාලන කටයුතු කරන ලදී. මෙම අංශයේ විමර්ශන හා විනය කටයුතු වල ඍජු වගකීම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් දරන ලදි.

ඒ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ මෙම නිලධාරියා ද ද්වීතියින පදනමට මෙම අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් රාජකාරියෙහි යොදවන ලදි. ඔහු තම රාජකාරි මැනවින් ඉටු කරමින් එම තනතුරට සුදුසු පුද්ගලයකු බවට කරුණු තහවුරු කර ඇත. කාලයක්ම ප්‍රමාද වෙමින් තිබූ විනය ගැටළු රාශියක්ම ආයතනයට වාසි සහගත

අයුරින් විසඳා ඇති අතර විනය පරීක්ෂණ පන්සියකට ආසන්න ප්‍රමාණයක් අවසාන කර ඇත.

මෙම නිලධාරියාගේ ද්විතීයින කාලය 2010 සැප්තැම්බර් 15 දිනට අවසාන වීමට තිබුණු අතර, එදිනට නිලධාරියා රාජ්‍ය සේවයට නැවත මුදා හැරිය යුතු විය. නමුත් මෙම කාලය තුළ අධිකාරි සේවයේ මාණ්ඩලික නිලධාරීන් ඉතාමත් අඩු මට්ටමක (තිදෙනෙකු පමණ) සිටීමත් මෙම නිලධාරියා ඉටු කරන ලද රාජකාරි පැවරීමට නිලධාරියකු නොමැති වීමත්, ආයතනය දෙපාර්තමේන්තු ගත වීමේ ප්‍රවනතාවය නිසා බාහිර රාජ්‍ය නිලධාරීන් ද්විතියන පදනම මත නොපැමිණීමත් යන කරුණු මත නිලධාරියා ආයතනයෙන් මුදා හැරීම විශාල පරිපාලන ගැටළුවක් විය.

මෙම තත්වය මත මෙම නිලධාරියා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ දස වසර සම්පූර්ණ කර ඇති බැවින් ද, ii/I ශ්‍රේණිය ලැබීමට තිබූ අවස්ථාව අධිකාරි සේවය නිසා ප්‍රමාද වී ඇති බැවින් ද, යන කරුණු සලකා සේවා අවශ්‍යතාව මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.12 දිනැති අංක 199 හා 2010.09.21 දිනැති අංක 208 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් 2010.09.15 දින සිට ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදි.

රාජ්‍ය සේවයේ හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියාට තිබූ වරප්‍රසාද සහිත අවස්ථා අත්හැර මෙම අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා සේවා අවශ්‍යතාව මත බඳවාගත් මෙම නිලධාරියාට අවාසියක් නොවන පරිද්දෙන් ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ SL 1-1 වැටුප් ක්‍රමයේ ලබා තිබූ වැටුප් වර්ධක ප්‍රමාණය එයට සමරූපී අධිකාරියේ වැටුප් ක්‍රමය වන MM-1-1 වැටුප් ක්‍රමය තුලින් ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය දී ඇත. ඒ අනුව නිලධාරියාගේ වැටුප් පිහිටුවා ඇත.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිත්‍ය මාණ්ඩලික නිලධාරින්ගේ පුරප්පාඩු විශාල වශයෙන් පැවති අවස්ථාවක හා ද්විතියින පදනම මත ද නිලධාරින් අධිකාරියේ සේවයට නොපැමිණෙන අවස්ථාවක සේවා අවශ්‍යතාව සලකා බලා මෙම නිලධාරියාට 2010.10.19 දින පැවති විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සම්මුඛ පරීක්ෂණයට ලක් කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂ (මානව සම්පත්) ලෙස වැඩ ආවරණය කිරිමටත් 2011.03.25 දින සිට එම තනතුරේ ස්ථිරව උසස් කිරිමත් කරන ලදි.

නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් ද, අධ්‍යක්ෂවරයකු වශයෙන් ද මෙම අධිකාරියේ තනතුරු කීපයකම රාජකාරි ඉටු කර ඇති හා දැනට ඉටු කරමින් සිටින පළපුරුද්ද සහිත මෙම නිලධාරියා අදාල තනතුරට සුදුසු පුද්ගලයකු බව ප්‍රායෝගිකව පෙන්නුම් කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. තවද මේ අවස්ථාව වන විටත් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව දී ඇති උපදෙස් අනුව අළුතෙන් බඳවා ගැනීම් කළ නොහැකි බැවින් සිටින නිලධාරින්ට උසස්වීම් ලබාදිය යුතුව ඇත.

දැනට මානව සම්පත් අංශයේ රාජකාරි වලට අමතරව විනය අංශයේ රාජකාරි ද කිසිදු පාරිශ්‍රමිකයක් නොලබා නිලධාරියා ඉටු කරනු ලබන බවද කාරුණිකව පෙන්වා දෙමි. ඔබගේ විගණන විමසුමේ 2.2.8.4 ඡේදයෙන් පෙන්වා දී ඇති කරුණු සැලකිල්ලට ගෙන නිලධාරියාට අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කරන ලද පත්වීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ක්‍රියත්මක කර ඇත.

i. අධ්‍යක්ෂ තනතුරට උසස් කරන ලද 2011.03.25 දින (මොහු සුදුසුකම් සපුරන) 2012.01.01 දින ලෙස ප්‍රතිශෝධනය කර ඇත.

ii. 2011.03.25 දින සිට 2012.01.01 දින දක්වා ගෙවන ලද වැඩිපුර වැටුප් හා දීමනා අය කර ගැනිමට කටයුතු කර ඇත.

ඉ. අධිකාරියේ සේවය කළ බව තහවුරු කර ගැනීමෙන් තොරව වැටුප් හා දීමනා ගෙවීම.

(i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල්(පාලන)ගේ අංක MNB/E18/ 3/2/1/VOL II හා 2010.06.08 දිනැති ලිපිය මඟින් කරන ලද ඉල්ලීම මා විසින් 2010.07.14. දිනැති හා ස/අධි/02/පා/10/2-39 දරණ ලිපියෙන් මෙම නිලධාරියා අමත්‍යාංශයේ මාධ්‍ය මෙහෙයවීමේ කටයුතු සඳහා මෙම අධිකාරියේ සේවයෙන් නිදහස් කිරිමට කටයුතු කර ඇත.

ඒ අනුව මෙම නිලධාරියා 2011 වර්ෂයේ සෑම මාසයක් තුළම ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර ඇති අතර, ඊට අනුව මෙම නිලධාරියා අවස්ථායෝජිතව ඉහත රාජකාරි සඳහා නිදහස් කර ඇත.

මෙම නිලධාරියා 2011 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.

GA-9969 දරන වාහනය මාධ්‍ය අංශයේ කටයුතු සඳහා අනුයුක්ත කර ඇත. එම අංශයේ හා අමාත්‍යාංශයේ මාධ්‍ය කටයුතු වලට අදාල රාජකාරි වල යොදවා ඇති බව කාරුණිකව දන්වමි. මෙම වාහනයේ ධාවන සටහන් මඟින් ඒ බව සනාථ වේ.

(ii) බුත්තල ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා මෙම කාලය තුළ අධිකාරියට අයත් රාජකාරි වල නිරත වී ඇති බව ප්‍රාදේශිය ලේකම් දන්වා සිටි.

4.5 කොන්ත්‍රාත් පරිපාලනය අඩුපාඩු

අ මෙම ගොඩනැගිල්ල ඉදි කිරිම සඳහා රු. 823,404/- ක් ගෙවා ඇත. දැනට ගොඩනැගිලලේ පදිංචි වී ඇත. ඉදිකිරිමේදී සිදු වී ඇති අඩුපාඩු හඳුනාගෙන අදාල කොන්ත්‍රාත්කරු ලවා එම අඩුපාඩු නිවැරදි කර ඇත.

ආ මහල් දෙකකින් යුතු මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහලේ වැඩ අවසන් කර දැනට පදිංචි වී ඇත. ඉහළ මහලේ ඉදි කිරිම් සඳහා ලද රු. 1,339,881/-ක මුදලින් කොන්ක්‍රිට් කණු ඉදි කිරිම් කර ඒ මත වහලය ගසා ඇති අතර, ඉතිරි වැඩ සඳහා රු. 1,815,624/- ක ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා ප්‍රතිපාදන 2012 වසරේදී නිදහස් කර ඇත. ඒ අනුව මෙහි වැඩ කටයුතු මෙම වසරේ අවසන් කිරිමට හැකිවනු ලැබේ.

4.6 සේවක මණ්ඩල කළමණාකරනය

(i) ගාමිණී රාජනායක මයා - සමෘද්ධි කළමණාකරු 2011.09.12 නැවත සේවයේ පිහිටුවා ඇත. චෝදනා පත්‍ර නිකුත් කිරිමට කටයුතු කර ඇතත්, ඔහු 2012.11.05 දින මිය ගොස් ඇත.

චතුරිකා දයානි තේනුවර මිය - සමෘද්ධි සංවර්ධන නිලධාරි - 2012.11.05 දින චෝදනා පත්‍ර නිකුත් කිරිමට කටයුතු කර ඇත.

(ii) විගණන වාර්තාවට අදාල කරුණු තහවුරු කිරිමට අවශ්‍ය වන සාක්ෂි ලේඛන ලබා ගැනිම ප්‍රමාද වීම මත මෙම චෝදනා පත්‍ර නිකුත් කිරිම ප්‍රමාද විය. එහෙත් දැනට මෙම චෝදනා පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(iii) මෙම සේවකයා සම්බන්ධයෙන් දැනට අධිකරණයේ ක්‍රියාතමක නඩුව අවසන්වූ පසුව විනය කටයුතු කිරීම සඳහා ගොණුව පසෙක තබා ඇත.

(iv) පරීක්ෂණ කටයුතුවල අවසන් වාර්තා ලද පසු විනය නියෝග නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(v) නිලධාරීන් 5 දෙනාගේ විනය නියෝග නිකුත් කර ඇත.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය.

5.1 සංයුක්ත සැලැස්ම.

2009 වර්ෂයේ සිට 2013 දක්වා කාලයකට අදාළ සංයුක්ත සැලැස්මක් සකස් කර ඇත. එහෙත් ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි 2003.06.02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි විස්තර ඇතුලත් සංයුක්ත සැලැස්මක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව නව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල හා තනතුරු අනුමත වීමෙන් පසු ඒ ඒ තනතුරු වලට අදාළ වගකීම් හඳුනා ගත හැකි වන අයුරින් නැවත සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

5.2 <u>අභ්‍යන්තර විගණනය</u>

අ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු වී ඇත්තේ විධායක තනතුරු 3 ක් සහ කාර්ය මණ්ඩල තනතුරු 38 ක් පමණි. එහෙත් 2011 වර්ෂයේ දී විමර්ශන කළමණාකරුවන් 150 දෙනෙකුගේ සේවය ද, මෙම අංශයට ලබාගැනිමට සැලසුම් කර තිබූ බැවින් අභ්‍යන්තර විගණන සැලැස්ම සැකසීමේ දී එම සංඛ්‍යාව ද ඇතුළුව සම්පූර්ණ සේවක සංඛ්‍යාව 286 ක් ලෙස සලකා ඇත. ඒ අනුව මෙම අංශයේ සත්‍ය සේවක සංඛ්‍යාව 148 ක් වූ අතර, මෙම පුරප්පාඩු සංඛ්‍යාව ඇති වී තිබේ. 2012 වර්ෂයේ දී නව කළමණාකරුවන් බඳවා ගැනිම මඟින් මෙම පුරප්පාඩු පිරවීමට ක්‍රියා කර ඇත.

ආ. 2011 වර්ෂය තුළ නිකුත් කර තිබූ විගණන විමසුම් හා වාර්තා බොහෝමයක් ඊට පෙර වර්ෂවලට අයත් ඒවා බව පිළිගනිමි. විගණන අංශයේ පැවති නිලධාරි පුරප්පාඩුව හා පරිගණක නිලධාරින්ගේ හිඟය හේතුවෙන් මෙය ඇති විය. කෙසේ වෙතත් 2012 වර්ෂය වන විට සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් හි සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අදාල 2006 වසරේ සිට 2011 වර්ෂය දක්වා වූ විගණන විමසුම් හා මූල්‍ය ප්‍රකාශන නිකුත් කර අවසන් බව කාරුණිකව දැනුම් දෙමි. මින් ඉදිරියට විගණන විමසුම් නිකුත් කිරිම යාවත්කාලින කිරිමට කටයුතු යොදා ඇත.

6. මෙම ඡේදය යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියාමාර්ග ගැනිම සඳහා අදාල නිලධාරින් දැණුවත් කර ඇත.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
04 වන මහල,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

විද්‍යුත් තැපැල : **Samuaut@Samurdhi.gov.lk**

ෆැක්ස් අංකය : **011 - 2889046**

දුරකථනය : **011- 2872202**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.